
Erle Stanley Gardner
The Case of the
Horrifield Heirs
A Perry Mason Mystery
බිහිසුණු
උරුමයක
අබිරහස
පරිවර්තනය
පූජිත කරුණාරත්න

# තොමීගෙ පොත් ගුල තිලිණයකි



## 1

මිනීමැරුම් අහේතුකව සිදු නොවේ. ඒවා බල ලෝභයේ, ධන තෘෂ්ණාවේ, වෛරයේ, පළිගැනීමේ හෝ බියපත්කමෙහි ප්‍රතිඵලයි. ජල තලයක් මත පතිතවන ගල් කැටයක් මුළු ජලාශයටම බලපෑම් කරන්නාක් සේ ඕනෑම මිනීමැරුමක් තවත් බොහෝ ජීවිත ගණනකට වෙනස්කම් ඇති කරවන්නේය.

පිලිප්ස් අනුස්මරණ රෝහලේ සැපපහසු කාමරයක ජනේලයක් තුලින් උදෑසන හිරු එළිය ගලා එමින් තිබුණි.

රාත්‍රිය පුරා අතරින් පතර ඇසුනු වාහන ශබ්ද දෙගුණ තෙගුණ වෙමින් තිබුණු අතර කොරිඩෝ වලින් ඇසුනු හෙදියන්ගේ අඩි ශබ්දයන්හි රිද්මය වැඩි වූයේ ඉටුකිරීමට නියමිත වැඩ කන්දරාවේ විශාලත්වය විදහා පාමිනි.

රෝගීන්ව සේදීමට, උෂ්ණත්වය මැනීමට, ලේ සාම්පල ගැනීමට භාජනය කෙරෙන ලදී. උදේ ආහාර බඳුන් ගෙන එනු ලැබුනේ, කොරිඩෝ පුරා වූ විෂබීජනාශක දුගඳ තාවකාලිකව කෝපි සහ ඕට් කිරි සුවඳින් පුරවමිනි.

ශෛල්‍යකර්ම සඳහා භාජනය වීමට රෝගීන් වෙත ගිය හෙදියන් විසින් මූලික ප්‍රතිකාර ලබා දෙන ලදී.

ඇඳෙහි ඉඳගත් ලොරේටා ට්‍රෙන්ට් හෙදිය වෙත දුබල මඳහසක් පෑවාය.

"මට දූන් ටිකක් හොඳයි වගේ," ඇය දුර්වල හඬකින් තෙපලාය.

"ඔපරේෂන් වලින් පස්සෙ ඩොක්ටර් ඔයාව බලන්ඩ එනවා කියලා කිව්වා." හෙදිය විශ්වාසය ඇතිකරවන ස්වරයකින් කීවාය.

"මට ගෙදර යන්ඩ පුළුවන් කිව්වද?" රෝගියා උනන්දුවෙන් ඇසුවාය.

"ඒක ඩොක්ටර්ගෙන්ම තමයි දූනගන්ඩ වෙන්නෙ," හෙදිය කීවාය. "ඒත් ඔයාගෙ කෑම ගැන ප්‍රවේසම් වෙන්ඩ වේවි. මේ සැරේ හොඳ බේරිල්ලක් ඔයා බේරුණේ."

ලොරේටා සුසුමක් පිට කළාය. 'මම දන්නෙ නෑ ඇයි මෙහෙම වෙන්නෙ කියලා. මම පුළුවන් තරම් පරිස්සම් උනා. මගෙ හිතේ මට මොකක් හරි අසාත්මිකතාවයක් ගොඩනැගීගෙන එනවා ඇති."

# 2

යල් පැන ගිය අතීතයක ශ්‍රී විභූතිය සිහිකරවන භූමියක පිහිටා තිබූ ට්‍රෙන්ට් පවුලේ නිවහනේ උත් ගෘහ පාලිකාව ප්‍රධාන නිදන කාමරයේ අවසන් අස්පස් කිරීම් කටයුතුවල නියැලී සිටියාය.

''අද මිසිස් ට්‍රෙන්ට් ගෙදර එනවලු,'' ඇය සේවිකාවට කීවාය. ''ඩොක්ටර් කියලා තියෙනවා, නෝනාගෙ නර්ස්, ඇනා ෆ්‍රිච්ට මෙහාට එන්ඩ කියලා. එයා දැන් ටිකකට කලින් ආවා. මං හිතන්නෙ මේ වතාවෙ එයා සති දෙකක් විතර නතර වේවි.''

සේවිකාවගේ ස්වරයේ වූයේ නොපහන් බවකි. ''අපොයි මගෙ වාසනාවක හැටි. මම අද හවස කලින් යන්ඩයි හිටියෙ. මදෑ කොලා,''

මෙම අවස්ථාවේදීම කිසියම් දෑතක් නාන කාමරයේ සේදුම් බේසම අසල කාර්යබහුලව ක්‍රියාත්මක වන්නට විය.

කුප්පියකින් හලා ගත් සුදු පැහැති කුඩක් සේදුම් බේසමට වැටෙන්නට විය.

එක් අතකින් ජල කරාමය කරකැවුනු අතර සුදු පැහැති කුඩ කානුව වෙත ගලා ගියේය.

තව දුරටත් මේ කුඩු වර්ගයෙන් ප්‍රයෝජනයක් නොවනු ඇත. එය තුළින් අපේක්ෂා කළ අරමුණ ඉටුවී ඇත්තේය.

විශාල නිවසේ පැවතියේ පීඩාකාරී තත්ත්වයක් බලාපොරොත්තුවීමේ වාතාවරණයකි. බෝරින් බ්‍රිග්ස්, ලොරේටාගේ මස්සිනා, ඩයනා හෙවත් ඔහුගේ බිරිඳ, ගෝඩන් කෙල්වින් නම් අනෙත් මස්සිනා, මැක්සින් හෙවත් ඔහුගේ බිරිඳ, ගෘහ පාලිකාව, නිවාස සේවිකාව, හෙදිය, කෝකියා සහ ජෝජ් ඊගන් නම් රියදුරුගෙන් පිරිස සමන්විත වූ අතර ලොරේටාගේ පැමිණීම ඒ සෑම කෙනෙකුටම ගෙන ඒමට නියමිතව තිබුණේ විවිධාකාර බලපෑම්ය.

මේ වන විට උදෑසන ශෛල්‍යකර්ම අවසන්ව තිබූ හෙයින් වෛද්‍යවරු සියලුදෙනා සාමාන්‍ය ඇඳුමට මාරු වී සිටි අතර ඒ තුළින් පිලිප්ස් අනුස්මරණ රෝහලේ පරිසරය වඩාත් සාමකාමී බවක් ඉසිලුවේය.

ශෛල්‍යකර්මයන්ට භාජනය වූ රෝගීන් ප්‍රතිසාධන වාට්ටුවට ඇතුල් කර තිබුණු අතර වඩාත් සංකීර්ණ නොවූ සැත්කම්වලට ලක්වූවන් ඉක්මනින් සිහිය ලබන්නට විය. දෑස් විවර කොට නැවත වසා ගැනීම්, කෙඳිරිගෑම් සහ සුසුම් හඬවල් ටිකෙන් ටික මතු වන්නට පටන් ගත්තේය.

වයස පනස් අටක් වුවද සිහින් සිරුරකින් හෙබි, මධ්‍යම උස ප්‍රමාණයේ පුද්ගලයෙකු වූ ෆෙරිස් ඇල්ටන් වෛද්‍යවරයා ලොරෙටා ට්‍රෙන්ට්ගේ කාමරයට පැමිණියේය.

ඔහු දුටු ලොරේටාගේ මුහුණ පැහැපත් විය.

උරහිසට උඩින් බැලූ හෙදිය වෛද්‍යවරයා දුටු අතර තමා අවධානයෙන් සිටිය යුතු ස්ථානය වන ඇඳ පාමුලට වහා ගමන් කළාය.

ඇල්ටන් වෛද්‍යවරයා තම රෝගියා දෙස බලා මදහසක් පෑවේය. "ඔයාට අද හොඳයි."

"ගොඩාක් හොඳයි." ඇය කීවාය. "මට අද ගෙදර යන්ඩ පුළුවන්ද?"

"ඔයාට ගෙදර යන්ඩ පුළුවන්," වෛද්‍ය ඇල්ටන් කීවේය. "හැබැයි ඔයා ආයෙමත් ඔයාගෙ පරණ නර්ස්, ඈනා ෆ්ලිච්ච ගෙන්න ගන්ඩ ඕනෙ. මම එයාට දැනුම් දීලා තියෙන්නෙ. එයාව ඔයාගෙ නිදන කාමරේට අල්ලපු කාමරේ නවත්තගන්ඩ. නාමික වශයෙන් එයා පැය

විසිහතරම සේවයේ යෙදෙන්ඩ ඕනෙ. ගියපාර ඔයාට අමාරු වුණ වෙලාවෙ අපි එයාව ගෙන්නගත්තානෙ. අපි එයාට යන්ඩ ඇරියෙ අපරාදෙ. මට ඕනෙ ඔයාගෙ හදවතේ තත්ත්වය ගැන එයා ලවා නිතර පරීක්ෂාවෙන් ඉන්ඩ.''

ට්‍රෙන්ට් මහත්මිය හිස ඉහල පහල වැනුවාය.

''දැන් එතකොට,'' වෛද්‍යවරයා කියාගෙන ගියේය. ''මම අවංකව කතා කරන්ඩයි යන්නෙ, ලොරේටා. මේක මාස අටක් ඇතුළත ඔයාට හැදුන තුන්වෙනි ආහාර විෂවීම. ඒවා අමාරු ලෙඩ තමයි. ඒත් මට බය ඔයාගෙ හදවත ගැන. ලොකු ශාරීරික පීඩනයක් දරන්ඩ ඔයාගෙ හදවතට අමාරු වෙන්ඩ පුළුවන්. ඒ නිසා කෑමෙන් ප්‍රවේසම් වෙන්ඩ.

''මම දන්නවා,'' ඇය කීවාය. ''ඒත් සමහර වෙලාවට මිරිස් දාපු කෑම වර්ග හරිම රසයි කියලා හිතෙනවා.''

දෙබැම ලංකරගත් වෛද්‍යවරයා ඈ දෙස බලා කෙටි අධ්‍යයනයක යෙදුනේය. ''අපි ඔයා තව ටිකක් සනීප උනහම අසාත්මිකතාවන් තියෙනවාද කියලා ටෙස්ට් කරලා බලමු. ඒ අතර වාරයේ ඔයාට තියෙන්නෙ ප්‍රවේසම් වීම තමයි. ඊළඟට අමාරුවක් වුණොත් ඔයාගෙ හදවතට දරාගන්ඩ බැරිවෙන්ඩ ඉඩ තියෙනවා කියන අවවාදෙ මම ඔයාට දෙනවා. ඒක මතක තියාගන්ඩ.''

# 3

දෙඅත සහ සුදු පැහැ කුඩ ස්වකීය කාර්යය සමාප්ත කොට තිබිණි. මූලික සැලසුම් සියල්ල සම්පූර්ණ වී ඇත.

ලොරේටා ට්‍රෙන්ට්ගේ ජීවිතය රඟා පැවතියේ ඈ විසින් එක්වරක් පමණක් දක්නට යෙදුනු තරුණියක් අතය. වර්ජිනියා බැක්ස්ටර් නම් වූ ඇය ලොරේටා ට්‍රෙන්ට් නම් මැදිවියේ ගැහැනියක මෙලොව ජීවත් වන බවට පවා වගක් නොවීය. දෛනික කාර්යාලීය ක්‍රියාකාරකමක ප්‍රතිඵලයක් ලෙස වර්ජිනියා බැක්ස්ටර් ඈ දැක තිබුණු අතර මේ වන විට වසර දහයක් පමණ ගතවී ඇති හෙයින් ඈ තුළ ඒ ගැන මතකයක් නොවීය.

ලොරේටා ට්‍රෙන්ට්ට නම්, අවශ්‍යතාවක් ඇතිවුවහොත් එම අවස්ථාව මතකයට නගා ගැනීමේ හැකියාව තිබුණද, දිනපතා අභියෝගයන්ට මුහුණදීමේදී විශේෂයෙන් එම අවස්ථාව සිහියේ නිරන්තරව තබාගැනීමේ අවශ්‍යතාවක් නොතිබිණි.

මේ වන විට වර්ජිනියා ගමන්කරමින් සිටියේ ගුවන්යානා සේවිකාව පසුකොට යන මිනිස් ගංගාව සමගය.

'ගුඩ් බායි,'

'ගුඩ් බායි, සර්,'

'නයිස් ට්‍රිප්,'

'තැන්ක්‍යූ මැඩම්,'

මගීන්ගේ සියලු වචනයන්ට ඇය සුදුසු පිළිතුරු සපයමින් සිටියාය.

අඟලින් අඟල මගීන් ජෙට් යානයෙන් බැසගත් අතර ගුවන්තොටුපොලේ පුළුල් කොරිඩෝ වෙත අවතීර්ණ වූ විට ඔවුන්ගේ පියවර තැබීමේ වේගය වැඩි විය. 'ගමන්මළු' යනුවෙන් විශාල පුවරුවක් ඊතලයක් සමග ප්‍රදර්ශනය කෙරුණු අතර ඒ අසලින් වූයේ පහතට දිවෙන විදුලි තරප්පු පෙළකි.

වර්ජිනියා සිය දකුණු අත විදුලි තරප්පු පෙළෙහි අත්වැටට තැබීමට පෙර තමා දෙස හොඳින් බැලුවාය.

ඇය වැලමිටට පහලින් පිටකබායක් දමාගෙන සිටි අතර ඇයට තද විඩාවක් දැනෙමින් තිබුණි.

වයස අවුරුදු තිස්පහ පසුකොට සිටි ඇය සතුව සතුටුදායක රූ සපුවක් තිබුණු අතර ඇඳුම් ආයිත්තම් ගැලපෙන ලෙසට තෝරා ගැනීමට ඇය පුරුදුව සිටියාය. නමුත් ඇය වසර ගණනක් ජීවත්වීමේ අරගලය උදෙසා වැටුපට සේවය කිරීමේ යෙදී සිටින තැනැත්තියකි. ඇගේ දෑස් වටා පෙනෙන නොපෙනන අන්දමින් සිහින් කව මතු වෙමින් තිබුණු අතර සිනහසෙද්දී ඇගේ මුහුණ කලළුළි වූ නමුත් නාසය දෙපස ඉරි දෙකක් මතු වෙන්නට ද පටන්ගෙන තිබිණි.

පහත මාලයට පැමිණි පසු විදුලි තරප්පු පෙළින් බැසගත් ඇය ගමන් මළු ළඟාවීමට නියමිත ශාලාව වෙත කැරකෙන දොරින් ඇතුලු වූවාය.

ඇගේ ගමන් මලු පැමිණීම සඳහා තව මද වේලාවක් යනු ඇත. නමුත් වර්ජිනියාගේ චරිත ස්වභාවය වූයේ, තමා යා යුතු තැනට ඉක්මනින් යාමත් දිගු විනාඩි කිහිපයක් බලා සිටීමට සිදු වුවද එය කණස්සළුවීමට තරම් දෙයක් නොවන බව සිතීමත්ය.

විදුලි බලයෙන් ගමන් කරන පුළුල් පටියක් මතින් ගමන් මලු පැමිණෙන්නට විය. මගීන් එකා දෙන්නා තම තමන්ගේ ගමන්මලු අතට ගන්නා බව පෙනුනි. රිසිට් පත් අතින් ගත් පෝටර්වරු ද පැමිණ විශාල ගමන් මලු ට්‍රොලි මත තබාගත්හ.

අවසානයේ ගමන් මලු පටිය අසල පොදි කමින් සිටි ජනයා තුනී විය. පෝටර්වරු පිටත්ව ගියහ. ගමන් මලු කිහිපයක් තවදුරටත්

පටිය මත ඉතිරිව තිබුණද වර්ජිනියාගේ ගමන් මලු දෙකින් එකක් හෝ පෙනෙන්නට නොවීය.

ඇය අසලක සිටි පෝටර්වරයෙකු වෙත ගියාය. "මගෙ බෑග ්ස් ඇවිල්ලා නෑ වගේ." ඇය කීවාය.

"මොනවාද බැගේජ්, මැඩම් ?" ඔහු ඇසුවේය.

"දුඹුරුපාට තනි සූට් කේස් එකයි, පොඩි හතරැස් බෑග් එකයි."

"මට බැගේජ් රිසිට් එක දෙනවාද?"

ඇය ඔහුට ගමන් මලු ලදු පත ඉදිරිපත් කළාය.

ඔහු ලදු පත දෙස බලමින් කතා කළේය. "මම හොයලා බලන්ඩ කලින් අපි පොඩ්ඩක් ඉඳිමු තව කාගෝ ලෝඩ් එකක් ඒවිද කියලා. සමහර වෙලාවට බඩු වැඩි උනොත් වෙන තවත් ට්‍රක් එකක් ජ්ලේන් එකට ගිහින් ඉතිරි බඩු පටවගෙන එනවා. එතකොට කොටස් දෙකකට තමයි බැගේජ් එන්නෙ බෙල්ට් එක දිගේ."

වර්ජිනියා නොඉවසිල්ලෙන් බලා සිටියාය.

විනාඩි දෙකකට හෝ තුනකට පසු විද්‍යුත් පටිය දිගේ තවත් ගමන් මලු පැමිණෙන්නට විය. වර්ජිනියාගේ ගමන් මලුද ඒ අතර විය.

"අන්න එනවා. අර දෙක මගේ." ඇය කීවාය. "අර ඉස්සරහම තියෙන ලොකු දුඹුරු සූට් කේස් එකයි, පොඩි හතරැස් බෑග් එකයි."

"හරි, මැඩම්, මම ඒවා ගෙනල්ලා දෙන්නං."

විද්‍යුත් පටිය වෙත ගිය පෝටර්වරයා වර්ජිනියාගේ ගමන් මලු දෙකම ගෙන, ඒවායේ ලේබල ලදු පත සමග සසඳා බලා, ට්‍රොලියක තබාගෙන දොර වෙත යාමට සූදානම් විය.

කොහෙන් මතු වූවාදැයි කීමට කිසිවෙකු නොදන්නා මිනිසෙක් පෝටර්වරයා වෙත පැමිණියේය. "පොඩ්ඩක් ඔහොම ඉන්ඩ." යයි පෝටර්වරයාට කීවේය.

පෝටර්වරයා ඔහු දෙස බැලුවේය. සාක්කුවෙන් රන්වන් පැහැති තරුවක ලකුණක් සහිත ලාංඡනයක් අතට ගත් ආගන්තුක මිනිසා එය පෝටර්වරයාට පෙන්වා සිටියේය. "පොලිස්." ඔහු කීවේය. "මේ බැගේජ්වල මොනවා හරි ප්‍රශ්නයක් ද?"

"කිසි ප්‍රශ්නයක් නෑ." පෝටර්වරයා ඉක්මනින් කීවේය. "මේවා පළවෙනි ලෝඩ් එකේ ආපු නැති එක විතරයි."

"බැගේජ්වල ප්‍රශ්නයක් තිබිලා තියෙනවා," වර්ජිනියා බැක්ස්ටර් දෙසට හැරුනු මිනිසා කීවේය. "මේක තමුන්ගෙ සූට් කේස් එක ද?"

"ඔව්."

"හොඳටම විශ්වාසද?"

'ඔව්. මේක මගේ සූට් කේස් එක, අනිත් පොඩි බෑග් එකේ තමයි සෙන්ට් කුප්පි, ලිප්ස්ටික් වගේ ඒවා දාගෙන යන්නෙ. මම රිසිට් එක මේ පෝටර්ට දුන්නා."

"සූට් කේස් එකේ තියෙන්නෙ මොනවාද කියලා විස්තර කරන්ඩ තමුන්ට පුළුවන්ද?"

"ඔව්, මට පුළුවන්."

"කරුණාකරලා, එහෙමනං විස්තර කරන්ඩ."

"උඩින්ම ඇති ලොකු කබායක්, ලෝම කොලර් එකකුත් එක්ක. ඊලඟට ඇති කොටු කොටු සායක්-"

"ඒ විස්තරේ ඇති අපිට අඳුනාගැනීමක් කරන්ඩ." මිනිසා කීවේය. "කරුණාකරලා සූට් කේස් එක අරින්ඩ පුළුවන්ද, අපිට ඇතුලෙ තියෙන දේවල් බලාගන්ඩ පුළුවන් වෙන විදිහට?"

වර්ජිනියා මදක් දෙගිඩියාවට පත්වූවාය. "කමක් නෑ, මම අරින්නං." ඇය අවසානයේ කීවාය.

"ඒක ලොක් කරලාද තියෙන්නෙ?"

"නෑ, මම නිකං වහලා තියෙන්නෙ."

මිනිසා සූට් කේසයේ ගාංචු දෙක පැන්නුවේය.

පෝටර්වරයා ට්‍රොලිය තරමක් පහත් කලේ සූට් කේසය හොඳින් දර්ශනය වෙන ලෙසටය.

වර්ජිනියා පියන විවෘත කළ අතර ඇතුලත වූ දෙය දැකීමෙන් තක්කු මුක්කු වූවාය.

ඇගේ පිට කබාය ඈ නමා තිබූ අයුරින්ම සූට් කේසය තුළ වූ නමුත් ඊට උඩින් තිබුණේ. විනිවිද පෙනෙන ප්ලාස්ටික් පෙට්ටි කිහිපයකි. ඒ පෙට්ටි තුළ කුඩා ප්‍රමාණයේ පාර්සල් අසුරා තිබිණි.

"තමුන් මට මේ බවක් කීවෙ නැතෙ ?" මිනිසා කීවේය.

"මොනවාද මේවා?"

"මම... මං දන්නෙ නෑ. මගෙ ජීවිතේට මේ දූන් තමයි මේවා ඇහැට දක්කෙ."

කිසියම් රහස් සංඥාවකට අනුගතවීමක් අනුව මෙන් කුලුනක් පිටුපස සැඟැවී උන් අයෙක් කැමරාවක් ද රැගෙන වහා ඉදිරියට ආවේය.

ඇති වූ විශ්මයෙන් මිදීම සඳහා වර්ජිනියා උත්සාහ කරන අතරම කැමරාකරු ඇගේ මුහුණටම එල්ලකොට ගත් ඡායාරූපය සහ කැමරාවේ විදුලි ආලෝකයෙන් ඇගේ දෑස නිලංකාර විය.

පළපුරුදු අතක් ඇති බව පෙන්නුම් කළ කැමරාකරු නැවතත් කැමරාව සකස් කොට විවෘතව තිබුනු සූට් කේසයේ ඡායාරූපයක් ද ගත්තේය.

පෝටර් තැන වහා ඉවතට පැනගත්තේ, ඡායාරූපයට තමා හසු නොවෙන පරිදිය.

පොලිස් නිලධාරියා කතා කලේය. "බොහොම කණගාටුයි මැඩම්, තමුන්ට අපිත් එක්ක එන්ඩ වෙනවා."

"මොකද්ද ඒකෙ තේරුම?"

"මම පැහැදිලි කරන්නං." ඔහු කීවේය. "තමුන්ගෙ නම වර්ජිනියා බැක්ස්ටර් නේද?"

"ඔව්, ඇයි?"

"අපිට තමුන් ගැන ඔත්තුවක් ලැබුණා." ඔහු කීවේය. "තමුන් මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කරන බවට."

කැමරාකරු තවත් ඡායාරූපයක් ගත් අතර ඉන් පසු පිටව ගියේය.

''මම එන්නං, ඒකෙ ප්‍රශ්නයක් නෑ,'' වර්ජිනියා කීවාය. ''තමුන්නැහැ මේ ප්‍රශ්නෙ මට නිරාකරණය කරලා දෙන්ඩ. මොකද, මම දන්නෙ නෑ මේ කෙහෙම්මල් කොහොමද මගේ බෑග් එකට ආවෙ කියලා.''

''ඒකත් එහෙමද?'' පොලිස් නිලධාරියා බැරෑරුම් ලෙස ඇසුවේය. ''මට තමුන්ව අපේ මූලස්ථානෙට එක්ක යන්ඩ වෙනවා. ඊටපස්සෙ මේ තියෙන ද්‍රව්‍ය පරීක්ෂා කරලා, හරියටම මොනවාද කියලා විශ්ලේශනය කරන්ඩ වෙනවා.''

''එතකොට ඒවා, මත් ද්‍රව්‍ය කියලා ඔප්පු උනොත්?''

''එතකොට අපිට සිද්ද වෙනවා, තමුන්ව අත්අඩංගුවට ගන්ඩ.''

''හරි පිස්සු වැඩක්නෙ.''

''බෑග් ටික මේ පැත්තෙන් අරං එන්ඩ.'' සූට් කේසයේ පියන වසා දමමින් පොලිස් නිලධාරියා පෝටර්වරයාට කීවේය.

ඔහු කුඩා ගමන් මල්ල ද විවෘත කළ අතර එහි වූ මුහුනේ ගල්වන ක්‍රීම් බඳුන, නියපොතු උල්කරන උපකරණ කට්ටලය, රාත්‍රී නිදන ඇඳුමක් සහ සිරුරේ ගානු ලබන නොයෙකුත් වර්ගයේ ආලේපන කුප්පි කිහිපයක්ද පරීක්ෂා කළේය.

''හරි,'' ඔහු කීවේය. ''මේ බෑග් එකේ ප්‍රශ්නයක් නැති හැඩයි. ඒත් මේ බෝතල්වල තියෙන්නෙ මොනවාද කියලා පරීක්ෂා කරන්ඩ වෙනවා. ඒ නිසා බෑග් දෙකම ගේන්ඩ.''

පොලිස් නිලධාරියා වර්ජිනියා කැටුව කළු පැහැති මෝටර් රියක් වෙත ගිය අතර පෝටර්වරයෙකු ලවා ඇගේ ගමන් මලු දෙක පිටුපස ආසනයේ තබන ලදී.

''අපි යන්නෙ මූලස්ථානෙටද?' වර්ජිනියා ඇසුවාය.

''ඔව්.'' පොලිස් නිලධාරියා කෙටියෙන් පිළිතුරු දුන්නේය.

මෝටර් රිය ඉදිරිපස රේඩියෝ පණිවිඩ උපකරණයක් ඇති බව වර්ජිනියා දුටුවේ එවිටය. පොලිස් නිලධාරියා එහි මයික්‍රෆෝනය අතට ගත්තේය. ''විශේෂ නිලධාරී ජැක් ඇනඩෘස් ගුවන් තොටුපලින් පිටත් වෙනවා, කාන්තා සැකකාරියක් සමඟ. ඈ සතුව ඇති ගමන්

මලු දෙකක් ගෙන එනවා, සැක කටයුතු ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සඳහා, වේලාව පෙරවරු 10.17යි.''

මයික්‍රෆෝනය කොක්ක එල්ලූ පොලිස් නිලධාරියා තමාට බොහෝ හුරුපුරුදු රියක් පදවන ආකාරයක් පෙන්නුම් කරමින් මෝටර් රිය මාර්ගයට අවතීර්ණ කොට පොලිස් මූලස්ථානය කරා පදවන්නට විය.

පොලිස් මූලස්ථානයේදී වර්ජිනියාව පොලිස් කාන්තාවක භාරයේ තැබුණු අතර විනාඩි පහළොවක පමණ කාලයකදී කිසියම් නිලධාරියෙකු පැමිණ පොලිස් කාන්තාව අතට තුන්ඩුවක් දෙන ලදී.

''මේ පැත්තෙන් එන්ඩ.'' පොලිස් නිලධාරිනිය වර්ජිනියාට කීවාය.

වර්ජිනියා ඇ පසුපස ගියේ ලියන මේසයක් වෙතය.

''ඔයාගෙ දකුණු අත දෙන්ඩ.'' පොලිස් කාන්තාව කීවාය.

සිදුවන්නේ කුමක්දැයි වර්ජිනියා වටහාගැනීමටද පෙරාතුව පොලිස් කාන්තාව විසින් වර්ජිනියාගේ දකුණු අත අල්වාගෙන, මහපට ඇඟිල්ල තීන්ත පෑඩයක් මත තබා, ඉන් අනතුරුව එම ඇඟිල්ලම කඩදාසියක් මත තබා ඇඟිලි සලකුණු ලබා ගන්නා ලදී.

''කෝ, අනිත් ඇඟිල්ල දෙන්ඩ,'' පොලිස් කාන්තාව කීවාය.

''මේ මොකද දෙයියනේ, මගෙ ඇඟිලි සලකුණු ගන්නෙ?'' පිටුපසට අඩියක් තබමින් වර්ජිනියා විරෝධය පෑවාය. ''මම මොනවා කළාටද?''

ඇඟිල්ල අල්ලා ගෙන තිබූ ග්‍රහනය තද විය. ''විහින් අමාරුවෙ වැටෙන්ඩ හදන්ඩ එපා,'' පොලිස් කාන්තාව කීවාය. ''දබර ඇඟිල්ල දික්කරන්ඩ.''

''දෙයියෝ සාක්කි, මං මොනවා කළාටද?'' වර්ජිනියා ඇසුවාය. ''මම ප්‍රතික්ෂේප කරනවා-''

''තමුන්ට එක ටෙලිෆෝන් කෝල් එකක් ගන්ඩ අයිතිවාසිකම තියෙනවා.'' පොලිස් කාන්තාව දැනුම් දුන්නාය. ''තමුන් කැමති නම් නීතිඥයෙකුට කතා කරන්ඩ පුළුවන්.''

එම වදන් වර්ජිනියා වෙත නැවුම් පණක් ගෙන ආවේය.

"ටෙලිෆෝන් ඩිරෙක්ටරිය කොහෙද තියෙන්නෙ?" ඇය ඇසුවාය. "මට ඕනෙ පෙරී මේසන්ගෙ ඔෆිස් නම්බර් එක."

විනාඩි කිහිපයකට පසු වර්ජිනියා සම්බන්ධ වූයේ පෙරී මේසන් නීතිවේදියාගේ ලේකම්වරිය වන ඩෙලා ස්ට්‍රීට් සමගය.

"මට මිස්ට පෙරී මේසන්ට කතා කරන්ඩ පුළුවන්ද?"

"කාරණාව මොකද්ද කියලා මට කියන්ඩ වෙනවා." ඩෙලා ස්ට්‍රීට් කීවාය. "සමහරවිට මට උදව්කරන්ඩ පුළුවන් වේවි."

"මගෙ නම වර්ජිනියා බැක්ස්ටර්." ඇය කීවාය. 'මම නීතිඥ ඩෙලානෝ බැනොක්ගෙ ඔෆිස් එකේ වැඩ කරලා තියෙනවා, එතුමා මීට අවුරුදු දෙකකට විතර කලින් අන්තරා වෙකම්ම. මිස්ට මේසන් කීප වතාවක් ඒ ඔෆිස් එකට ඇවිල්ලා තියෙනවා. සමහර විට මිස්ට මේසන්ට මාව මතක ඇති. මම තමයි මිස්ට ඩෙලානෝ බැනොක්ගෙ සෙකට්‍රි වෙලා හිටියෙ."

"ආ, එහෙමද?" ඩෙලා කීවාය. "දැන් ඇතිවෙලා තියෙන ප්‍රශ්නෙ මොකද්ද, මිස් බැක්ස්ටර්?"

"මගෙ ළඟ මත්ද්‍රව්‍ය තිබ්බා කියලා මාව පොලිසියෙන් අල්ලගෙන ඉන්නවා." වර්ජිනියා කීවාය. 'මම දන්නෙ නෑ ඒවා මගෙ බෑග් එකට කොහොම ආවා ද කියලා. මට ඉක්මනටම මිස්ට පෙරී මේසන්ව ඕනෙ."

"විනාඩියක් ඉන්ඩ." ඩෙලා කීවාය.

මොහොතකට පසු දුරකතනය ඔස්සේ පෙරී මේසන්ගේ ගැඹුරු, එහෙත් හොඳින් හැසිරවීමට හුරුවූ හඬ පැමිණියේය. "දැන් ඔයා කොහෙද ඉන්නෙ, මිස් බැක්ස්ටර්?"

"පොලිස් මූලස්ථානෙ."

"ඒගොල්ලන්ට කියන්ඩ ඔයාව ඔතනම තියාගන්ඩ කියලා, ඒ අය එහෙම කරන්ඩ කැමති නම්." මේසන් කීවේය. "මම දැම්ම එනවා."

"අනේ, ලොකු දෙයක්. මම දන්නෙ නෑ ඒවා....කොහොම...මගෙ..."

"ටෙලිෆෝන් එකෙන් කිසි දෙයක් පැහැදිලි කරන්ඩ ලැස්ති වෙන්ඩ එපා." මේසන් කීවේය. "කිසිම කෙනෙකුට කිසිම දෙයක් කියන්ඩ එපා, ඔයාගෙ නීතිඥයා මග එනවා කියලා ඇරුනහම. ඇපයක් නියම කළොත් ඔයාට ඒක තියන්ඩ පුළුවන්ද?"

"මට...ඔව්, ලොකු ගාණක් නෙමෙයි නං. මගෙ පොඩි දේපොලක් තියෙනවා."

"හරි මම දැන් එනවා." මේසන් කීවේය. "මම පොලිසියට කියන්නං, ඔයාව ළඟම සහ ළඟාවිය හැකි මහේස්ත්‍රාත්තුමාට ඉදිරිපත් කරන්ඩ කියලා. හිත සන්සුන් කරගෙන ඉන්ඩ."

## තොමීගෙ ෆෝන් ගැල තිළිණයකි



# 4

වර්ජිනියා බැක්ස්ටර්ගේ නපුරු සිහිනය මැදට කඩාපැන්නා වූ පෙරී මේසන් ඇගේ බියපත් බව සහ අවිනිශ්චිතතාවය පළවා හැරියේය.

''මහේස්ත්‍රාත්තුමා ඩොලර් පන්සීයකට ඇපේ නියම කළා.'' මේසන් කීවේය. ''ඔයා ළඟ එච්චර සල්ලි තියෙනවාද?''

''මගෙ බැංකුවෙ තියෙන සල්ලි ඔක්කොම අදින්ඩ වේවි.''

''රිමාන්ඩ් එකේ හිරවෙලා ඉන්නවාට වඩා ඒක හොඳයි නේද? '' මේසන් පෙන්වා දුන්නේය. ''දැන් මට දැනගන්ඩ ඕනෙ හරියටම මොකද්ද උනේ කියලා.''

උදෑසන සිදු වූ සියල්ල වර්ජිනියා කියා සිටියාය.

''ඔයා ප්ලේන් එකේ ආවෙ කොහෙ ඉඳලා ද?'' මේසන් ඇසුවේය.

''සැන් ෆ්‍රැන්සිස්කෝ ඉඳලා.''

''ඇයි ඔයා සැන් ෆ්‍රැන්සිස්කෝ ගියේ?''

''මම මගෙ නැන්දා කෙනෙක්ව බලන්ඩ ගියේ. එයා අසනීපෙන් ඉන්නෙ. වයසයි. කාත් කවුරුවත් නෑ. එයා හරි ආසයි මම එයා බලන්ඩ එනවට.''

''ඔයා රස්සාවක් කරනවද?''

''ස්ථිර රස්සා නෙමෙයි. මිස්ට බැනොක් අන්තරා වුණාට පස්සෙ මට ස්ථිර රස්සාවක් හම්බ වුණේ නෑ. පොඩි පොඩි තාවකාලික ජොබ් තමයි මම කරන්නෙ.'

''ඒ කියන්නෙ ඔයාට යම් ආදායමක් තියෙනවා?'' මේසන් ඇසුවේය.

''ඔව්,'' ඇය කීවාය. ''මිස්ට බැනොක්ට එකම එක සහෝදරයෙක් ඇරුනහම වෙන නෑදෑයො හිටියෙ නෑ. එයා අන්තිම කැමැත්තෙන් මට හොලිවුඩ්වල පොඩි දේපොලක් උරුම කලා. මට ඒකෙන්-''

''ඔයා බැනොක් ළඟ කොච්චර කාලයක් වැඩ කළා ද?''

''අවුරුදු පහළොවක්.'' ඇය කීවාය. ''මට වයස විස්සෙදි තමයි මම රස්සාවට ගියේ.''

''ඔයා කසාද බැන්දෙ නැද්ද?''

''එකපාරක් බැන්දා, ඒත් ඒක හරිගියේ නෑ.''

''දික්කසාද උනා?''

''නෑ, ඒත් අපි දෙන්නා ටික කාලෙක ඉඳලා වෙන් වෙලා ඉන්නෙ.''

''හස්බන්ඩ් එක්ක ඇයි හොඳයිකම් පවත්වනවාද?''

''නෑ.''

''හස්බන්ඩ්ගෙ නම මොකද්ද?''

''කොල්ටන් බැක්ස්ටර්.''

''ඔයා 'මිස්' ටයිටල් එක තමයි පාවිච්චි කරන්නෙ?''

''ඔව්, සෙකට්‍රි කෙනෙක් හැටියට රස්සාවකට යන්ඩ එතකොට ලේසියි.''

''හරි, ඔයා නැන්දා බලන්ඩ ගියා කියමුකො. එතකොට ඔයාගෙ ගමන් මලු ගැන මොනවා හරි ප්‍රශ්නයක් ඇති උනාද, ඒවා ප්ලේන් එක ඇතුළට දානකොට?''

"නෑ-පොඩ්ඩක් ඉන්ඩ. මට අතිරේක බරට ගෙවන්ඩ සිද්ද වුණා."

මේසන්ගේ දෑසේ ක්ෂණික උනන්දුවක් ඇති විය. "ඔයා අතිරේක බරට ගෙව්වා?"

"ඔව්."

"ඔයා ගාව ඒ රිසිට් එක තියෙනවාද?"

"ඒක මගෙ ටිකට් එකට අමුණලා තිබ්බෙ. ටිකට් එක මගෙ පොඩි බෑග් එකේ. මාව අත්අඩංගුවට ගන්නකොට ඒගොල්ලො ඒක ගත්තා."

"ඒක අපිට ආපහු ගන්ඩ පුළුවන්." මේසන් කීවේය. "එතකොට ඔයා තනියෙමද ගමන ආවෙ?"

"ඔව්."

"ඔයාගෙ සීට් එකට අල්ලපු සීට් එකේ හිටියෙ කවුද කියලා මතකද?"

"අවුරුදු තිස් දෙකක තිස් තුනක විතර පිරිමි කෙනෙක් හිටියෙ. හොඳට ඇඳලා හිටියා. මට දැන් හිතෙනවා මිනිහාගෙ අමුත්තක් තිබුණා කියලා. සාමාන්‍යයෙන් ප්ලේන් එකකදි හම්බ වෙන මිනිස්සු වගේ නෙමෙයි. බොහොම ප්‍රියමනාපයි. මට හරියටම කියන්ඩ තේරෙන්නෙ නෑ."

"ආයෙ එයාව දැක්කොත් ඔයාට අඳුරගන්ඩ පුළුවන්ද?"

"ඔව්, අනිවාර්යයෙන්ම."

"ෆොටෝ එකකින් අඳුරගන්ඩ පුළුවන්ද?"

"ඔව්, ෆොටෝ එක පැහැදිලි එකක් නං."

"ඔයාට තිබුණෙ එක් සූට් කේස් එකයි?" මේසන් ඇසුවේය.

"නෑ, සූට් කේස් එකයි තව පොඩි බෑග් එකක් තිබුණා."

"ඒ පොඩි බෑග් එක කෝ?"

"ඒගොල්ලො ගත්තා. සූට් කේස් එක තමයි ඉස්සෙල්ලාම පෝටර් ගත්තෙ. ඊටපස්සෙ මගෙ පොඩි බෑග් එක. එතකොටම තමයි

මේ පොලිස්කාරයා ඇවිල්ලා ඇහුවෙ බෑග් එක ඇරලා බැලුවාට කමක්නැද්ද කියලා. බැගේජ් එන්ඩ ප්‍රමාදයක් තිබ්බ නිසා මම හිතුවා ඒක සාමාන්‍ය දෙයක් කියලා.''

''ඔයා මොනවාද එයාට කිව්වෙ?''

''බෑග් එකේ තියෙන දේවල් මෙන්න මේවායි කියලා, ඊටපස්සෙ මම කිව්වා ඇරලා බැලුවාට කමක් නෑ කියලා.''

''ඒ කතාබහේ වෙන මොනවාත් ඔයාට මතක නැද්ද?''

''මෙහෙමයි, මුලින්ම එයා ඇහුවා, සූට් කේස් එක මගෙම ද කියලා. මම ඔව් කිව්වා. එතකොට එයා ඇහුවා ඇතුලෙ තියෙන්නෙ මොනවාද කියලා කියන්ඩ පුළුවන් ද කියලා. මම ඇතුලෙ තියෙන බඩු මුට්ටු ගැන කිව්වා. එතකොට ඇහුවා එයා ඒක ඇරලා බැලුවට කමක්නැද්ද කියලා.''

මේසන් මොහොතක් වේලා නළල රැළි නංවාගෙන කල්පනා කළේය. ඔහු ඉන්පසු කතා කළේ එතරම් වැදගත් ප්‍රශ්නයක් නොඅසන ආකාරයෙනි. ''ඒ කියන්නෙ, ඔයාගෙ බෑග් දෙකම රාත්තල් හතළිහට වඩා බර වැඩි වුණා ද?''

''ඔව්. බෑග් දෙකම රාත්තල් හතළිස් හයක් බර වුණා. මට සිද්ද වුණා අතිරේක රාත්තල් හයට ගෙවන්ඩ.''

''එහෙමද?,'' මේසන් සිතිවිල්ලෙන් බරව කීවේය. ''ඔයාට ලොකු ආත්ම විශ්වාසයක් ඇතුව ඉන්ඩ සිද්ධ වේවි. ඔයා ජරහන්ත අත්දැකීමකට මූණ දීපු එක ඇත්ත. ඒත් අපිට පුළුවන් වේවි මේකේන ගොඩයන්ඩ, මොන විදිහෙන් හරි.''

''මට තේරුම් ගන්ඩ බැරි,'' ඇය කීවාය. ''කොහොමද මගෙ බෑග් එකට ඔය මත්ද්‍රව්‍ය ආවෙ කියලා. සූට් කේස් එක පටිය දිගේ එන්ඩ පරක්කු වුණා තමයි. ඒත් කාටවත් කියන්ඩ බෑනෙ, ප්ලේන් එකේ ඉඳලා බැගේජ් ඔෆිස් එකට එන ටිකට කවුරු හරි සූට් කේස් එක අතපත ගෑවා කියලා.''

''බැගේජ්වලට මොනවා හරි කරන්ඩ පුළුවන් තැන් කීපයක් ඔය අතරෙ තියෙනවා.'' මේසන් කීවේය. ''ඔයා කවුන්ටරේට සූට් කේස් එක දුන්නාට පස්සෙ, ඒක ප්ලේන් එකට දාන්ඩ කලින් කාට හරි පුළුවන්කම තිබ්බා ඒකට මොනවා හරි කරන්ඩ. අපි දන්නෙ නෑ,

ප්ලේන් එකට පටවන්ඩ කලින් සූට් කේස් එක කොතනද තියලා තිබ්බෙ කියලා. කවුරු හරි එතනට ඇවිත් සූට් කේස් එකට මොනවා හරි දැම්මා ද කියලා අපි දන්නෙ නෑ. අනිත් එක තමයි, සූට් කේස් එක පටිය දිගේ ආවෙ ප්‍රමාද වෙලා. ඒ කියන්නෙ ඒක ඇවිල්ලා තිබ්බෙ වෙනත් ට්‍රක් එකක. ඔය ප්ලේන් හදලා තියෙන්නෙ, එක පැත්තකින් මගීන් බහිනකොට අනිත් පැත්තෙන් බැගේජ් එළියට ගන්න විදිහට. එතකොට, දෙවෙනි ට්‍රක් එක එනකං සෑහෙන වෙලාවක් ඔයාගෙ සූට් කේස් එක එළිමහනෙ තිබිලා තියෙනවා. යම්කිසි කෙනෙකුට ඒකට මොනවා හරි දාන එක හිතන තරං අමාරු දෙයක් නෙමෙයි.''

''ඒත් ඇයි එහෙම කරන්නෙ?'' ඇය ඇසුවාය.

''අන්න ඒක තමයි ප්‍රශ්නෙ,'' මේසන් කීවේය. ''අපිට හිතන්ඩ පුළුවන් කවුරුහරි මත්ද්‍රව්‍ය අරගෙන ආපු කෙනෙක් දැනගත්තා පොලිසියට ඔත්තුවක් ගියා කියලා. එයාව පරීක්ෂා කරන්ඩ ඉඩ තියෙනවා කියලා. ඒ නිසා එයා ඔයාගෙ බෑග් එකට මත් ද්‍රව්‍ය ටික දාලා, එයාගෙ සහකාරයෙක් ලවා පොලිසියට කෝල් කරා කියලා අපිට අනුමාන කරන්ඩ පුළුවන්. අනිත් එක තමයි, ඔයාගෙ හැඩරුව විස්තරේ බොහොම හොඳින් පොලිසියට ලැබිලා තිබුණා. ඒකයි ඔයාව අල්ල ගත්ත පොලිස් නිලධාරියා කෙලින්ම ඔයා ළඟටම ආවෙ.''

මේසන් මද වේලාවක් කල්පනාවෙ යෙදුනේය. ''ඔයාගෙ නම ගැන මොකද? ඔයා සම්පූර්ණ නම සූට් කේස් එකේ ගහලා තිබුණා ද, නැත්තං මුල් අකුරු විතර ද?''

''බෑග් එකේ මගෙ නමයි, 422, යුරේකා ආම්ස් තට්ටු නිවාසය කියන ඇඩ්‍රස් එකයි ගහලා තිබුණා.''

''කමක් නෑ,'' මේසන් කීවේය. ''මම ඔයාව ඇප පිට එළියට ගන්නං. ඒ අතරවාරෙ, මම හදන්නෙ පුළුවන් තරං ඉක්මනට මූලික සාක්ෂි විභාගය කැඳවන්ඩ. අඩුගානෙ පොලිසිය අතේ තියෙන සාක්ෂි මොනවාද කියලා අපිට එතකොට දැනගන්ඩ පුළුවන්. මට තේරෙනවා, ඔයාව කවුරුහරි මේ වැඩේට පටලෝලා තියෙන බව. අපිට ගොඩ යාගන්ඩ පුළුවන් මාර්ගයක් පෑදේවි. ඒත් ඔයාට ලොකු මානසික බලපෑමකට යටත් වෙන්ඩ සූදානම් වෙන්ඩ වේවි.''

"මට කියන්ඩ," ඇය බියපත් හඬින් ඇසුවාය. "පත්තරේක ෆොටෝ ග්‍රැෆර් කෙනෙක් එතන හිටයා. එයා මගෙ පින්තූර ගත්තා. මොනවා හරි දෙයක් පත්තරේ තියේවිද?"

"ෆොටෝග්‍රැෆර් කෙනෙක්?" මේසන් ඇසුවේය.

ඇය හිස ඉහළ පහළ වැනුවාය.

"එහෙමනං ඒක මම මුලින් හිතුවා වගේ සරල වැරදීමක් නෙමෙයි." මේසන් කීවේය. "අනිවාර්‍යයෙන්ම පත්තරවල ඔයා ගැන පළ වේවි."

"මගෙ නමයි, ඇඩ්‍රස් එකයි ඔක්කොම විස්තරයි?"

"නමයි, ඇඩ්‍රස් එකයි, ඔයාගෙ පින්තූරෙයි." මේසන් කීවේය. "සමහර පොලිස්කාරයෝ ප්‍රසිද්ධියට කැමතියි. ඒ නිසා ඒ ගොල්ලො කරන්නෙ, කවුරුහරි තරුණ ගෑනු කෙනෙකුව අත්අඩංගුවට ගන්ඩ යනකොට පත්තරකාරයෙකුට ඔත්තුව දෙන එක. පත්තරකාරයා කරන්නෙ, ඔත්තුව දීපු පොලිස්කාරයාගෙ චරිතය පුම්බලා පත්තරේ පළ කරන එක. ඒ මදිවාට මත්ද්‍රව්‍යවල වටිනාකම හොර විකුණුම් මිලටම පත්තරේ දානවා. ඩොලර් දාස් ගාණක වටිනාකමක් ඇති මත්ද්‍රව්‍ය ඔයා ප්‍රවාහනය කළා කියලා පත්තරේ පළ වේවි."

ඇගේ මුහුණින් පලවූයේ ඈ තුළ වූ මානසික පසුබෑමය.

"එතකොට මම නඩුවෙන් නිවැරදිකාරිය උනාට පස්සෙ මොකද වෙන්නෙ කියලා කියනවද?" ඇය ඇසුවාය.

"ගොඩාක් වෙලාවට කිසි දෙයක් නෑ." මේසන් කීවේය. "බාගවිට, ජේලියක් දෙකක් ඇතුල් පිටුවක පලවේවි, ඔයා නිදොස් කොට නිදහස් කළා කියලා."

"මම නිදොස් කොට නිදහස් වේවි නේද?" ඇය බලාපොරොත්තු සහගතව ඇසුවාය.

"මම නීතිඥයෙක් විතරයි, සාත්තරකාරයෙක් නෙමෙයි." මේසන් කීවේය. "අපි බලමු අපිට කරන්ඩ පුළුවන් හොඳම දේ. ඒ අනුව එන ප්‍රතිඵලවලට මූණ දෙමු."

# 5

මේසන් විසින් වර්ජිනියා බැක්ස්ටර්ව උසාවි කාමරයේ ගරාදි වැට අසලට කැඳවාගෙන යනු ලැබුවාය.

''කලබල වෙන්නෙ නැතුව ඉන්ඩ,'' ඔහු කීවේය.

''ඒක හරියට සීතලේ ඉන්න කෙනෙකුට වෙවුලන්නෙ නැතුව ඉන්ඩ කියනවා වගේ වැඩක්.'' ඇය කීවාය. ''මම හොඳටම කලබල වෙලා. මගෙ ඇඟ ඇතුළ ගැහෙනවා. එළියත් ගැහෙනවාද මම දන්නෙ නෑ.''

''මේක මූලික සාක්ෂි විභාගයක් විතරයි,'' මේසන් කීවේය. ''මෙතෙන්දි කෙරෙන්නෙ ඉහළ උසාවියකට නඩුව ගෙනියන්ඩ තරමට සාක්ෂි තියෙනවාද කියලා තීන්දු කිරීම. සාමාන්‍යයෙන් විනිසුරුතුමා තීරණය කළොත්, ඉහළ උසාවියට යොමු කරනවා කියලා, ඇප මුදල ලොකු ගාණකින් වැඩි කරනවා.''

''මගෙ ළඟ වෙන සල්ලි නෑ,'' වර්ජිනියා කීවාය. ''මගෙ දේපොල අතේ පාඩුවට විකුණන්නෙ නැතුව වෙන සල්ලියක් හොයන්ඩ ක්‍රමයක් මට නෑ.''

''මම දන්නවා.'' මේසන් කීවේය. ''මම ඔයාට ඒ ගැන කිව්වෙ, හැම දෙයක් ගැනම පෙර සූදානමකින් ඉන්න එක හොඳ නිසා. සමහරවිට, අපිට සහනයක් ලැබෙන්ඩත් පුළුවන්.''

"මිස්ට මේසන් හිතන්නෙ නැද්ද, මාව මූලික සාක්ෂි විභාගෙන්ම නිදහස් කරගන්ඩ පුළුවන් වේවි කියලා?"

"සාමාන්‍යයෙන්," මේසන් කීවේය. "මූලික සාක්ෂි විභාගයකදි, විනිසුරුතුමා කරන්නෙ, චෝදනාව ගොනු කරන නීතිපතිවරයා හරි එයාගෙ සහායකයා හරි ඉල්ලා සිටින දේ තමයි. විත්තිකාරියගෙන් සාක්ෂි ගන්නෙ නෑ, බොහොම වෙලාවට. ඒ වගේම තමයි, විත්තිය නිදහස් කරන්නෙත් බොහොම කලාතුරකින්. ඒත් මම ඔයාව මෙතෙන්ට ගෙනාවෙ, ඔයාගෙ ස්වභාවය විනිසුරුතුමාට දැකබලාගන්ඩ ලැබෙන්ඩ ඕනෙ නිසා."

"අර පත්තර වාර්තාවයි, මගෙ ෆොටෝ එකයි..." ඇය කීවාය.

"පත්තර සංස්කාරකවරයා කියන විදිහට, ඒ ෆොටෝ එකෙන් ඔයාගෙ පුදුමයයි බයයි පෙන්නුම් කරනවා. සමහරවිට, ඒ ෆොටෝ එක නිසා ඔයාට හොඳක් වේවි."

"ඒත් ඒකෙන් මගෙ සායම ගියානෙ." ඇය කීවාය. "මගෙ යාළුවො කිසිකෙනෙක් මගෙත් එක්ක දැන් කතා කරන්නෙ නෑ."

මේසන් කිසිවක් කීමට සූදානම් වුවද, විනිසුරුවරයාගේ නිල කාමරයේ දොර විවෘත වූ හෙයින් මුව වසා ගත්තේය.

"නැගිටින්ඩ." මේසන් කීවේය.

උසාවි කාමරය තුළ උන් සියලු දෙනා විනිසුරු කෝට්ලන්ට් ඇල්බට්ගේ සම්ප්‍රාප්තියත් සමග නැගී සිටි අතර විනිසුරුතුමා විත්තිකාරිය දෙස අධ්‍යනශීලී බැල්මක් හෙලුවේය.

"රජය එදිරිව වර්ජිනියා බැක්ස්ටර් මූලික සාක්ෂි විභාගය. තමුන් සූදානම්ද කටයුතු කරගෙන යාමට?"

"විත්තිය වෙනුවෙන් සූදානම්, උතුමාණෙනි." මේසන් කීවේය.

ජෙරී කැස්වෙල් හෙවත්, මූලික සාක්ෂි විභාග සඳහා නිරන්තරව සේවයේ යොදවනු ලබන දිස්ත්‍රික් නීතිපතිගේ ආධුනික සහකරු සිය හඬ අවදි කළේය. "පැමිණිල්ල සුපුරුදු පරිදි සූදානම්, උතුමාණෙනි." ඔහු නාට්‍යමය ලෙස කීවේය.

මොහොතක් නතරවී උන් ඔහු වාඩි වූයේය.

"තමුන්ගෙ පළවෙනි සාක්ෂිකරු කැඳවන්ඩ." විනිසුරු ඇල්බට් කීවේය.

ගුවන්තොටුපොලෙහි උන් පෝටර්වරයා පළමු සාක්ෂිකරු ලෙස කැස්වෙල් විසින් කැඳවනු ලැබිණි.

"තමුන් මේ විත්තිකාරිය දැකලා තියෙනවාද?"

"ඔව් සර්, මම එයාව දැකලා තියෙනවා."

"මේ මාසයේ දාහත්වෙනිදා?"

"ඔව් සර්."

"තමුන් ගුවන්තොටුපොලේ සේවය කරන පෝටර් කෙනෙක්ද?"

"ඔව් සර්."

"ඒ කියන්නෙ තමුන් ජීවිකාව සරිකරගන්නෙ ගමන්මලු ප්‍රවාහනයෙන්?"

"ඔව්, සර්."

"එතකොට, මේ විත්තිකාරිය පසුගිය දාහත්වෙනිදා කිසියම් සූට් කේස් එකක් තමුන්ට පෙන්නුම් කළාද?"

"ඔව් සර්, එයා එහෙම කළා."

"ඒ සූට් කේස් එක ආයෙ දැක්කොත් අඳුනගන්ඩ පුළුවන්ද?"

"මට පුළුවනි, සර්."

කැස්වෙල් කිසියම් පොලිස් නිලධාරියෙකුට හිසින් සංඥා කළ අතර ඔහු සූට් කේසයත් රැගෙන ඉදිරියට පැමිණියේය.

"මේකද ඒ සූට් කේස් එක?"

"ඔව් සර්, මේක තමයි."

"මා ඉල්ලා සිටිනවා මෙය රජයේ සාක්ෂි "ඒ" වශයෙන් නම් කරන ලෙස." කැස්වෙල් ප්‍රකාශ කළේය.

"අනුමතයි," විනිසුරුවරයා නියෝග කළේය.

"එතකොට, විත්තිකාරිය කිව්වා, ඒක එයාගෙ සූට් කේස් එක කියලා?"

"ඔව්, සර්."

"සූට් කේස් එක අරින වෙලාවෙ තමුන් එතන හිටියාද?"

"ඔව් සර්."

"සූට් කේස් එක විවෘත කළාට පස්සෙ, රෙදි පෙරදි ඇරුනහම වෙන මොනවාද තිබ්බෙ ?'

"ප්ලාස්ටික් පෙට්ටිවල පොඩියට ඔතපු පාර්සල් වගයක් තිබ්බා."

"කොච්චර තිබුණා ද කියලා තමුන් දන්නවාද?"

"මම ගණං කළේ නෑ. ඒත් සෑහෙන ප්‍රමාණයක් තිබ්බා."

"එච්චරයි," කැස්වෙල් කීවේය. "හරස් ප්‍රශ්න ඇසීමේ වාරය."

හරස් ප්‍රශ්න ඇසීම සඳහා මේසන් සාක්ෂි කූඩුව වෙත ගියේය.

"විත්තිකාරිය ඒ සූට් කේස් එක තමුන්ගෙ බවට ප්‍රකාශ කළා? "

"ඔව්, සර්."

"විත්තිකාරිය තමුන්ට ගමන්මලු සඳහා ලදු පතක් ලබාදුන්නාද? "

"ඔව් සර්, එයා රිසිට් එකක් දුන්නා."

"එතකොට තමුන් ඒ ලදු පතේ අංක සහ ගමන් මලුවල අංක සසඳා බැලුවා?"

"ඔව්, සර්."

"ලදු පත් කීයක් විත්තිකාරිය තමුන්ට ඉදිරිපත් කළා ද?"

"එයා මට රිසිට් දෙකක් දුන්නා."

"දෙවෙනි ලදු පතට මොකද උනේ?"

"ඒ රිසිට් එක තිබුණෙ පොඩි හතරැස් බෑග් එකකට. ඒකත් මම එයාට අරගෙන දුන්නා."

"ඒ බෑගයත් විවෘත කරනු ලැබුවාද?"

"ඔව්, සර්."

"හරි, දැන් අපි බලමු සූට් කේස් එකේ ප්‍රශ්නෙ ගැන. මේ සූට් කේස් එක විවෘත කරන්ඩ කලින් එතනට ආපු කෙනෙක් තමුන් පොලිස් නිලධාරියෙක් විදිහට අඳුන්වාදුන්නාද?"

"ඔව් සර්, ජැක් ඇන්ඩෘස් කියන පොලිස් නිලධාරියා විත්තිකාරියට එයාගෙ හැඳුනුම්පත පෙන්නලා ඇහුවා මේක එයාගෙම සූට් කේස් එකද කියලා."

"විත්තිකාරිය මොකද්ද කිව්වෙ?"

"එයා කිව්වා ඒක එයාගෙ තමයි කියලා."

"එතකොට ඇන්ඩෘස් මොකද කිව්වෙ?"

"එයා ඇහුවා සූට් කේස් එක ඇරලා බලන්ඩද කියලා."

"වෙන මොනවාත් කිව්වෙ නෑ?"

"මම කිව්වෙ කතා බහේ සාරාංශය."

"මම තමුන්ගෙන් සාරංශයක් අහන්නෙ නෑ." මේසන් කීවේය. "මම අහන්නෙ එතන වෙච්ච සාකච්ඡාව ගැන. මේ පොලිස් නිලධාරියා කිව්වෙ නැද්ද විත්තිකාරියට තමුන්ගෙ සූට් කේස් එක අඳුනගන්ඩ පුළුවන්ද, එහෙම නම් ඒක ඇතුලෙ තියෙන දේවල් විස්තර කරන්ඩ කියලා?"

"ඔව් සර්, එයා එහෙම කිව්වා."

"ඊට පස්සෙ ඔය කියන පොලිස් නිලධාරියා කිව්වා තමුන්ට ඇතුළෙ තියෙන දේවල් බලන්ඩ හැකියාව ලැබෙන පරිදි සූට් කේස් එක විවෘත කරන්ඩ කියලා?"

"ඔව්, සර්."

"එතකොට පොඩි බෑග් එක? ඒකෙ ඇතුලෙ තියෙන දේවලුත් ...යන්ඩ කියලා කිව්වාද?"

"නෑ, නිකම්ම ඇහුවා ඒක විත්තිකාරියගෙ ද කියලා."

"එතකොට විත්තිකාරිය මොකද කිව්වෙ?"

"එයා කිව්වා ඒකත් එයාගෙම තමයි කියලා."

"එතකොට මොකද උනේ?"

"පොලිසියෙ මහත්තයා ඒකත් ඇරලා බැලුවා."

"එච්චරද සිද්ද උනේ?"

"ඊටපස්සෙ ඉතිං, එයාව පොලිසියෙන් අරං ගියානෙ."

"හොඳයි, මම දැන් තමුන්ගෙ අවධානය යොමු කරනවා, දාහත්වෙනිදා සවස මුද්‍රණයෙන් එළිදැක්වුණු පුවත්පතක ඡායාරූපයක් කෙරෙහි, විත්තිකාරිය සහ ඇගේ සූට් කේසය දක්වෙන."

"විරෝධය පානවා, උතුමාණෙනි, අදාල නොවන කරුණක් සහ නිසියාකාර හරස් ප්‍රශ්න ඇසීමක් නොවන බවට යන පදනම මත." කැස්වෙල් උඩ පැන කීවේය.

"මෙය මූලික සාක්ෂි විභාගයක් පමණයි," මේසන් කීවේය. "විත්තිකාරිය අත්අඩංගුවට පත්වූ පසුබිම උසාවියට පෙන්නුම් කිරීම සඳහා එම කරුණ විත්තිය විසින් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා."

"විරෝධය නිශ්ප්‍රභා කරනවා," විනිසුරු ඇල්බට් කීවේය. "උසාවිය කැමතියි ඒ ප්‍රශ්ණයට පිළිතුර දැනගන්ඩ."

"මේ ඡායාරූපය ලබාගන්නා අවස්ථාවේ තමුන් එතන හිටියාද?" මේසන් ඇසුවේය.

"ඔව්."

"ඡායාරූප ශිල්පියාව තමුන් දැක්කාද?"

"ඔව්, සර්."

"එයා කොහෙ ඉඳලාද ආවෙ?"

"කුලුණක් අස්සෙ එයා හැංගිලා හිටියෙ."

"සූට් කේස් එක අරිනකොට ඒ පුද්ගලයා කැමරාවත් අරගෙන ආවා."

"ඔව්, සර්. සූට් කේස් එක අරිනකොටම ඒ මනුස්සයා කුලුන අස්සෙන් මතු වෙලා කැමරාවත් මානගෙන ආවා, ටික්, ටික්, ටික් ගාලා ෆොටෝ තුනක් ගැහුවා."

"ඊටපස්සෙ මොකද උනේ?"

"ඊටපස්සෙ එයා ආපහු දුවගෙන ගියා."

"ගරු අධිකරණයේ අවසර ඇතිව," කැස්වෙල් කීවේය. "පැමිණිල්ල ප්‍රකාශකරනවා, මේ ඡායාරූප ගැනීමේ කාරණාව පිළිබඳව අප කරුණු දැක්වීමට සූදානම් බවත් මේ අවස්ථාවේ සිදුවන්නෙ නිසි හරස් ප්‍රශ්න ඇසීමක් නොවන බවත්. එමෙන්ම, මෙම හරස් ප්‍රශ්න තුළින් මතුවන කිසිදු තොරතුරක ප්‍රයෝජනයක් නෑ."

"ගරු අධිකරණයේ අවසර ඇතිව, විත්තිය ප්‍රකාශ කරනවා මේ තුළින් ඉතා වැදගත් කරුණක් මතු වෙන බව." මේසන් කීවේය. "එයින් කියවෙනවා, මෙය සාමාන්‍ය පරීක්ෂාවකදී කළ අත් අඩංගුවට ගැනීමක් නොවන බව. පුවත්පත් ඡායාරූප ශිල්පියාට කිසියම් තොරතුරු ලබාදීමක් සිදුවී තිබෙනවා, සූට් කේසයේ තිබී හමුවන්නේ කුමක්ද යන්න කලින් ම දැන සිටි නිසා. එනම් කිසියම් ඔත්තුකරුවෙකු ලබා දුන් තොරතුරක් මත පොලිසිය ක්‍රියාත්මක වී ඇති බව. මෙම පුවත්පත් වාර්තාව දෙස බලනවිට පැහැදිලි වෙනවා, අත්අඩංගුවට ගැනීම ක්‍රියාත්මක කළ පොලිස් නිලධාරියාට නිසියාකාර ප්‍රසිද්ධියක් සහ කීර්ති නාමයක් අත් කරදීමට පුවත්පත වෙහෙස දරා ඇති බව."

විනිසුරු ඇල්බට්ගේ දෙතොලග සිනහවක සේයාවක් ඇඳිනි.

"උතුමාණෙනි, මා විරෝධය ප්‍රකාශ කරනවා, එවන් ප්‍රකාශයකට මා විරෝධය ප්‍රකාශ කරනවා." කැස්වෙල් ආවේගකාරී හඬකින් කීවේය.

"මෙය කරුණු නිසි ලෙස ඉදිරිපත් කිරීමක් පමණයි." මේසන් සන්සුන් ලෙස කීවේය.

"මොන විදිහේ කරුණු ඉදිරිපත් කිරීමක් ද?" කැස්වෙල් ඇසුවේය.

"අත්අඩංගුවට ගැනීම සිදුවූයේ පොලිස් නිලධාරියාට ලැබුණු කිසියම් විශේෂ ඔත්තුවක් මත බව පෙන්වාදීමට." මේසන් කීවේය. "එමගින් විත්තියට අවස්ථාව ලැබෙනවා එම තොරතුර ලබාදුන්නෙ කවුරුන් ද යන බව දැන ගැනීමට."

කැස්වෙල්ගෙන් දිස් වූයේ බලාපොරොත්තු සුන් වූ ස්වභාවයකි.

මදහසක් පෑ විනිසුරු ඇල්බට් කතා කළේය. 'හරස් ප්‍රශ්න ඇසූ නීතිඥයාගේ කරුණු ගෙනහැර දැක්වීම උසාවිය අගයකොට සලකනවා. ඒ තුළින් විත්තියේ අභිප්‍රාය හෙළිවෙනවා. වෙනත් හරස් ප්‍රශ්න තියෙනවා ද?''

''නෑ, උතුමාණෙනි.'' මේසන් කීවේය.

''නැවත ප්‍රශ්න ඇසීම?''

''නෑ, උතුමාණෙනි.'' ජෙරී කැස්වෙල් කීවේය.

''තමුන්ගෙ ඊළඟ සාක්ෂිකරු කැඳවන්ඩ.''

''පොලිස් නිලධාරී ජැක් ඇන්ඩෲස් මා කැඳවා සිටිනවා.'' කැස්වෙල් කීවේය.

''තමාගේ නම කුමක්ද?'' අන්ඩෲස් දිවුරුම් දුන් පසු කැස්වෙල් ඇසුවේය.

''ජැක්මන් ඇන්ඩෲස්. මාව හැමෝම දන්නෙ ජැක් ඇන්ඩෲස් කියන නමින්. ඒත් මගෙ ඇත්ත මුල් නම ජැක්මන්.''

''මා දූන් තමුන්ගේ අවධානය රජයේ සාක්ෂි 'ඒ' යනුවෙන් නම් කොට ඇති සූට් කේසය වෙත යොමු කරනවා. තමුන් එය මුළින් ම දුටුවේ කවාදා ද?''

''ටිකකට කලින් සාක්ෂි දීපු පෝටර්වරයාට විත්තිකාරිය එය පෙන්වූ අවස්ථාවේදී.''

''එතකොට තමුන් මොකද කළේ?''

''මම විත්තිකාරිය ළඟට ගිහින් ඇහුවා, ඒක එයාගෙ සූට් කේස් එකමද කියලා.''

''ඊටපස්සෙ මොකද වුණේ?''

''මම ඇහුවා ඒ සූට් කේස් එක ඇරලා මම බැලුවාට කමක් නැද්ද කියලා. විත්තිකාරිය කිව්වා කමක් නෑ කියලා.''

''ඊටපස්සෙ?''

''මම සූට් කේස් එක විවෘත කළා.''

''තමුන්ට මොනවාද හම්බඋනේ?''

"මට හම්බ උනා පැකට් පනහක්-"

"පොඩ්ඩක් ඔහොම ඉන්ඩ," මේසන් කීවේය. "මෙම ප්‍රශ්නයට සාක්ෂිකරු පිළිතුරු දී හමාරයි. ඔහුට පැකට් පනහක් හමුවෙලා තිබුණා. ඒවායේ තිබ්බෙ මොනවාද කියන එක වෙනත් ප්‍රශ්නයක් සහ ඊට ලබා දිය යුතු පිළිතුරක් වෙනවා."

"බොහොම හොඳයි," කැස්වෙල් කීවේය. "උගත් නීතිඥතුමාට මේක අමාරු විදිහටම කරගන්ඩ ඕනෙ නම් අපිට කමක් නෑ. මොනවාද ඒ පැකට්වලට තමා කළේ? ඒවා තමුන්ගෙ භාරයට ගත්ත ද?"

"ඔව්."

"කුමක්ද ඒ පැකට්වල තිබුණු ද්‍රව්‍ය?"

"ගරු අධිකරණයේ අවසර ඇතිව," මේසන් කීවේය. "මේ අවස්ථාවේදී විත්තිය විරෝධය ප්‍රකාශ කරනවා, නීත්‍යානුකූල නොවන පරීක්ෂාවක් සිදුව ඇති බවටත් ඒ තුළින් මෙම ප්‍රශ්නය ගරු අධිකරණය ඉදිරියේ ඇසිය නොහැකි බවටත්. ඒ අනුව විත්තිය ඉල්ලා සිටිනවා, පරීක්ෂාව සිදුවූයේ නීත්‍යානුකූල නොවූ පරිදි බවට කරුණු ඉදිරිපත්කිරීම සඳහා විත්තියට හරස් ප්‍රශ්න ඇසීමට ඉඩ දෙන ලෙස."

"බොහොම හොඳයි," විනිසුරු ඇල්බට් කීවේය. "විත්තියේ නීතිඥ මහතාට අවසර ලැබෙනවා හරස් ප්‍රශ්න ඇසීමට."

"තමා සතුව පරීක්ෂා කිරීමේ බලපත්‍රයක් තිබුණා ද?" මේසන් සාක්ෂිකරුගෙන් ඇසුවේය.

"නෑ, සර්. සර්ච් වොරන්ට් එකක් ගන්ඩ වෙලාවක් තිබුණෙ නෑ."

"තමුන් නිකම්ම එතෙන්ට ගියා?"

"මම නිකම්ම එතෙන්ට ගියා. නමුත් මම ඔබතුමාගෙ අවධානය යොමුකරන්ඩ කැමතියි, මම විත්තිකාරියගෙන් අසා සිටියා ඇගේ සූට් කේසය විවෘත කිරීම සඳහා ඇගේ අකමැත්තක් තියෙනවාද යන්නත් ඇය කැමැත්ත දුන් පසුව පමණක් මා සූට් කේසය විවෘත කළ බවත් යන කාරණාව කෙරෙහි."

"ඔහොම පොඩ්ඩක් ඉන්ඩ," මේසන් කීවේය. "තමා මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නෙ, ඇති වූ සාකච්ඡාවේ සාරාංශය

පමණයි. එසේත් නොමැති නම් සාකච්ඡාව අවසානයේ ඇති වූ ප්‍රතිඵලය ගැනයි. තමාට මතක ද සාකච්ඡාවේ සිදු වූ සියලු වචන?''

''මේකයි, මම කිව්ව වචන තමයි, ඒවා.''

''තමා ඇයට කියා සිටියාද ඇගේ සූට් කේසය පරීක්ෂා කිරීමට අවශ්‍යය බව?''

''ඔව්.''

''එහෙමනම්, මේ ප්‍රශ්නයට උත්තර දෙන්ඩ,'' මේසන් කීවේය. ''තමුන් ඉන්නෙ ගරු අධිකරණයේ දිවුරුම් දුන් සාක්ෂිකරුවෙක් හැටියට. තමුන් විත්තිකාරියගෙන් ඇසුවේ, ඇගේ සූට් කේසය තමාට පරීක්ෂා කිරීමට උවමනා බව ද, නැති නම් ඇගේ සූට් කේසයේ ඇතුළත ඇති දේ අනුව එම සූට් කේසය ඇගේම බවට හඳුනාගත හැකි ද යන්න ද?''

''මම ඇයගෙන් ඇසුවා ඇගේ සූට් කේසය ඇගේ ම ද යන්න. ඇය එසේ යයි පිළිතුරු දුන්නා. ඊට පස්සෙ මම ඇහුවා ඒක ඇතුළේ තියෙන දේවල් විස්තර කරන්ඩ පුළුවන්ද කියලා.''

''ඊටපස්සෙ තමුන් ඇගෙන් ඇහුවා, සූට් කේස් එක විවෘත කරලා ඇතුලෙ තියෙන දේවල් පෙන්නන්ඩ පුළුවන්ද කියලා?''

''ඔව්, සර්.''

''නමුත් තමුන් ඇයට කීවේ නෑ, තමාට අවශ්‍ය සූට් කේස් එක පරීක්ෂා කිරීමක් බව?''

''නෑ,''

''තමාට සූට් කේසය පරීක්ෂා කිරීම සඳහා ඇය කිසිදු අවසරයක් ලබා දුන්නෙ නෑ?''

''ඇය කීවා සූට් කේස් එක ඇරියාට කමක් නෑ කියලා.''

''තමාට සූට් කේසය පරීක්ෂා කිරීම සඳහා ඇය කිසිදු අවසරයක් ලබා දුන්නෙ නෑ?''

''මම ඇයට කිව්වා, මට ඒක අරලා බලන්ඩ ඕනෙ කියලා, ඇය ඊට විරෝධයක් පෑවෙ නෑ.''

''තමාට සූට් කේසය පරීක්ෂා කිරීම සඳහා ඇය කිසිදු අවසරයක් ලබා දුන්නෙ නෑ?''

''මෙකයි, පරීක්ෂා කිරීම කියන වචනය එතෙන්දි මතු උනේ නෑ, මට මතක හැටියට.''

''අන්න හරි.'' මේසන් කීවේය. ''එතකොට, තමා මේ විත්තිකාරිය මුණගැසීම සඳහා ගුවන්තොටුපොළට ගියේ කිසියම් ඔත්තුවක් අනුව?''

''අර්....ඔව්.''

''කවුද තමාට ඒ ඔත්තුව දුන්නෙ?''

''ඒ තොරතුර හෙළි කිරීමේ තත්වයක නෙමෙයි මම ඉන්නෙ.''

''අපගේ රාජ්‍යයේ අධිකරණයන් විසින් වර්තමානයේ විග්‍රහ කොට ඇති නීතිය අනුව,'' මේසන් කීවේය. ''මෙම සාක්ෂිකරු විසින් සාධාරණ පසුබිම විග්‍රහ කළ යුතුයි, ඔහුට සූට් කේසය පරීක්ෂා කිරීම සඳහා තුඩුදුන් හේතුව. නොදන්නා අයෙකු එසේත් නොමැති නම් නිර්නාමික දුරකතන ඇමතුමක් මෙවන් පරීක්ෂාවක් සඳහා හේතු වන්නේ නෑ. ඒ අනුව විත්තියට අයිතිවාසිකම් තියෙනවා, ඔත්තුව දුන්නේ කවුරුන් ද යන බව දැනගැනීමට.''

විනිසුරු ඇල්බට් නළල රැළි ගන්වාගත්තේය. ''තමා ඔත්තුව දුන් පුද්ගලාගේ නම හෙළි කිරීම ප්‍රතික්ෂේප කරනවා ද?'' ඔහු සාක්ෂිකරුගෙන් ඇසුවේය.

''ඔත්තුව කෙලින්ම මට ලැබුණු එකක් නෙමෙයි.'' ඇන්ඩෲස් කීවේය. ''ඒක ලැබුණෙ මගෙ ඉහළ නිලධාරීන්ට. මට ලැබුණ නියෝගය තමයි, එයාර්පෝට් එකට ගිහින් විත්තිකාරියගේ ගමන් මලු පරීක්ෂා කරන ලෙසත් ඊට අවස්ථාව නොලැබුණහොත් ඇගේ පසුපසින් යන ලෙසත්, පරීක්ෂා කිරීමේ නියෝගයක් ලැබෙන තුරු.''

''මෙය කිසියම් සංකීර්ණ අවස්ථාවක්,'' විනිසුරු ඇල්බට් කීවේය. ''විත්තිකාරිය කිසිවෙකුට හෝ අවසර දී නැහැ ඇගේ සූට් කේසය 'පරීක්ෂා කිරීමට'. නමුත් ඇය ඉඩ දී තිබෙනවා, සූට් කේසයේ ඇති දෑ දැකීම තුළින් එය තමාගේ ගමන් මල්ලක් බව පෙන්වාදීමට.''

''ගරු අධිකරණයේ අවසර ඇතිව,'' මේසන් කීවේය. ''විත්තිය කැමතියි වෙනත් ආකාරයකින් මෙම ප්‍රශ්නය නිරාකරණය

කිරීමට. කිසියම් නීතිමය හිඩැසක් අනුව නොව, විත්තිකාරියගේ සැබෑ නිදොස් බව වෙනත් ආකාරයකින් ඔප්පු කිරීමට විත්තිය අවසර ඉල්ලා සිටිනවා.''

මෙසන් සාක්ෂිකරු වෙත හැරුණේය.

''තමුන් පාර්සල් පනහක් සූට් කේස් එකෙන් එළියට ගත්තා?''

''ඔව්, සර්.''

''මේ අධිකරණය තුළට තමා ඒවා ගෙනාවාද?''

''ඔව්, සර්. මම ගෙනල්ලා තියෙනවා.''

''තමුන් ඒවායේ බර කිරුවා ද?''

''බර? නෑ, සර්. අපි ඒවා ගැනලා සටහන් කළා මිසක් බර බැලුවේ නෑ.''

''එතකොට, තවත් පොඩි බෑග් එකක් තිබුණා, එහෙම නේද?
''

''ඔව්, සර්.''

''ඒකත් අඳුනගන්ඩ පුළුවන්ද කියලා තමුන් විත්තිකාරියගෙ
න් ඇහුවාද?''

''ඇය කිව්වා ඒකත් එයාගෙ කියලා. ඒකට ලඳුපතක් එයා ළඟ තිබ්බා.''

''ඒකේ ඇතුළේ තියෙන්නෙ මොනවාද කියලා තමුන් ඇයගෙ
න් අසා සිටියා ද?''

''නෑ.''

''ඒක ඇරියාට කමක් නැද්ද කියලා තමුන් ඇයගෙන් ඇහුවාද?
''

''නෑ.''

''තමුන් තමා ඒක විවෘත කරලා පරීක්ෂා කළා?''

''ඔව්, ඒත් එකේ මොනවාත් සැකකටයුතු යමක් තිබුණේ නෑ.''

"නමුත් විත්තිකාරියේ අවසරය ඉල්ලා සිටියේ නෑ, එය විවෘත කිරීමට?"

"මට මතක හැටියට, මම ඉල්ලා හිටියෙ නෑ."

"නමුත් තමා එය විවෘත කළා?"

"මම ඒක කළේ මේ ලොකු ප්‍රමාණයක-"

මේසන් අතක් ඔසවා කතා කළේය. "ඒකෙ තිබ්බ දේවල් මේ අවස්ථාවෙ කියන්ඩ ඕනෙ නෑ. දැනට අපි ඒකට කියමු පාර්සල් පනහක් කියලා. තමා ඒ කුඩා බෑග් එකට මොකද්ද කළේ?"

"ඒක මේ ගරු අධිකරණයට ඉදිරිපත් කරලා තියෙනවා."

"එහෙම නම්," මේසන් කීවේය. "තමා මේ පාර්සල් පනහේ බර නොදන්නවා නම්, මේ පාර්සල් පනහ රහිතව බෑග් දෙකේ බර කොච්චරක්ද කියලා දන්නවා ද?"

"නෑ, සර්."

"තමා දන්නවාද විත්තිකාරිය ගමන් මලු සඳහා අතිරේක බර වෙනුවෙන් මුදල් ගෙවා ඇති බව?"

"ඔව්."

"නමුත් තමා මේ ගමන් මලුවල බර කිරා බැලීම සඳහා උත්සාහයක් ගත්තේ නෑ?"

"නෑ."

"ගරු අධිකරණයේ අවසර ඇතිව, මා ඉල්ලා සිටිනවා අපි දැන් මේ ගමන් මලුවල බර කිරා බැලිය යුතු බවට." මේසන් කීවේය.

"එහි අරමුණ කුමක්ද?" විනිසුරු ඇල්බට් විමසා සිටියේය.

"තරාදිය පෙන්නුම් කළොත්," මේසන් කීවේය. "ගමන් මලු දෙකේම බර රාත්තල් හතලිස් හයයි කියලා, ඒ කියන්නෙ කිසියම් කෙනෙක් විත්තිකාරියගේ ගමන් මලුවලට ආගන්තුක යමක් ඇතුල් කරලා තියෙනවා, ගමන් මලු ඇගේ භාරයෙන් මිදුනාට පස්සෙ."

"උසාවිය ඒ යෝජනාව පිළිගන්නවා," විනිසුරු ඇල්බට් කීවේය. "මේ අවස්ථාවේදී උසාවිය විනාඩි දහයක විවේකයක් ලබාග

න්නවා. ඒ අතරතුර පිස්කල් නිලධාරීන්ට නියෝග කරනවා, තරාදියක් අධිකරණය වෙත ගෙන එන ලෙස.''

''ඒත් ඒකෙන් කිසිම දෙයක් කියවෙන්නෙ නෑ.'' කැස්වෙල් ආඩපාලි කීවේය. ''අපිට තියෙන්නෙ විත්තිකාරියගෙ ප්‍රකාශය පමණයි, ගමන්මලුවල බර රාත්තල් හතලිස් හයයි කියලා. ඒ මදිවාට ඇය ඇප පිට නිදහස් වෙලා හිටියෙ. කවුද දන්නෙ ඒ බෑග් වලින් මොන මොනවා එළියට ගත්තා ද කියලා?''

''මේ ගමන්මලු තිබුණේ පොලිසිය භාරයේ නෙමෙයි ද?'' විනිසුරු ඇල්බට් අසුවේය.

''පොලිසිය භාරයේ තමයි, උතුමාණෙනි. ඒත් කවුද දන්නෙ, විත්තිකාරිය බෑග් වලින් එයාගෙ ඇඳුම්එළියට ගත්තා ද කියලා.''

''ඇය ඇඳුම් හෝ වෙනත් යමක් එළියට ගත්තා ද?''

''මම දන්නෙ නෑ, උතුමාණෙනි.''

''තමුන් දන්නෙ නැත්තං විත්තිකාරිය යමක් ගමන් මලු වලින් එළියට ගත්තාද කියලා, යම්කිසිකෙනෙක් යමක් ගමන් මලු ඇතුලට දැම්මාද කියලා දැනගන්ඩ විදිහකුත් නෑ.'' විනිසුරු ඇල්බට් තියුණු හඬින් කීවේය. ''උසාවිය විනාඩි දහයක විවේකයක් ගන්නවා, ඒ අතර තරාදි ගෙනත් තියන්ඩ ඕනෙ.''

මේසන් ටෙලිෆෝන් කුටියක් වෙත ගියේය. ''තව විනාඩි දහයකින් උසාවිය ඇතුලෙ අමුතු යමක් සිද්ධ වෙනවා.'' ඔහු පුවත්පත් කාර්යාලයට කීවේය. ''කෝට්ලන්ඩ් ඇල්බට් නඩුකාරතුමා සාක්ෂි කිරලා මනින්ඩ යනවා.''

''ඇයි අනේ නඩු කාරයො කවදාත් සාක්ෂි කිරලා මැනලා නෙමෙයිද තීන්දු දුන්නෙ?'' පුවත්පත් සංස්කාරකවරයා ඔලොක්කුවට මෙන් ඇසුවේය.

''මේ සැරේ වෙනස්,'' මේසන් කීවේය. ''එතුමා භෞතිකවම මැනලා බලන්ඩයි යන්නෙ.''

''මොකක්?''

''ඒක තමයි කියන්නෙ. තරාදියෙන් මැනලා බලන්ඩයි යන්නෙ. ඉක්මන් කළොත් හොඳ දෙයක් ඩැහැගන්ඩ පුළුවන්.''

''කොයි උසාවි කාමරේද?''

මේසන් උසාවි කාමරයේ අංකය ලබාදුන්නේය.

''අපි දැම්ම එනවා,'' මිනිසා කීවේය. ''පුළුවන්නං ටිකක් කල් අල්ලගන්ඩ බලන්ඩ.''

''මට ඒක කරන්ඩ විදිහක් නෑ,'' මේසන් කීවේය. ''නඩුකාරතුමා හිතනවා, විනාඩි දහයෙන් තරාදි ගේන්ඩ පුළුවන් කියලා. මාත් හිතනවා ඒ වෙලාව සෑහෙනවා කියලා. තරාදි උසාවියට ආපු හැටියෙ වැඩේ පටන්ගනීවි.''

# 6

වර්ජිනියා බැක්ස්ටර්ගේ පසෙකින් සිටගෙන මේසන් ඇගේ කනට කොඳුළේය. "මම හැම දෙයක්ම කළේ ඔයා මට ඇත්ත කිව්වා කියලා හිතාගෙන. ඔයා මට බොරු කියලා තිබුණොතං, අපි දෙන්නාම කපෝතියි."

"මම ඔයාට බොරු කියලා නෑ, මිස්ට මේසන්."

"සාමාන්‍යයෙන් අත්අඩංගුවට ගැනීමක් කෙරෙද්දි පත්තරේක පලවෙන ඡායාරූපෙ ලොකුවට පේන තැනක තමයි දාන්නෙ. හිටපු නීති ලේකම්වරියට මත්ද්‍රව්‍ය ප්‍රවාහනය ගැන චෝදනා කියලා වගේ මාතෘකාවකුත් දානවා. ඒත් ඔයා නිදහස් වුණාට පස්සෙ ඒ ගැන වැටෙන්නෙ ඇතුල් පිටුවක පේළි කීපයක් විතරයි. මම දැන් ලෑස්ති කරලා තියෙන වැඩේ හැටියට, ඔයාගෙ නිදහස් වීම ගැනත් මුල් වතාවෙ වගේම ප්‍රසිද්ධියක් ලැබෙන්ඩ ඕනෙ. හැබැයි ඔයා බොරු කියලා තිබ්බොත් වැඩේ දෙල් තමයි."

"මිස්ට මේසන්, මම ඔයාට කියලා තියෙන්නෙ සම්පූර්ණ ඇත්ත. මොන එහෙකටද මම මත්ද්‍රව්‍ය වගේ දේවල්වලට පැටලෙන්නෙ?"

මදහසක් පෑ මේසන් කතා කළේය. "මම සාමාන්‍යයෙන් ඔය වගේ ප්‍රශ්නවලට උත්තර හොයන්නෙ නෑ. මම හිතනවා, "මේ කෙල්ල මගෙ ක්ලයන්ට්, එයා හරි වෙන්ඩ ඕනෙ." කියලා. ඒ සිතිවිල්ල අනුව මම ක්‍රියා කරනවා."

පිස්කල් නිලධාරියා සහ තවත් සහායකයින් දෙදෙනෙකු විසින් බිම තබා බර කිරනු ලබන විශාල තරාදියක් ඔසවාගෙන එන ලදී.

ඉන්පසු පිස්කල් නිලධාරියා විනිසුරුගේ නිල කාමරයට ගියේ වාර්තා කිරීම සඳහාය.

උසාවි කාමරයේ දොර විවෘත වී පුවත්පත් වාර්තාකරුවන් දුසිම් භාගයක් පමණ ඡායාරූප ශිල්පීන්ද සමග ඇතුලු විය.

එක් වාර්තාකරුවෙක් මේසන් වෙත අවතීර්ණ විය. "ඔබතුමායි ක්ලයන්ට්යි තරාදිය ගාව ෆොටෝ එකකට එනවාද?"

"මම එන්නෙ නෑ," මේසන් කීවේය. "මගෙ ක්ලයන්ට් ඒවි. හැබැයි උසාවිය කල්තබන වෙලාව වෙනකං හිටියොත්, තඩුකාර උන්නාන්සෙත් ෆොටෝ එකකට ගන්ඩ බැරිවෙන එකක් නෑ."

"ඇයි ඔබතුමා ෆොටෝ එකට එන්නෙ නැත්තෙ?" වාර්තාකරු ඇසුවේය.

"ඒක වෘත්තීය ආචාරධර්ම පද්ධතියට එකඟ නෑ." මේසන් කීවේය.

වාර්තාකරුගේ මුහුණ කෝපයෙන් රතු විය. "ඔන්න ඉතිං, ඕගොල්ලන්ගෙ නීතිඥ සංගමේ හැමතිස්සෙම කතා කරන්නෙ මහජන සම්බන්ධතා නැවුම්ව පවත්වා ගැනීම ගැන. ඒත් අවස්ථාවක් ලැබුණු හැටියෙ මොකක් හරි ආචාරධර්ම විකාරයක් කියලා මඟ අරිනවා. ඇයි ඕගොල්ලො තේරුං නොගන්නෙ, මහජනායා එක්ක සම්බන්ධ වෙන්ඩ තියෙන හොඳම විදිහ තමයි, පත්තර කියෝන මිනිස්සුන්ට පේන්ඩ ඉන්න එක කියලා?"

මද සිනහවක් පෑ මේසන් කතා කළේය. "පොඩ්ඩක් සන්සුන් වෙන්ඩ යාළුවා. තමුන් මගෙ ෆොටෝ එකක් ගත්තාට කමක් නෑ. ඒත් මට ෆොටෝ එකකට විරිත්තගෙන කැමරාව දිහා බලාගෙන ඉන්ඩ බෑ කියලයි මම කිව්වෙ. අන්න ඒකයි වෘත්තීය ආචාරධර්ම පද්ධතියට එකඟ නැත්තෙ. අනිත් එක, මොන එහෙකටද මම තමුසෙලාට කෝල් කරලා එන්ඩ කිව්වෙ කියලා හිතනවලාකො."

වාර්තාකරු මේසන් දෙස බැලූ අතර ඔහුගේ කෝපය මදහසක් සමග තුනී වී ගියේය. ''නඩුකාරයා සාක්ෂි කිරලා මනිනවා, එතකොට?''

''භෞතික සාක්ෂි විතරයි.'' මේසන් කීවේය.

''නියම නිවුස් එක,'' වාර්තාකරු කීවේය.

විනිසුරුගේ නිල කාමරයේ දොර විවෘත විය. ''සියලුදෙනා නැගී සිටින්න.'' පිස්කල් නිලධාරියා බෙරිහන් දුන්නේය.

පිරිස නැගී සිටි අතර විනිසුරු ඇල්බට් උසාවියට සම්ප්‍රාප්ත විය. තමා යන විට බොහෝ දුරට හිස්ව තිබූ විනිශ්චය ශාලාව මේ වන විට පුවත්පත් වාර්තාකරුවන්ගෙන් සහ නොයෙකුත් ආකාරයේ ප්‍රේක්ෂකයන්ගෙන් පිරී සිටීම පිළිබඳව ඔහුගේ මුහුණේ වූයේ කිසියම් විනෝදාත්මක විමතියකි.

''රජය එදිරිව වර්ජිනියා බැක්ස්ටර්,'' ඔහු කීවේය. ''අපි කවුරුත් ලෑස්තිද ඉදිරි වැඩ කටයුතුවලට?''

''සූදානම්, උතුමාණෙනි.'' කැස්වෙල් කීවේය.

''අපිත් සූදානම්, උතුමාණෙනි.'' මේසන් කීවේය.

පොලිස් නිලධාරී ජැක් ඇන්ඩෲස් සාක්ෂි කූඩුවේ සිටි අතර තරාදිය උසාවිය ඉදිරිපිටට පමුණුවා තිබිණි.

''පිස්කල් නිලධාරී මහතා සූදානම් ද?''

''එසේය, උතුමාණෙනි.''

''තරාදිය පරීක්ෂා කරලා බලන්ඩ, නිවැරදි කියවීම ලැබෙනවාද කියලා.''

පිස්කල් නිලධාරියා තරාදිය පරීක්ෂා කළේය.

''බොහොම හොඳයි, දැන් සූට් කේසය සහ කුඩා බෑගය තරාදියේ තබා බර බලන්ඩ.''

උසාවි ලිපිකරු ගමන් මලු දෙක තරාදිය මත තබා පසුපසට වූයේය.

''රාත්තල් හතලිස් හයයි, කාලයි, උතුමාණෙනි.'' පිස්කල් නිලධාරියා ප්‍රකාශ කළේය.

එක්වරම අධිකරණය තුළ ඇති වූයේ නිහඬතාවයකි. අනතුරුව කිසිවෙකු අත්පුඩි තැලුවේය.

විනිසුරු ඇල්බට් රවා බැලුවේය. "මෙතන කෝලං මඩුවක් කරන්ඩ ලෑස්ති වෙන්ඩ එපා." ඔහු අවවාදාත්මක හඬින් කීවේය. "විත්තිය සතුව ගමන් මලු සඳහා වන රෙසිට් පත තිබෙනවාද?"

"තිබෙනවා, උතුමාණෙනි." ලදු පත විනිසුරු අතට දෙමින් මේසන් කීවේය.

විනිසුරු ඇල්බට් නීතිපතිගේ සහකරු දෙස බැලුවේය. "ගමන් මලු වලින් ඉවතට ගත් ද්‍රව්‍යවල බර කොපමණ ද කියා තමා දන්නවා ද?"

"නැහැ උතුමාණෙනි." කැස්වෙල් කීවේය. "ජැක් ඇන්ඩෲස්ගේ සාක්ෂිය පරිදි ඒවායේ බර කිරා නැහැ."

"හරි, ඒවායෙත් බර බලන්ඩ." විනිසුරු ඇල්බට් කීවේය. "ඒවා උසාවියෙ තියෙනවාද?"

"එහෙමයි. උතුමාණෙනි."

පිස්කල් නිලධාරියා ගමන් මලු දෙක තරාදියෙන් ඉවත් කිරීමට සූදානම් විය.

මේසන් වහා කතා කළේය. "ගරු අධිකරණයේ අවසර ඇතිව, මා ඉල්ලා සිටිනවා, පැකට් පනහ මෙම ගමන් මලු මතම තබා බර කිරන ලෙසට. අනුව කෙතරම් ප්‍රමාණයකින් බර වැඩිවන්නේ ද යන්න අපිට දැනගත් හැකියි."

"අවසර ලැබෙනවා," විනිසුරු ඇල්බට් නියෝග කළේය. "ඒක ටිකක් නාට්‍යමය වෙන්ඩ පුළුවන්. නමුත් වඩාත් ලේසියි. විත්තියේ නීතිඥ මහතා ඉල්ලා සිටින ආකාරයට බර කිරමු."

පොලිස් නිලධාරී ජැක් ඇන්ඩෲස් ගමන් මල්ලක් තුළින් ප්ලාස්ටික් බඳුන් කිහිපයක් අතට ගෙන ඒවා තරාදිය මත වූ සූට් කේසය මතු පිට තැබුවේය.

තරාදියේ මාපකය ඉහළ ගියේය.

"රාත්තල් එකයි තුන් කාලකින් බර වැඩි වෙලා තියෙනවා, උතුමාණෙනි." පිස්කල් නිලධාරියා කීවේය.

විනිසුරු ඇල්බට් නීතිපති සහකරු දෙස බැලුවේය. "පැමිණිල්ලට මේ පිළිබඳව පැහැදිලි කිරීමක් තිබෙනවාද ?"

"නෑ, උතුමාණෙනි," කැස්වෙල් කීවේය. "විත්තිකාරියට අවස්ථාව තිබුණා, ගුවන් සේවය විසින් ගමන් මලුවල බර කිරා බැලුවාට පස්සෙ මෙම ද්‍රව්‍ය ඊට එකතු කරන්නට, වෙනත් අයෙකු එසේ කළා යයි කියනවා නම් ඇයටත් එය කරන්නට අවස්ථාව තිබුණා. කෙසේ උවත් මෙම ද්‍රව්‍ය හමු වුණේ ඇගේ ගමන් මල්ලේ තිබිලා. ඒ නිසා ඇය ඊට වගකිව යුතුයි."

"ඔය කියන තරං ලේසියෙන් විත්තිකාරියට ආගන්තුක යමක් එක්කරන්ඩ බෑ, ඇගේ ගමන් මලුවලට," විනිසුරු ඇල්බට් කීවේය. "ගමන් මලුවල බර කිරා බලන්නේ, මගියා ගුවන් යානයට ඇතුලු වීම සඳහා අදාල කොරිඩෝවට ඇතුලු වෙද්දී. ඊටපසුව මගියාට ගමන් මලු ලැබෙන්නෙ, ගුවන් යානය එහි ගමනාන්තයට ළඟා වූවාට පසුව. ඒ අනුව මෙම අධිකරණය තීරණය කරනවා, මෙම විත්තිකාරිය නිදෝස් කොට නිදහස් කරන බවට."

විනිසුරු ඇල්බට් නැගී සිටියේය. තව දුරටත් දොරවල් තුළින් කඩා විදින මහජනයා දෙස බලා ඔහු මද හසක් නැගුවේය. "උසාවිය අවසානයි."

පුවත්පත් වාර්තාකරුවෙක් ඉදිරියට පැන්නේය. "උතුමාණෙනි, තරාදිය ඉදිරිපිට ඡායාරූපයක් ගැනීම සඳහා ඔබතුමාගේ පැමිණීම අපි උදක්ම අපේක්ෂා කරනවා. මහජනයාට තොරතුරු දැනගැනීමේ අයිතිය වෙනුවෙනුයි මේ ඉල්ලීම කරන්නෙ."

විනිසුරු ඇල්බට් දෙගිඩියාවට පත්වූ සෙයක් පෙනුනි.

"විත්තියෙන් කිසිදු විරෝධතාවක් නෑ," මෙසන් හඬ නගා කීවේය.

විනිසුරුවරයා කැස්වෙල් දෙස බැලුවේය.

කැස්වෙල් ඔහුගේ බැල්ම මගඇරියේය.

විනිසුරු ඇල්බට් මදහසක් පෑවේය. "මහජනායාට තොරතුරු ලබාදීමේ අයිතිය ගැන කියනවා නම්, මම යෝජනා කරනවා, විත්තිකාරියත් තරාදිය ඉදිරිපිට සිටිය යුතුයි කියා. මේවා ඇගේ ගමන් මලු නිසා."

වාර්තාකරුවන් සහ ඡායාරූප ශිල්පීන් තරාදිය ඉදිරිපිට ලුහුසුළු විය.

"උසාවිය නඩුව ඇසීමෙන් පසු මේ ඡායාරූපය ගත් බවට වාර්තා කිරීමට වගබලාගන්ඩ ඕනෙ." විනිසුරු ඇල්බට් බරපතල හඬින් කීවේය. "සමහර විනිශ්චයකාරවරු අධිකරණය තුළ ඡායාරූප ගැනීමට විරුද්ධ වෙන බව මම දන්නවා. නමුත් මා ඒ ගැන විවෘත මනසකින් කටයුතු කිරීමට පුරුදු වෙලා තියෙනවා. කෙසේ හෝ, මා දන්නවා, මෙම විත්තිකාරිය අත්අඩංගුවට ගැනීමේදී ඒ පිළිබඳව විශාල ප්‍රසිද්ධියක් ලැබුණු බව. ඒ අනුව ඇගේ නිදහස් වීමටද ඒ හා සමාන ප්‍රසිද්ධියක් ලැබීම සාධාරණ බව මා කල්පනා කරනවා."

විනිසුරු ඇල්බට් බෙන්චියෙන් බැස තරාදිය අසලට යමින් විත්තිකාරියට ද තමා ළඟට පැමිණෙන ලෙස සන් කලේය.

දියෙන් ගොඩ දැමූ මාලුවෙකු මෙන් ගැහෙමින් සිට වර්ජිනියාව මේසන් විසින් තරාදිය අසලට කැටුව යන ලදී.

"මේසන්, එන්ඩ ෆොටෝ එකට." විනිසුරු ඇල්බට් ආරධානා කළේය.

"නෑ, උතුමාණෙනි, එතකොට ඒක ටිකක් ව්‍යාජයි වගේ පෙනේවි. ඒත් ඔබතුමා සාක්ෂි කිරලා මනින බව ෆොටෝ එකට වැටුනොත් ගොඩාක් වටිනවා." මේසන් කීවේය.

විනිසුරු ඇල්බට් හිස ඉහළ පහළ වනා වර්ජිනියා වෙත හැරුණේය. 'මිස් බැක්ස්ටර්, තරාදියෙ මාපාංකය දිහා බලන්ඩකො. මම තරාදිය පැත්තට නැමිලා ඉන්නං, හා, හා, කැමරාව දිහා බලන්ඩ එපා, පොඩ්ඩක් හැරෙන්ඩකො ඔයාගෙ හොඳම ඇන්ගල් එක කැමරාවට වට්ටගන්ඩ ඕනෙ නම්."

විනිසුරු ඇල්බට් ඇගේ උරහිසට අතක් තබමින් තරාදිය වෙත නැමුනේය. උද්යෝගයට පත් කැමරාකරුවෝ ඡායාරූප ලබාගත්හ.

කෙලින් වූ විනිසුරු ඇල්බට් මේසන් දෙස බලා ඉන්පසු කැස්වෙල්ටද හිසින් සංඥා කොට, නීතිවේදීන් දෙපල වාර්තාකරුවන්ගේ සවන් මානයෙන් ඔබ්බට කැඳවාගෙන ගියේය.

"මේ කේස් එකේ ලොකු අවුලක් තියෙනවා," විනිසුරු ඇල්බට් කීවේය. "මම නමුන්ට යෝජනා කරනවා, මිස්ට කැස්වෙල්

පොලිසියට ඔත්තුව දීපු කෙනා ගැන හොඳින් සොයලා බලන්ඩ කියලා.''

පැමිණිල්ලේ නීතිඥයා කතා කළේ නොරුස්නා හඬිනි. ''ඒ මනුස්සයා අපිට කවදාත් දුන්නෙ හරි තොරතුරු තමයි.''

''ඒත් මේ වතාවෙ දීපු ඔත්තුව වැරදියිනෙ,'' විනිසුරු ඇල්බට් කීවේය.

''මට ඒ ගැන ස්ථිර නෑ,'' කැස්වෙල් නොරුස්නා හඬින්ම කීවේය. ''මොනවා උනත්, මට විශ්වාසයි, බෑග්වලට මොනවා හරි කළා කියලා.''

''ඒවාට මොනවා හරි වුණා තමයි,'' විනිසුරු ඇල්බට්ද තරමක තද ස්වරයකින් කීවේය. ''හැබැයි ඒක වුණේ මේ ගෑනු මනුස්සයා බෑග් දෙකම එයාර්පෝට් එකට බාර දුන්නාට පස්සෙ. මගෙ කෙස් පැහුනෙ ඉඩෝරෙට නෙමෙයි. දවස ගානේ විත්තිකාරයො උසාවියට එනවා යනවා දැක්කහම, මටත් යම්කිසි දැනුමක් ඇතිවෙනවා මිනිස් ස්වභාවය ගැන. මේ තරුණ ළමයා බඩු ගෙනියන කෙනෙක් නෙමෙයි.''

''මේ පෙරී මේසන්ගෙ මැජික් වැඩ දැකලා මට තිත්ත වෙලා තියෙන්නෙ,'' කැස්වෙල් ද කෝපයෙන් කීවේය. ''මේ වගේ දේවල් නිතරම සිද්ධ වෙනකොට, නීතිය ක්‍රියාත්මක කරන ආයතන හැටියට අපිව කිසිකෙනෙක් ගණංගන්නෙ නැතුව යනවා.''

''එහෙමනං, නීතිය ක්‍රියාත්මක කරන ආයතන මීට වඩා කාර්‍යක්‍ෂම වෙන්ඩ ඕනෙ.'' විනිසුරු ඇල්බට් තදින් කීවේය. ''මේ තරුණ ළමයා අත්අඩංගුවට ගන්න වෙලාවෙ උන්දැව ෆොටෝ ගහන්ඩ කිසිම බාධාවක් තිබුණෙ නෑ. මම ප්‍රාර්ථනා කරන්නෙ ඒ වෙලාවෙ ඒ ළමයාට වෙච්ච නරක ප්‍රසිද්ධිය මේ සැරේ වෙච්ච දේවල් වලින් මැකිලා යන්ඩ කියලා.''

''ඒ ගැන වද වෙන්ඩ එපා,'' කැස්වෙල් නොරුස්නා හඬින් කීවේය. ''ඔය දැන් ගහපු ෆොටෝ ඇමරිකාව වටේටම යයි, තව ටිකක් වෙලා යනකොට.''

''එහෙම උනොත් හොඳයි.'' කියූ විනිසුරු ඇල්බට් නිල කාමරය වෙත පා නැගුවේය.

කැස්වෙල් පිටත්ව ගියේ මේසන් වෙත බැල්මක් හෝ නොහෙලමිනි.

මේසන් ඉක්මන් ගමනින් වර්ජිනියා වෙත ගියේය. ''අපි සාක්ෂිකාරයින්ගෙ කාමරේට යමුද?'' ඔහු ඇගෙන් ඇසුවේය. ''මට පොඩි වචනයක් දෙකක් ඔයා එක් කතා කරන්ඩ ඕනෙ.''

''හොඳයි මිස්ටර් මේසන්,'' ඇය කීවාය.

ඔහු ඈ සාක්ෂිකරුවන්ගේ කාමරයට කැඳවාගෙන ගොස් ඇයට ආසනයක් පිරිනැමුවේය. ''ඔයා හිතන්නෙ ඔයාට මේ වැඩේ කවුරු දුන්නා කියලාද?''

''මාව මේ වැඩේට අහු කලේ කවුරු කියලාද අහන්නෙ?'' ඇය ඇසුවාය.

''ඔව්.''

''දෙයියනේ, මම දන්නෙ නෑ.''

''ඔයාගෙ හස්බන්ඩ්?''

''එයා මගෙත් එක්ක ඔරොප්පුවෙන් තමයි ඉන්නෙ.''

''ඇයි?''

''මම එයාට ඩිවෝස් එක නොදුන්න නිසා.''

''ඇයි නොදුන්නෙ?''

''ඒ මිනිහා මහා වංචාකාර බොරුකාරයෙක්. මම හම යනකං වැඩකරද්දි අපේ පවුල ගොඩගන්ඩ කියලා, මේ මිනිහා මට බොරු කළා. ඒ මදිවාට අපි දෙන්නාගෙ ජොයින්ට් එකවුන්ට් එකටත් මේ මිනිහා ඇරලා දැම්මා, හොර ගෑනිට කාර් එකක් අරන් දෙන්ඩ. ඊටපස්සෙ මට කිව්වා, මිනිස්සුන්ට හැඟීම් පාලනය කරගන්ඩ බැරි අවස්ථාවල් එනවා, හොඳම දේ තමයි හැඟීම්වලට ඉඩ දෙන එක කියලා.''

''මේක වෙලා කොච්චර කල් ද?''

''අවුරුද්දක් විතර.''

''එතකොට ඔයා, එයාට නිදහසක් දුන්නෙ නෑ?''

''නෑ.''

''ඒ කියන්නෙ ඔයා තාම කසාද බැඳලා?''

''ඔව්.''

''ඔයා එයාව අන්තිමට දැකලා කොච්චර කල් වෙනවා ද?''

''අපි රන්ඩු උනාට පස්සෙ දැක්කෙ නෑ. ඒත් සතියකට දෙකකට සැරයක් කතා කරලා අහනවා, මගෙ හිත වෙනස් කරගත්තාද කියලා.''

''ඇයි ඔයා හිත වෙනස් කරගත්තෙ නැත්තෙ?'' මේසන් ඇසුවේය.

''මම උන් දෙන්නාට එහෙම ලේසියෙන් ඕනෙ ඕනෙ දේවල් කරගන්ඩ දෙන්ඩ ලෑස්ති නැති හින්දා.''

''හොඳයි, අපි කියමුකො ඔයා දිගටම ඒ මනුස්සයාට බැඳිලා ඉන්නවා කියලා.'' මේසන් කීවේය. ''ඒකෙන' ඔයාට තියෙන ප්‍රයෝජනේ මොකද්ද?''

''මට කිසි ප්‍රයෝජනයක් නෑ, ඒත් උන් දෙන්නාට උන්ට ඕන දේ කරගන්ඩ හම්බවෙන්නෙ නෑනෙ.''

''ඒ කියන්නෙ, ඒ දෙන්නාට කසාද නොබැඳ ඉන්ඩ සිද්ද වීම ඔයාට ජයග්‍රහනයක් කියලා ද හිතන්නෙ? ඒ විහටද ඔයාට හිතෙන්නෙ?''

''ඒ වගේ දෙයක් තමයි.''

මේසන් ඈ දෙස තදින් බැලුවේය. ''ඔයාට ඇත්තටම හිතන්ඩ ඕනෙත් ඒ විදිහටද?''

''මට ද? ...මට පුළුවන්නං ඒකිගෙ ඇස් උගුල්ලනවා. මට පුළුවන් හැම විදිහකින්ම මම ඒකිට රිද්දනවා.''

මේසන් හිස දෙපසට වැනුවේය. ''ඒක තේරුමක් නැති වැඩක්, වර්ජිනියා. ඒ මනුස්සයාට කෝල් එකක් දීලා කියන්ඩ, ඔයා එයාට ඩිවෝස් එක දෙන්ඩ තීරණය කළා කියලා. ඔයාගෙ ආගමෙන් ඒකට ප්‍රශ්නයක් නෑ නේද?''

''නෑ.''

''දරුවො ඉන්නවාද?''

"නෑ."

"ඒකනෙ, ඔයාට අනාගතයක් තියෙනවා."

"මට...මට..."

"ඔයාට කවුරුහරි ළඟකදි මුණගැහුනාද ඔයාට කැමැත්තක් ඇතිවුණු?"

"මට ගොඩාක් පිරිමි මුණගැහිලා තියෙනවා, ඒත් මට දූන් පිරිමි තිත්තයි."

"නමුත් කිසියම් විශේෂ කෙනෙක් මුණගැහිලා තියෙනවා?"

ඇය හඬනගා සිනහසුනාය. "මගෙන් හරස් ප්‍රශ්න අහන්ඩ ඕනෙ ද?"

"ජීවිතේ එක පාරක් වැරදුනහම," මේසන් කීවේය. "කෙනෙකුට කරන්ඩ තියෙන හොඳම දේ තමයි, ඒක නිවැරදි කරලා ඊට පස්සෙ ඒ ගැන වද නොවී ඉන්න එක. ඔයාට යම්කිසි කෙනෙක් උගුලක් ඇටෙව්වා. ඔයා ඒ උගුලෙන් මේ වතාවට බේරුණා. ඒත් ඒ උගුල අටෝපු කෙනා කවුරු වුණත්, එයාට හොඳ මොළේකුයි පාතාල සම්බන්ධතාවයකුයි තියෙනවා. ඔයාගෙ නම කැත කරන්ඩයි ඒ කාට වුණත් ඕනෙ. ඔයාගෙ හස්බන්ඩ්ව සම්පූර්ණ චිත්‍රයෙන්ම අයින් කරන්ඩ ඕනෙ කියලා මම හිතුවෙ ඒකයි. එයා සම්බන්ධකං පවත්වන ගෑනු කෙනා කොයි වගේ කෙනෙක් ද?"

"මම උන්දූ ගැන මෙලෝ දෙයක් දන්නෙ නෑ."

"මෙන්න මේකයි මගෙ උපදේශය," මේසන් කීවේය. 'ද්වේශසහගත හැරයාමක් කියලා දික්කසාද නඩුවක් ෆයිල් කරන්ඩ. ඒ අතර වාරෙ අනිත් ගෑනු කෙනාගෙ නම කිසි දේකට ගාවන්ඩ එපා. ඒ අතර වාරෙ මොනවාහරි අමුතු දෙයක්, ඒ කියන්නේ, සැකකටයුතු දෙයක් හරි, අසාමාන්‍ය දෙයක් හරි සිද්ද වුණොත් වහාම මට කෝල් කරන්ඩ. දැන් ඉතින් ඔයාට යන්ඩ නිදහස තියෙනවා."

"එතකොට ගාස්තුව?"

"සල්ලි තියෙන වෙලාවක මට ඩොලර් සීයක චෙක් එකක් එවන්ඩ. ඒත් ඒ ගැන හිත කරදරකරගන්ඩ එපා."

# 7

පසුදා පුවත්පත්හි විනිසුරුගේ සාක්ෂි කිරා මැනීම පිළිබඳව සෑහෙන ප්‍රසිද්ධියක් ලැබී තිබිණි.

වර්ජිනියා බැක්ස්ටර් පුවත්පත් කියැවීමට පටන්ගත්තේ සවස් කාලයේදීය. තමාගේ නිදහස්වීමටද ඒ තුළින් විශාල ප්‍රසිද්ධියක් ලැබී ඇති බව ඇය තේරුම් ගත්තාය.

එක් පුවත්පත් වාර්තාකරුවෙකු කාව්‍යමය ආකාරයකින් ලියා තිබුණේ, නීති ලිපිකාරිණියක වූ වර්ජිනියා බැක්ස්ටර් ඇගේ වෘත්තීය ජීවිතය තුළදී තමාටද මතු දිනක නඩුවකට මුහුණදීමට සිදුවන්නට ඇතැයි සිතන්නට නැති බවය.

නමුත් ඇය ත්‍රස්තවූයේ ඊළඟ පුවත්පත් වාර්තාව කියවාගෙන යද්දීය.

වාර්තාකරු කිසියම් පසුබිම් තොරතුරු ගවේශනයක යෙදී ඇති බව පෙනුනු අතර ඔහු ලියා තිබුණේ, කොල්ටන් බැක්ස්ටර් හෙවත් වර්ජිනියාගෙන් වෙන්ව සිටින ඇගේ ස්වාමිපුරුෂයා, වර්ජිනියා ගමන්කර තිබූ ගුවන්සේවයේම සේවය කරන්නෙකු බව වාර්තාකරු විසින් සොයාගෙන ඇති බවය. ඔහුගෙන් කිසියම් ප්‍රකාශයක් ඒ සඳහා ලබාගැනීමට පුවත්පත් වාර්තාකරු උත්සාහ කොට තිබුණ ද, ඔහු දුරකතනයට සම්බන්ධකොට ගැනීමට නොහැකිවී ඇත.

වර්ජිනියාගේ අත ඉබේටම මෙන් දුරකතනය වෙත ගිය අතර මේසන්ගේ කාර්යාලයට කතා කිරීමට ප්‍රමාද වූවා වැඩි යයි සිතා ඇය

රිසිවරය නැවත ආපසු තැබීමට සූදානම් වන විටම ඩෙලා ස්ට්‍රීට්ගේ හඬ අනිත් අන්තයෙන් ඇසුනි.

''අනේ, සොරි, මම වර්ජිනියා බැක්ස්ටර්, මට තේරුනේ නෑ ගොඩක් සවස් වෙලා කියලා. මම මේ පත්තරේ කියෝපු හැටියෙ මිස්ට මේසන්ට කෝල කරන්ඩ කියලා හිතුවෙ.''

''ඔහොම ඉන්ඩ, මිස් බැක්ස්ටර්,'' ඩෙලා ස්ට්‍රීට් කීවාය. ''මම මිස්ට මේසන්ව ඔයාට සම්බන්ධ කරන්නං.''

''හලෝ, වර්ජිනියා,'' මේසන්ගේ හඬ රිසිවරය ඔස්සෙ ගලා ආවේය. ''ඔයාගෙ හස්බන්ඩ ගැන පොඩි විස්තරයක් එක රිපෝටර් කෙනෙක් හොයාගෙන නේද?''

''ඔව්, ඔව්, මිස්ට මේසන්, දැන් ඉතින් හැම දෙයක්ම පැහැදිලියි. කොල්ටන් බැලුවෙ, මාව පොලිසියට අල්ලලා දීලා, අපි බැඳපු දවසෙ ඉඳලාම මම හොර ජාවාරංකාරියක් කියලා පෙන්නලා, දික්කසාදෙ ගන්ඩ.''

''ඔයාට දැන් මොකද්ද කරගන්ඩ ඕනෙ?'' මේසන් ඇසුවේය.

''මට ඕනෙ ඒ යකාව ඇරෙස්ට් කරවන්ඩ.''

''ඔප්පුකිරීමක් නැතිව කොහොමද එයාව ඇරෙස්ට් කරන්නෙ? '' මේසන් ඇසුවේය. ''ඔයාට තියෙන්නෙ අනුමානයක් විතරයි.''

''ඔප්පු කරන්ඩ තරං සාක්ෂි එකතුකරවගන්ඩ කොච්චර විතර වියදං වෙයිද?'

''ඔයාට ඒකට ප්‍රයිවෙට් ඩිටෙක්ටිව් කෙනෙක් අල්ලගන්ඩ වේවි. අඩුම ගානෙ දවසකට ඩොලර් පනහක්වත් ඒ අය අය කරනවා. ඒත් අන්තිමට අනුමානය ඇරුනම වෙනත් ප්‍රබල සාක්ෂියක් නොලැබී යන්ඩත් ඉඩ තියෙනවා.''

''මම කොහොම හරි සල්ලි ටිකක් හොයා ගන්නං....මට ඕනෙ මේ මිනිහාව කොහොම හරි අල්ලගන්ඩ...''

''මගෙන් නං ඒ වැඩේ බලාපොරොත්තු වෙන්ඩ එපා.'' මේසන් බාධා කරමින් කීවේය. ''මගෙ සේවාදායිකාවක් හැටියට ඔයාට ඒ මුදල වියදම් කරන්ඩ කියලා මට උපදෙස් දෙන්ඩ බෑ. මොකද, ඔයා සාක්ෂි හොයාගත්තත්, දැනට ඔයා ඉන්න තත්ත්වෙට

වඩා වෙනසක් වෙන්නෙ නෑ. ඒ කියන්නෙ, ඔයාට දික්කසාදය සඳහා හොඳ පදනමක් තියෙනවා කියන එක විතරයි. ඒ නිසා ඒ මනුස්සයාට දික්කසාද කරලා දාලා, අත හෝදගන්ඩ.''

''මම කැමති නෑ, උන්දූට ඒ සතුට ලබාදෙන්ඩ.''

''ඇයි ඒ?''

''මුල ඉඳලාම එයාට ඕනෙ වෙලා තිබ්බෙ ඒක නිසා.''

''ඒකෙන් ඔයාට හොඳක් වෙන්නෙ නෑ.'' මේසන් කීවේය. ''සමහරවිට ඔයා දූනට කරනවා ඇත්තෙ, ඒ මනුස්සයාට හරියටම ඕනෙ කරනදේ වෙන්ඩත් පුළුවන්.''

''ඒ මොකද්ද ඒ කතාවෙ තේරුම?''

''මෙහෙම හිතන්ඩ,'' මේසන් කීවේය. ''ඔයාගෙ හස්බන්ඩට වෙනත් අනියම් බිරියක් ඉන්නවා කියමුකො. දූනට හස්බන්ඩ ඒ ගෑනු කෙනාට කිය කියා ඇත්තෙ ඔයා ඩිවෝස් එක දෙනකං එයාට ඒ ගෑනිව කසාද බඳින්ඩ විදිහක් නෑ කියලා. කවුද දන්නෙ, ඔයාගෙ හස්බන්ඩ්ට ඇත්තටම ඒ ගෑනිව බඳින්ඩ උවමනාවක් තියෙනවාද කියලා ? ඔයා දික්කසාදය දුන්නොත් හස්බන්ඩ්ට සිද්ධම වෙනවා අර ගෑනිව බැඳගන්ඩ.''

''මම ඒ ගැන ඒ විදිහට හිතලාම නෑ.'' වර්ජිනියා කීවාය. ''එහෙමනං ඇයි එයා මගෙ බෑග්වලට මත්ද්‍රව්‍ය දැම්මෙ?''

''ඔයාව අපකීර්තියට පත්කරන්ඩ.'' මේසන් කීවේය. ''ඔයාගෙ කසාදය බිඳිලා ගියේ වෛරය නිසා. ඉතින් පළිගැනීමේ චේතනාවක් ඇතිවෙන්ඩ පුළුවන්. කොහොමහරි, පහුගිය දේවල් ගැන හිතලා වැඩක් නෑ. අනාගතේ ගැන හිතන්ඩ.''

''හොඳයි, මම රෑට කල්පනා කරලා බලලා, මිස්ට මේසන්ට හෙට උදේට කෝල් එකක් දෙන්නං.''

''ඔව්, ඒක හොඳයි,'' මේසන් කීවේය. ''දූන් ඔයා නිදහස් වෙලා ඉවරයි. මේ ප්‍රශ්න වලින් සදහටම මිදෙන්ඩ බලන්ඩ.''

ඇය රිසිවරය ආපසු තබා මද වේලාවක් යනවිටම දොර සීනුව නාද විය. ඇය අඟල් කිහිපයක් දොර විවෘත කර බැලුවාය.

දොරකඩ සිටගෙන සිටි මිනිසා වයස හතළිස් ගණනක අයෙකු වූ අතර කැරලි ගැසුනු, කලු හිස කෙස් සහ උඩු රවුලක්ද ඇති අයෙකු වූ අතර ඔහුගේ දෑස දීප්තිමත් කලු පැහැයෙන් යුක්ත විය.

''ඔයා මිසිස් බැක්ස්ටර් ද?'' මිනිසා ඇසුවේය.

''ඔව්.''

''මට බොහොම කණගාටුයි මේ වගේ වෙලාවක කරදරකරන්ඩ වීම ගැන, මිසිස් බැක්ස්ටර්. ඒත් මම ආවෙ සෑහෙන වැදගත් වැඩකට.''

''මොකද්ද වැඩේ?'' ඇය තවදුරටත් දොරෙහි දම්වැල නොගලවාම ඇසුවාය.

''මගෙ නම ජෝජ් මෙනාඩ්.'' මිනිසා කීවේය. ''ඔයා ගැන මම පත්තරෙන් කියෙව්වා. අනවශ්‍ය දෙයක් ගැන මම මතක් කරනවා නෙමෙයි. ඒත් ඔයාගෙ විස්තර ගොඩාක් පත්තරවල තිබුණා.''

''ඉතින්?''

''මම දැක්කා, ඩෙලානෝ බැනොක් කියන නීතිඥයා ජීවත්වෙලා ඉන්න කාලෙ ඔයා එයාගෙ සෙකට්‍රි හැටියට වැඩකරලා තිබ්බා කියලා.''

''ඒක හරි,''

''මම දන්න විදිහට අවුරුදු කීපෙකට කලින් මිස්ටර් ඩෙලානෝ බැනොක් අභාවප්‍රාප්ත වුණා?''

''ඒකත් හරි.''

''මට දැනගන්ඩ උවමනා කරලා තියෙන්නෙ, එයාගෙ ලියකියවිලි වලට මොකද වුණේ කියලා.''

''ඇයි?''

''ඇත්තම කියනවානං, මට එක කඩදාසියක් උවමනා කරලා තියෙනවා.''

''මොන විදිහේ කඩදාසියක්ද?''

''මිස්ටර් බැනොක් මට පිළියෙල කරලා දීපු ඇග්‍රිමන්ට් එකක කාබන් කොපියක්. මගෙ ළඟ තිබ්බ ඔරිජිනල් එක නැතිවෙලා. ගිවිසුමේ අනිත් පාර්ශවය මගෙ ඔරිජිනල් එක නැති වෙලා කියලා

දැනගන්නවාට මම කැමති නෑ. ඒ නිසා කාබන් කොපිය මට හොයාගන්ඩ පුළුවන්නං, ඒක ලොකු දෙයක්.''

ඇය හිස දෙපසට වැනුවාය. ''බොහොම කණගාටුයි, මට ඒගැන කරන්ඩ දෙයක් නෑ.''

''මිස්'ට බැනොක් මැරෙණකොටත් ඔයා එයාගෙ සෙකට්‍රි හැටියට නේද වැඩ කළේ?''

''ඔව්.''

''ඔෆිස් එකේ ලී බඩුවලට මොකද වුණේ?''

''ඔෆිස් එක වහලා දැම්මානෙ. දේපොලින් තවදුරටත් කුලියක් ගෙවන එකේ තේරුමක් තිබුණෙ නැතෙ.''

''ඒත් ඔෆිස් එකේ බඩුමුට්ටුවලට මොකද කළේ?''

''මං හිතන්නෙ, ඒවා වික්කා.''

මිනිසා ඔරවාගත්තේය. ''කවුද ඒවා ගත්තෙ කියලා දන්නවා ද? මං කියන්නෙ, ෆයිල් කැබිනට්, ලියන මේස වගේ ඒවා?''

''ඒවා වික්කෙ පරණ බඩු ගන්න වෙළෙන්දෙකුට.''

''ෆයිල් කැබිනට් ටිකත්?''

''ඔක්කොම බඩු.''

''පරණ කඩදාසිවලට මොකද කළේ?'

'ඒවා විනාශකරලා දාන්ඩ ඇති-පොඩ්ඩක් ඉන්ඩ, පොඩ්ඩක් ඉන්ඩ, මට මතකයි එයාගෙ සහෝදරයාට ඒ කඩදාසි තියාගන්ඩ කියලා මම කිව්වා. ෆයිල් කැබිනට් ටික, මං කියන්නෙ.''

''සහෝදරයා?''

''ඔව්, ජුලියන් බැනොක්. එයා තමයි හිටපු එකම උරුමකාරයා. වෙන නෑදෑයො කවුරුවත් මිස්ට බැනොක්ට හිටියෙ නෑ. දේපොල කියලා ඉතුරු උනේ මහා ලොකු දේකුත් නෙමෙයි. ඩෙලානෝ බැනොක් කිසි දවසක කසාද බැන්දෙ නෑ. එයා මුළු කාලෙම වෘත්තියට තමයි කැප කළේ. ලොකු ගාස්තු අය කළේ නෑ. ඒ නිසා ලොකු මුදලක් මැරෙනකොට ඉතුරුකරලා තිබුණෙත් නෑ.''

''එතකොට එයාට අය වෙන්ඩ තිබ්බ ගාස්තුවලට මොකද වුණේ?''

''මම දන්නෙ නෑ. ඒත් අය විය යුතු මුදල් ගොඩාක් වෙලාවට දේපොලට එකතු වෙනවා අඩුයිනෙ.''

''එතකොට ජූලියන් බැනොක්ව මම හොයාගන්නෙ කොහොමද?''

''මම දන්නෙ නෑ.'' ඇය කීවාය.

''එයා පදිංචි වෙලා හිටියෙ කොහෙද කියලා ඔයා දන්නවා ද?''

''සැන් ජේකින් වැලිවල කොහෙ හරි.''

''හරියටම කොතනද කියලා ඔයාට හොයලා බලන්ඩ බැරි ද?''

''සමහරවිට පුළුවන් වේවි.''

වර්ජිනියා මේ වන තුරු මිනිසාගේ ස්වභාවය අධ්‍යයනය කරමින් පසු වූවාය. ඒ අනුව ඇය සෑහීමකට පත්වූයෙන් දොරෙහි දම්වැල ගැලවූවාය. ''ඇතුළට එනවාද?'' ඇය ආරධනා කළාය. ''මට සමහරවිට පරණ ඩයරිවල බැලුවොත් හොයා ගන්ඩ පුළුවන් වේවි. මිස්ට බැනොක් මැරෙනකොට මම ගොඩාක් දේවල් ඩයරිවල ලියලා තිබ්බා. ආ, හරි මට මතක් උනා. මිස්ට ජූලියන් බැනොක් හිටියෙ බේකර්ස්ෆීල්ඩ්වල.''

''එයා තාම එහෙ පදිංචිද කියලා ඔයා දන්නවා ද?''

''නෑ, මම දන්නෙ නෑ. මම මිස්ට ජූලියන් බැනොක්ට කෝල් කරහම එයා පික්අප් එකක් අරගෙන ආවා. ෆයිල් කැබිනට් ටික පික්අප් එකට පැටෙව්වහම, මගේ වගකීම ඉවර බවක් මට දැනුනා. මම යතුරුත් එයාටම බාරදුන්නා.''

''බේකර්ස්ෆීල්ඩ්?''මේනාඩ් ඇසුවේය.

''ඔව්. ඔයා මට ඔයාගෙ ඇග්‍රීමන්ට් එක ගැන විස්තර ටිකක් කිව්වොත් මට ඒක ගැන මතක් වෙන්ඩත් ඉඩ තියෙනවා. සේරම ටයිපිං වැඩ කළේ මම තමයි.''

''ඒක ස්මිත් කියලා කෙනෙක් එක්ක ගහපු ඇග්රිමන්ට් එකක්.''

''මොන විදිහේ කාරණාවක් ගැන ද?''

''ඒක මේ මැෂින් වගයක් ගැන ගහපු ඇග්රිමන්ට් එකක්. ඒ කාලෙ මම මැෂින් බිස්නස් එකකට බහින්ඩ හිතාගෙන හිටියෙ. පස්සෙ ඒ අදහස අත්ඇරියා. කොහොම හරි ඒක ටිකක් දිග කතාවක්.''

''දැන් ඔයා මොනවද කරන්නෙ?'' ඇය ඇසුවාය.

මෙනාඩ්ගේ දෑස ඇගේ බැල්ම මගහැරියේය. ''මම ඔය බයිං ඇන්ඩ් සෙලිං තමයි කරන්නෙ.''

''දේපොල වෙළඳාම් ද?''

''ඔය ඕනෙ දෙයක්.''

''ඔයා මේ සිටි එකේමද පදිංචි?''

ඔහු සිනහවක් පිටකළේ අපහසුවට පත්වූ බවක් පලකරමිනි. ''එහෙම කියලා නෑ,'' ඔහු කීවේය. ''මම නිතරම තැන් තැන් වල යනවා. බිස්නස් වැඩවලට.''

''එහෙමනම්, මීට වඩා උදව්වක් කරන්ඩ බැරි එක ගැන මට කණගාටුයි,'' කියමින් වර්ජිනියා දොර වෙතට ලං වූවාය.

මෙනාඩ් සංඥාව තේරුම්ගත් අතර ඔහු ද දොර වෙත ගමන් කළේය. ''එහෙමනං, මම යන්නං.'' කියූ ඔහු පිටවී ගියේය.

ඔහු විදුලි සෝපානයට ගොඩවන අයුරු ද සෝපානයේ විදුලි බල්බ තුළින් එය පහළට ගමන් කරනු ද වර්ජිනියා බලා සිටියාය.

ඔහු වේගයෙන් ඇවිදගොස් මෝටර් රථයකට නගින අයුරු යන්තමින් ජනේලය තුළින් දැකීමට වර්ජිනියා සමත් වූවාය. මෝටර් රිය නවතා තිබුණේ පදික වේදිකාව අසල වූ එකම ඉඩකඩෙහි හෙවත් ගිනි නිවන හමුදාව විසින් ජලය ලබා ගැනීමට ඇවැසි වූ විට භාවිතා කරනු ලබන ජල කරාමය අසලය.

වර්ජිනියා රියෙහි නොම්මරය ලබා ගැනීමට උත්සාහ කළ ද ඇයට එය පූර්ණ වශයෙන් ඉටුකරගැනීමට නොහැකි වූයේ

රියදුරා විසින් ඉතාමත්ම වේගයෙන් රථය මාර්ගයට අවතීර්ණ කොට පදවාගෙන ගිය නිසාය.

නමුත් නොම්මරයේ මුල් අංකය බින්දුව බව ඇය ස්ථිරව දුටු අතර අවසන් අංකය දෙක යයි ඇයට යන්තමින් හැඟිනි.

මෝටර් රථයේ වර්ගය ඕල්ඩ්ස්මොබයිල් යයි ඇයට සිතුනු නමුත් එය ද ස්ථිර නොවීය. රථය වසර තුනක් හෝ හතරක් පැරණි වීමට ඉඩ තිබේ.

වර්ජිනියා ඇගේ පැරණි දිනපොත් තොගය සොයාගෙන එකින් එක පිටු පෙරලන්නට වූවාය. ජූලියන් බැනොක්ගේ ලිපිනය ඇයට හමු වූ අතර එය ඇගේ මතකයේ තිබුණු පරිදිම බේකර්ස්ෆීල්ඩ්හි ලිපිනයක් විය. දුරකතන අංකයක් නැති බව දිනපොතේ සටහන් කොට තිබිණි.

එවිටම දුරකතනය නාද විය. ''මම ඔයාගෙ නොම්මරේ ඩිරෙක්ටරි එකෙන් හොයා ගත්තෙ,'' කාන්තා හඬකින් කියැවිනි. ''මම ඔයාට සුභපතනවා කොහොම හරි අර ජරා තඩුවෙන් බේරුනු එක ගැන.''

''තැන්ක් යූ,'' වර්ජිනියා කීවාය.

''ඔයා මාව අඳුනන්නෙ නැති උනාත් මම කතා කලේ මගෙ හිතට දැනෙන දේ කියන්ඩ ඕනෙ නිසයි.'' කාන්තාව කීවාය.

ඉන් පසු එකකට එකක් බැගින් දුරකතන ඇමතුම් ලැබෙන්නට වූ අතර බොහෝ දෙනෙකුට අවශ්‍ය වී තිබුණේ පුවත්පත්වල තිබුණාට වඩා තොරතුරු දැනගැනීමටය.

අවසානයේ නාද වන දුරකතනය සිතින් ඉවත් කර දැමූ වර්ජිනියා රාත්‍රී ආහාරය ගැනීම සඳහා පිටතට ගියාය.

පසුදා උදෑසන දුරකතන සමාගමට කතා කළ ඇය, දුරකතනය අංකය වෙනස්කොට, නාමාවලියට ඇතුළත් නොවූ නව අංකයක් ලබාගත්තාය.

# 8

ලියකියවිලි පිළිබඳ ප්‍රශ්නය තමාට ලෙහෙසියෙන් අමතක කළ නොහැකි බව වර්ජිනියාට වැටහුනි.

ජුලියන් බැන්ක් ගව ගොවිපොල හිමියෙකු බවත් ඔහු සිය සහෝදරයා සමග එතරම් කිට්ටු බැඳීමක් තිබූ අයෙකු නොවන බවත් දේපොල සියල්ල හැකි ඉක්මනින් විකුණාදමා මුදල් කරගැනීම ඔහුගේ අභිප්‍රාය වූ බවත් ඇයට සිහිපත් විය.

ජෝජ් මැනාඩ්ගේ ස්වභාවය ද ඈ තුළ ඇතිකොට තිබුණේ සැකයකි. ඔහු හොඳින් හැසිරුන ද, තමා ඔහුගෙන් ඔහුගේ වතගොත විමසද්දී ඔහු බොරු කිවූ බව ඇයට සහතික විය.

කෙසේ වුවද, ලිපි ගොනු සම්බන්ධව තමාට වගකීමක් ඇති බව ඇයට හැඟිනි.

දුරකතන සමාගමට කතා කොට ජුලියන් බැනොක් හට ඇමතුමක් ගැනීමට ඇය උත්සාහ කළ ද, තවමත් ඔහුට දුරකතනයක් නැති බව ඇයට දැනුම් දෙනු ලැබිණි.

සියල්ල අමතකකර දැමීමට ඇය උත්සාහ කළ ද ඇයට ඊට හැකියාවක් නොවීය. ජෝජ් මෙනාඩ් කිසියම් තුල්සූත්තරයක් ඇටවීමට දත කන බව ඇගේ සිත කීවේය.

ඔහුගේ රථයේ ලියාපදිංචි අංකය සොයා ගැනීමට ඇයට උවමනා වුවද, පෙරී මේසන්ට කතා නොකොට එය ඉටුකරගන්නෙ

කෙසේ දැයි ඇයට අවබෝධයක් නොවීය. පෙරී මේසන්ට තවත් කරදරකිරීමේ සිතක් ද ඇයට නොවුණි.

බේකර්ස්ෆීල්ඩ් වෙත මෝටර් රථයෙන් ගොස් ජූලියන් බැනොක් සමග කතා කළ යුතු යැයි ඇය තීරණය කළාය.

දිවා කාලයේ බේකර්ස්ෆීල්ඩ් වෙත ගිය ඇය මග සලකුණු විමසීමේදී ජූලියන් බැනොක් පදිංචිව සිටින්නේ නගරයෙන් සැතපුම් දහයක් ඈතින් බව දැනගත්තාය.

ඇය ඔහුගේ ගොවිපොල සොයා ගත් අතර ධාන්‍ය ගබඩාවක්, මඩු කිහිපයක් සහ අතරින් පතර දමා තිබූ ට්‍රැක්ටර් සහ ගොවි උපකරණ ඇති ස්ථානයකට පැමිණියාය.

මෝටර් රිය වෙත බල්ලෙක් බුරාගෙන ආ අතර ජූලියන් බැන්ක් දොරකඩින් මතුවිය.

''හලෝ,'' ඔහු කීවේය.

'හලෝ, මම වර්ජීනියා බැක්ස්ටර්. මම ඔයාගෙ සහෝදරයාගෙ සෙකට්‍රි වෙලා හිටියා.'' වර්ජීනියා කීවාය.

''ආ, හරි, හරි,'' ජූලියන් බැනොක් කීවේය. ඔහුගේ ස්වරය මිත්‍රශීලී විය. ''මට හිතුනා මම ඔයාව මීට කලින් දැකලා තියෙනවා කියලා. මම එහෙමනං ඔයාට උදේ කෑම ලෑස්ති කරන්නං.''

''අනේ ලොකු දෙයක්,'' ඇය කීවාය. ''ඒත් මම ආවෙ පොඩි කාරණාවක් කතා කරගන්ඩ.''

''මොකද්ද?''

''අර ෆයිලිං කේසස්,' ඇය කීවාය. ''ඒවා ඔයා කොහෙද දාලා තියෙන්නෙ?''

''මම ඒවා ටික කාලෙකට කලින් වික්කනෙ.''

''එතකොට ෆයිල් ටික?''

''කැබිනට් ගත්ත හාදයාට මම ඒවාත් අරං යන්ඩ කිව්වා. ඒවාට මීයො එන්ඩ ගන්නවානෙ. ඒත් මිනිහා ඒවා අරගෙන ගියේ නෑ, කැබනට්වල බර වැඩිවෙනවා කියලා.''

''ඉතිං, ෆයිල් ටික දැන් කෝ?''

"මම ඒවා එකට තියලා බන්ඩල්, බන්ඩල් ගැටගහලා මුල්ලකට දැම්මා."

"මට පුළුවන්ද ඒවා ටිකක් බලන්ඩ?"

"ඔයාත් ඒවා ගැන හොයන එක පුදුමයි," ඔහු කීවේය. "මොකද ඊයෙ එක මනුස්සයෙක් ආවා ඔය ෆයිල් ගැනම අහගෙන."

"මෙහාට ආවා?"

"ඔව්."

"අවුරුදු හතළිස් පහක විතර කෙනෙක්ද?" ඇය ඇසුවාය. "කලුම කලු ඇස් දෙකක් තියෙන, උඩු රවුලක් තියෙන-"

"නෑ," ජුලියන් අතක් ඔසවමින් කීවේය. "මේ මනුස්සයා අවුරුදු පනස්ගානක විතර හාදයෙක්, නිල්පාට ඇස් දෙකක් තිබ්බෙ. මිනිහගෙ නම් ස්මිත් කියලා කිව්වෙ. මොකක් හරි ඇග්‍රීමන්ට් එකක කොපියක් ඕනෙ වෙලා තිබ්බෙ."

"ඉතින් ඔයා මොනවාද කිව්වෙ?" ඇය ඇසුවාය.

"මම ලියකියවිලි තියෙන තැන මිනිහාට කිව්වා. මටත් වැඩ තිබුණු නිසා එයාටම ඕනෙ දෙයක් හොයාගන්ඩ කියලා මං කිව්වා. සෑහෙන්ඩ හොඳ හාදයෙක් බවයි පෙනුනෙ."

"එයාට ඕනෙ කරපු ලියකියවිලි හම්බවෙලා තිබ්බා ද?"

ජුලියන් බැනොක් හිස දෙපසට වැනුවේය. "එයා කිව්වා, එයාට ඒවා හොයාගන්ඩ බැරි තරමට සංකීර්ණයි කියලා. මගෙන් ඇහුවා ෆයිල් කරලා තියෙන සිස්ටම් එක ගැන මොනවා හරි දන්නව ද කියලා."

"ඒවා ෆයිල් කරලා තියෙන්නෙ, නොම්මර පිළිවෙලකට අනුව," වර්ජිනියා කීවාය. "නොම්මර එකේ ඉඳලා දාහ වෙනකං පුද්ගලික ලිපි ගනු දෙනු. නොම්මර දාහෙ ඉඳලා තුන්දාහ වෙනකං කොන්තරාත්. තුන්දාහෙ ඉඳලා පන්දාහ වෙනකං බලපත්‍ර. පන්දාහෙ ඉඳලා හයදාහ වෙනකං අන්තිම කැමති පත්‍ර. හයදාහෙ ඉඳලා අටදාහ වෙනකං ගිවිසුම්. අටදාහෙ ඉඳලා දහදාහ වෙනකං දේපොළ වෙළඳාම් ගනුදෙනු."

''කොහොම හරි මම ඒවා අතපත ගාන්ඩ ගියේ නෑ. මම ඒවා මිටි, මිටි බැඳලා පැත්තක තිබ්බා.''

''අපි ඒවා දිහා පොඩ්ඩක් බලමු ද?'' වර්ජිනියා ඇසුවාය.

''අපොයි කමක් නෑ, බලමු.''

පිදුරු සුවඳ හමන ගබඩාව ඔස්සේ ජූලියන් බැනොක් පෙරටුව ගමන් කළේය.

''මම මේක ඇතුලේ ගොඩාක් පිදුරු තියාගන්ඩ පුරුදු වෙලා හිටියා.'' ඔහු කීවේය. ''පොඩි පහේ කිරි ව්‍යාපාරයක් මම කළානෙ. ඒත් නීති රීති තද වෙන්ඩ ගත්තාට පස්සෙ මම වැඩේ අතඇරියා. ලොකු කිරි කොම්පැනිවලට ඒ නීති එච්චර අමාරු නෑ. කොහොම වුණත් මම හිතාගෙන හිටියෙ ඔය කඩදාසි ටික පුච්චලා දාන්ඩ කියලා. ඒත් ඔයා ඒවා ගැන බොහොම කැක්කුමකින් කතා කළ නිසා මට ඒකට හිත දුන්නෙ නෑ.''

''ඒ ඉතින් ටික කාලෙකට කලින්නෙ,'' වර්ජිනියා කීවාය. ''කොහොමටත් කාලය ටික, ටික ගතවෙද්දි ෆයිල්වලට තියෙන වටිනාකම අඩුවේගන යනවා.''

''ඔන්න අපි ආවා,'' බැනොක් කීවේය. ''මේක මම ට්‍රැක්ටර් නවත්තන්ඩ කියලා පාවිච්චි කළේ. ඒත් ෆයිල් ටික මේකෙ තමයි තියලා තිබුණෙ. මෙහෙන ගහලා පලච්චාවේ.'' බැනොක් විස්මයෙන් නතර වූයේ තැන තැන විසුරා දමා තිබූ ලිපිගොනු දැකීමෙනි.

''අර මිනිහා මේක හැම තැනම හැඩි කරලා ගිහිල්ලානෙ,'' වර්ජිනියා කෝපයෙන් කීවාය.

ඇය ලිපි ගොනු දෙස බැලුවේ බලවත් පස්චාත්තාපයෙනි.

ලිපි ගොනු බැලීමට පැමිණි මිනිසා ඔහුගේ හදිසිය නිසාමදෝ සියලු ලිපි ගොනු මිටි වල නූල් කපා දමා සියල්ල විසුරවා දමා තිබිණි.

කාබන් පිටපත් සියල්ල මීයන්ගේ ලෑටි ගෑමට හසුවීමට දමා තිබෙනු දුටු වර්ජිනියාට මුල්ලකට වී අඬා වැලපීමට සිත් විය. ඈ කෙතරම් මේ ලිපිගොනු වෙනුවෙන්, ඒවායේ ප්‍රවේසම වෙනුවෙන් වෙහෙසවන්නට ඇති ද?

සැහැල්ලුවෙන් ජීවත්වීමට පුරුදු වූ අයෙකු වුවද, මෙම සිද්ධිය නිසා නැග එන කෝපයෙන් පරල වූ ජූලියන් බැනොක්, "මේ ස්මිත් කියන මළ යකාට හොඳ පාඩමක් උගන්නන්ඩ වෙනවා," යයි කීවේය.

දෙකට නැමුනු ඔහු බිම තිබූ ලිපි ගොනු බඳින නූල් කැබැල්ලක් අසුලා ගත්තේය. "කෙලින්ම නූල් ටික කපලා දාලා. මේ බැල්ලිගෙ පුතාට සිරිත් විරිත් ටිකක් තදේටම කියලා දෙන්ඩ වෙනවා."

"මේ මිනිහා පුදුම හදිස්සියකින් ඉඳලා තියෙන්නෙ," විසිරුණු ලිපි ගොනු දෙස බලමින් වර්ජිනියා කීවාය. "බලන්ඩ, මිනිහා පිහියකින් ලණු ටික කපලා දාලා ෆයිල්වල තිබ්බ කඩදාසි එළියට අරගෙන. එයාට ඕනෙ දේ හම්බ වුණේ නැති වුණහම හැම කඩදාසියක්ම විසිකරලා දාලා."

"මට කේන්ති, මම මේ මිනහා දිහා ඇහැ ගහගෙන නොහිටපු එක ගැන," ජූලියන් කල්පනාකාරීව කීවේය.

"ඒ මනුස්සයා කොච්චර වෙලා මෙතන හිටිය ද?" වර්ජිනියා ඇසුවාය.

"හත්ඉලව්වෙ මම ඒක දන්නෙ කොහොමද? මම ඒ යකාට මෙතන පෙන්නලා මගෙ වැඩවලට ගියා."

වර්ජිනියා ක්ෂණික තීරණයකට එළැඹුනාය. "ළඟම තියෙන ටෙලිෆෝන් එක කොහෙද තියෙන්නෙ?" ඇය අසා සිටියාය.

"මීට හැතැප්ම දෙකකට එහා මම අඳුනන කෙනෙක්ගෙ ගෙදරක තියෙනවා." ජූලියන් කීවේය.

"මට දිගු දුර කෝල් එකක් ගන්ඩ ඕනෙ." ඇය කීවාය. "මං හිතන්නෙ, ඒක ටවුමට ගිහින්ම ගන්න එක හොඳයි. කාටවත් ඇහෙන්නෙ නැති වෙන්ඩ. මම එනකොට ලොකු පෙට්ටි ටිකක් අරගෙන එන්නං. මේ ෆයිල් ටික ආරක්ෂා සහිත තැනක තියන්ඩ ඕනෙ."

"හරි," ඔහු කීවේය. "මාත් උදව්වක් දෙන්නංකො, ඒවා වාහනේට දාගන්ඩ. මම දැනට මේවා ආපහු මිටිවලට බැඳලා තියන්ඩද? "

"එපා," ඇය කීවාය. "ඔය තියෙන විදිහටම තිබ්බාවෙ. එතකොට මට පුලුවන් ඒවා කිසියම් පිළිවෙලකට හදාගන්ඩ. මම

එනගමන් සුපර් මාකට් එකක නතර වෙලා පෙට්ටි ටිකක් ගන්නං. ආයෙමත් මිටි ගහන්ඩ ගියොත් මට ඒවා හරි පිළිවෙලකට හදා ගන්ඩ අමාරු වේවි.''

''ඒක හරි,'' ඔහු කීවේය. ''ඒත් මේ දූවිලි ගොඩේ දඟලන්ඩ ගියොත් ඔයාව හොඳටම කිලුටු වේවි.''

''ඒ ගැන වද වෙන්ඩ එපා,'' ඇය කීවාය. ''මම එනගමං ඩෙනිමකුයි බ්ලවුස් එකකුයි අරගෙන එන්නං. ඔයාට කමක් නැත්තං මට මෙතන ඇඳුම් මාරු කරගන්ඩ ඉඩ දෙන්ඩකො.''

''අපෝ ඕක මොකද්ද?'' ඔහු කීවේය. ''ඔයා ගෙට ගිහින් ඇඳුම් මාරු කරගන්ඩ. ඕනෙ නම් වැඩේ ඉවරවෙලා නාගන්ඩත් පුළුවන්. මෙතන දූවිලි විමානයක්.''

''එහෙමනං, මම ගිහින් එන්නං,'' ඇය කීවාය.

''හොඳයි, ගිහින් එන්ඩ.'' ඔහු ඇයට අතට අත දුන්නේය.

සිය මෝටර් රථය වෙත ගිය වර්ජිනියා, බේකර්ස්ෆීල්ඩ් වෙත රිය පදවාගෙන ගොස්, හමුවූ පළමු දුරකතන කුටියෙන්ම පෙරී මේසන් හට ඇමතුමක් ලබාගත්තාය.

''මිස්ට මේසන් මට කිව්වානෙ මොකක් හරි අසාමාන්‍ය දෙයක් වුණොත් කෝල් කරන්ඩ කියලා,'' ඇය කීවාය. ''මේකනං හොඳටම අසාමාන්‍යයි. ඒත් මට අග මුල හිතාගන්ඩ බෑ.''

''කියන්ඩකො බලන්ඩ,'' මේසන් කීවේය.

''මිස්ට මේසන් මට හිතාවේවි, මගෙ ඔලුව විකාර වෙලා කියලා. ඒත් මෙන්න මේකයි සිද්ධ වුණේ,''

ඇය තමා හමුවීමට පැමිණි මිනිසා සහ ජූලියන් බැනොක් පිළිබඳව ද, ලියකියවිලිවලට සිදුවී ඇති දේ පිළිබඳව ද කියා සිටියාය. ''ඒ මනුස්සයාගෙ කාර් එක අවුරුදු දෙකත් හතරත් අතර පරණ එකක්, මට හිතෙනවා ඒක ඕල්ඩ්ස්මොබයිල් එකක් කියලා, ඒත් මට ෂුවර්ම නෑ.'' ඇය කීවාය. ''ලයිසන් නොම්මරේ පළවෙනි ඉලක්කම බිංදුව. මට ඉතුරු ටික බලාගන්ඩ බැරි වුණා, එයා වේගෙන් එලෝගෙන ගිය නිසා.''

''එයා කොහෙද කාර් එක පාක් කරලා තිබ්බෙ?'' මේසන් ඇසුවේය. ''එයා පාක් කරලා තිබ්බ තැන අනුව කොච්චර වෙලා එයා, ඔයා එනකං බලාගෙන හිටියා ද කියලා අපිට අනුමාන කරන්න පුළුවන්. මම හිතන විදිහට, ඔයාගෙ තට්ටු නිවාසය ඉස්සරහා පාක් කරන්ඩ තැනක් හොයාගන්න එක ලේසි නෑ.''

''එතන පාකිං හොයාගන්ඩ අමාරුයි තමයි,'' ඇය පුදුමයෙන් කීවාය. ''ඒත් මේ මනුස්සයා පාක් කරලා තිබ්බෙ හරියටම ෆයර් ප්ලග් එක ගාව.''

''එහෙමනං, ඒ යකා වැඩි වෙලාවක් පාක් කරගෙන ඉඳලා නෑ.'' මේසන් කීවේය. ''මිනිහා ඔයා එනකං නතර වෙලා හිටියා නෙමෙයි, ඔයාව ෆලෝ කරගෙන ආවා වෙන්ඩ තියෙන ඉඩ කඩ වැඩියි. ෆයර් ප්ලග් එක ගාව කවුරු හරි පාක් කරනවාද කියලා පොලිසිය නිතර සෝදිසියෙන් ඉන්නෙ.''

''ඒක ඇත්ත. මගෙ යාළුවෙක් පාර්සලයක් බාර දෙන්ඩ කියලා ඇවිත්, ඔතනම පාක් කරලා, දඩයක් කෑවා. විනාඩියක්වත් පාක් කරලා තිබුණෙ නෑ.''

''ඔයා හිතනවා නොම්මරේ පළවෙනි අංකය බිංදුව කියලා? '' මේසන් ඇසුවේය.

''මට ඒ ගැන හොඳටම විශ්වාසයි. ඒ වගේම මම හිතනවා අන්තිම ඉලක්කම දෙක කියලා. ඒත් මට ඒ ගැන ලොකු විශ්වාසයක් නෑ.''

''ඔයා දූන් ඉන්නෙ බේකර්ස්ෆීල්ඩ්වල ද?'' මේසන් ඇසුවේය.

''ඔව්. මම මිස්ට බැනොක්ගෙ සහොදරයාගෙ ගෙදරට ගිහාම දූනගත්තා කවුරු හරි එහාට ඇවිත් මුළු ෆයිල් තොගේම අවුස්සලා කියලා.''

''ෆයිල් ටික අවුස්සලා කියන කතාවෙ තේරුම මොකද්ද?''

ඇය තත්වය විග්‍රහ කළාය.

මේසන්ගේ ස්වරය විධානාත්මක විය.

''මේක බොහොම වැදගත්, වර්ජිනියා. ඔයා කියන්නෙ ෆයිල්වල ලණු කපලා තියෙනවා කියලා?''

"ඔව්."

"හැම බන්ඩල් එකක්ම?"

"ඔව්."

"එතකොට, ඒවායෙ කොල විසුරුවා හැරලා?"

"ඔව්."

"කිසිම මිටියක් බේරිලා නෑ?"

"නෑ."

"ඔයාට ඒ ගැන හොඳටම විශ්වාස ද?"

"ඔව් මිස්ට මේසන්, ඇයි ඒක ගොඩාක් වැදගත් වෙන්නෙ?"

"මේකයි," මේසන් පැහැදිලි කළේය. 'යම් කිසි කෙනෙක් ෆයිල් මිටි ගොඩාක් තියෙන තැනකින් තමුන්ට ඕනෙ කඩදාසිය විතරක් හොයනවානං, එයා කරන්නෙ එකින් එක මිටි කප, කප බලලා, අනවශ්‍යය කොල විසි කරන එක. තමුන්ට ඕනෙ දේ ලැබුණ ගමන්, ඒ මිනිහා එතනින් මාරු වෙලා යනවා. එතකොට නොකපපු මිටි කීපයක් හරි ඉතුරු වෙන්ඩ ඕනෙ. හැම මිටියක්ම කපලා දාලා තියෙනවා කියන්නෙ, ඒ යකාට ඕනෙ දේ හම්බ වෙලා නෑ කියන එක."

"මට ඒ ගැන හිතුනෙ නෑ." ඇය කීවාය.

"ඔයා ආයෙමත් ජුලියන් බැනොක්ගෙ ගෙදර යනවාද?" මේසන් ඇසුවේය.

"ඔව්, මම ආපහු කාඩ් බෝඩ් පෙට්ටි ටිකකුත් අරගෙන ගිහිල්ලා, මේ ෆයිල් ටික මොකක් හරි පිළිවෙලකට හදාගන්ඩ හදන්නෙ."

"හොඳයි," මේසන් කීවේය. "ඔයා එහාට යන වෙලාව වෙනකොට ඔය කඩදාසි ගැන අමාරුවක් තියෙන මිනිහා ගැන වැඩිපුර විස්තර මගෙ ළඟ තියේවි. ඊට කලින් මේක කියන්ඩ, වර්ජිනියා, අන්තිම කැමති පත්‍ර ගැන ඔයා විශේෂයෙන් බැලුවාද?'

"මොකද්ද ඒ කතාවේ තේරුම?"

''සාමාන්‍යයෙන් මිස්ට බැනොක් අන්තිම කැමති පත්‍රයක් හදනකොට, ඒක කරන්නෙ ඔෆිස් එකේ ඉඳගෙනද?''

''ඔව්.''

''කවුද සාක්ෂිකාරයො හැටියට අත්සන් කරන්නෙ?''

'ආ, මට දැන් තේරෙනවා. සාමාන්‍යයෙන් එයා එක සාක්ෂි කාරයෙක් හැටියට අත්සන් තියෙනවා. ගොඩාක් වෙලාවට අනිත් පැත්තෙ සාක්ෂි කාරයා වෙන්නෙ මම.''

''හරි,'' මේසන් කීවේය. ''ඔයා දැන් ආපහු එහාට ගිහාම, විශේෂයෙන් බලන්ඩ අන්තිම කැමති පත්‍ර ගැන. ඒවා ඔක්කොම මිටි බැඳලා, පුළුවන් තරම් ඉක්මනට මෙහාට අරගෙන එන්ඩ.''

''ඇයි ඒවා විතරක්?'' ඇය ඇසුවාය.

''බැනොක් කලුරිය කරලා සෑහෙන කාලයක් වෙනවා. මේ වෙනකොට ගිවිසුම්වල පිටපත් ගැන තියෙන වැදගත්කම අඩුවෙන්ඩ ඕනෙ. ඒත් අන්තිම කැමති පත්‍ර එහෙම නෙමෙයි. කිසියම් ඥාතියෙකුට පිටපතක් අවශ්‍යය නම්-''

''හරි, මට තේරෙනවා,'' ඇය කලබලයෙන් කීවාය. ''ඇයි මට ඒ ගැන කලින් හිතුනෙ නැත්තෙ. එහෙමනම් ඒක තමයි හේතුව.''

''එකපාරටම නිගමනවලට පනින්ඩ එපා,'' මේසන් අනතුරු ඇඟවූයේය. ''මේක මට ආපු සිතිවිල්ලක් විතරයි. ඒත් අපි ප්‍රවේසම් වෙන එක හොඳයි.''

''මම ආපහු යනවා.'' ඇය පොරොන්දු වූවාය. ''මම ඒ අන්තිම කැමති පත්‍ර ටික අරගෙන එන්නං. අනිත් ඒවා වෙන වෙලාවක ගන්ඩ පුළුවන්.''

''හරි,'' මේසන් කීවේය. ''ඒ අතරෙ මොනවා හරි තවත් අසාමාන්‍ය දෙයක් සිද්ධ වුණොත් මට කෝල් කරන්ඩ. මම ඔයාව මුණගැහෙන්ඩ ආපු කෙනා ගැන විස්තර හොයලා තියන්නං.''

මේසන් හට සිදුවන සියල්ල පැවසීමට පොරොන්දු වූ වර්ජිනියා, රිසිවරය ආපසු තබා, සුපිරි වෙළඳ සැලකට ගොස් කාඩ් බෝඩ් පෙට්ටි දෙකක් මිලට ගෙන. ජුලියන් බැනොක්ගේ නිවස වෙත ගියාය.

බැනොක් නොසන්සුන්ව සිටින බව ඇයට පෙනුනි.

"මොකද්ද ප්‍රශ්නෙ?" ඇය ඇසුවාය. "මොනවා හරි තව දෙයක් අර ෆයිල්වලට වුණාද?"

"ඔයා ගිහින් විනාඩි පහක්වත් නෑ," ඔහු කීවේය. "තවත් එකෙක් ආවා, ඔයා කලින් මෙහාට ආවා කියලා හිතපු ජාතියෙම. ඒ මිනිහාගෙ ඇස් දෙක කළුම කළු පාටයි, කිසිම හැඟීමක් දැනෙන්නෙ නෑ, ඇස් දෙක දිහා බැලුවහම.'

"ඒ මම කියපු කෙනා තමයි," ඇය කීවාය. "මිනිහා මොනවාද කිව්වෙ?"

"ඒ යකා කිව්වානෙ ඒ මිනිහාගෙ නමත් ස්මිත් කියලා. මගෙ සහෝදරයාගෙ ෆයිල් තමයි ඒ මිනිහාට ඕනෙ කළේ."

"ඉතිං, ඔයා මොකද කළේ?"

"මං කිව්වා අපි එහෙම හැම එකාටම ෆයිල් බලන්ඩ දෙන්නෙ නෑ කියලා. ඒ පාර උන්දෑ කියාපි, මිනිහාට මේක බොහොම වැදගත්, කොහොම හරි ෆයිල් ටික බලන්ඩ ඕනෙ කියලා. මම කිව්වා, මගෙ සහෝදරයාගෙ සෙකට්‍රි තව ටිකකින් එනවා, ඒ වෙනකං ඉන්ඩ කියලා."

"ඊට පස්සෙ මොකද වුණේ?"

"එතකොට මිනිහා බය වුණා. වැඩි වෙලා ඉන්ඩ බෑ කියලා, මිනිහා හිමීට මාරු උනා."

"ඔයා එයාගෙ කාර් එකේ නොම්මරේ ලියා ගත්ත ද?" ඇය උනන්දුවෙන් ඇසුවාය.

"ඒ වැඩේ හරි ගියේ නෑ." ජූලියන් කීවේය. "මිනිහාගෙ කාරෙකේ නොම්මර තහඩුව පුරා මඩ තැවරිලා තිබ්බා. මේ හරියෙ පාරවල්වල මඩ තියෙනවා තමයි. ඒත් ඔය හැටි මඩ තිකම්ම ගෑවෙන්ඩ විදිහක් නෑ. මං හිතන්නෙ, ඔය මිනිහා හිතා මතාම නොම්මරේ මඩ ගාගෙන ආවා කියලා."

"කමක් නෑ," වර්ජිනියා කීවාය. "මම අර ෆයිල් වලින් කොටසක් ගෙනියන්ඩ ද, ඔයාගෙ විරුද්ධත්වයක් නැත්තං?"

"පුළුවන්නං සේරම ගෙනියන්ඩ." ජූලියන් කීවේය. "මම මෙහෙ නැති වෙලාවක කවුරු හරි මළ යකෙක් ඔවා ඩැහැගෙන යන්ඩ ඉඩ තියෙනවා."

"ඔයා අහලා තියෙනවාද පෙරී මේසන් තීතිඥයා ගැන?" ඈය ඇසුවාය.

"මේ මොනවා කියනවද? මම එයා ගැන පත්තර වලින් දන්නවා."

"මෙහෙමයි," වර්ජිනියා කීවාය. "එයා තමයි මගෙ ලෝයර්. මම එයා කියන විදිහටම වැඩ කරන්ඩයි යන්නෙ. මම හිතාගෙන හිටියෙ මේ ෆයිල් ටික පෙට්ටිවලට දාන්ඩ කියලා. ඒත් මට දැන් ඒකට වෙලාව නෑ. මම නොම්මර පන්දාහෙ ඉඳලා හයදාහ වෙනකං ෆයිල් ටික අරගෙන යනවා."

වර්ජිනියා නොම්මර පන්දහසේ සිට හයදහස දක්වා ලිපිගොනු සොයන්නට වූ අතර ජූලියන් ඊට උදවු විය. කෙසේ වුවද එකී අංකනයන්ට අදාල කඩදාසි ඒ මේ අත විසිරී නොතිබිණි.

"මේ පොදියෙ තියෙන්නෙ ඔය කියාපු ඉලක්කංවල කොළ විතරයි වගේ," ජූලියන් කීවේය.

"හරි, මම දැන් මේවා මේසන්ගෙ ඔෆිස් එකට අරගෙන යනවා." වර්ජිනියා කීවාය. "ඔයාට පුළුවන්ද අනිත් ෆයිල් ටික කාටවත් අතපත නොගාන්ඩ තරමට ආරක්ෂාවක් සලස්වන්ඩ?"

"මම මේවා පෙට්ටිවලට දාන්ඩ ද?" ජූලියන් ඇසුවේය. "මේ අවුරුද්දෙ මේ කාලෙට මට වැඩ වැඩියි."

"ඕනෙ නෑ," වර්ජිනියා කීවාය. "ඕවා එහොමම තිබ්බචාවෙ. ඒත් මේ දොරට ඉබ්බෙක් දාන්ඩ. කවුරු හරි ෆයිල් ගැන අහගෙන ආවොත් එයාගෙ ඩ්‍රයිවිං ලයිසන් එක ඉල්ලගෙන බලලා හරියටම නම දැනගන්ඩ."

"අනිවාර්යයන්ම මම ඒ වැඩේ කරන්නං." ජූලියන් කීවේය. 'ඔයාට ඇඳුම් මාරු කරගන්ඩ ඕනෙ නැද්ද ?"

"නෑ. මම දැන් පුළුවන් තරම් ඉක්මනට යන්ඩ ඕනෙ." ඈය කීවාය.

ජුලියන් මදහසක් පෑවේය. ''මම දන්නවා, මගෙ සහෝදරයා ඔයා ගැන කොච්චර හොඳ කිව්වාද කියලා. මට දැන් තමයි හිතෙන්නෙ එයා මිනිස් චරිත ගැන කොයි තරං හොඳට දැනගෙන හිටිය ද කියලා. එහෙම නම් ප්‍රවේසමින් යන්ඩ.''

ඔහුට අතට අත දුන් ඇය පිටත් වූවාය.

# 9

පෙරී මේසන්ගේ කාර්යාලය වෙත වර්ජිනියා යන විට දහවල් දොළහ යන්තමින් පසුවී තිබිණි.

''හලෝ මිසිස් බැක්ස්ටර්,'' ගර්ටී හෙවත් පිළිගැනීමේ නිලධාරිනිය කීවාය. ''ඒගොල්ලො ඔයා එනකං බලාගෙන ඉන්නෙ. ඒත් මම කෝල් එකක් දීලා කියන්නං, ඔයා ආවා කියලා.''

ගර්ටී දුරකතන ඇමතුමක් ලබා දුන් අතර මොහොතකට පසු ශාලාවට පැමිණි ඩෙලා, ''මේ පැත්තෙන් එන්ඩ, වර්ජිනියා,'' යයි කියමින් ආරාධනා කළාය.

ඩෙලා ස්ට්‍රීට් පසුපස මේසන්ගේ කාර්යාලයට ගිය වර්ජිනියට දක්නට ලැබුනේ දැඩි කල්පනාවක ගැලී සිටි පෙරී මේසන්ය. ''ඔයාගෙ අද්භූත අමුත්තා කවුද කියලා අපි හොයාගත්තා, වර්ජිනියා,'' ඔහු කීවේය. ''ජෝජ් මෙනාඩ් කියලා ඔයාට නම දීපු කෙනා. ෆයර් ප්ලග් ළඟ පාක් කරලා, දඩ කාපු අය ගැනයි අපි හෙව්වෙ. එදා දවසේ තුන් දෙනෙක් දඩ කාලා තියෙනවා, ඒ හරියෙ රාජකාරි කරපු පොලිස් නිලධාරියාගෙන්. ඔයාගෙ ගේ ළඟට ආපු කෙනාගෙ කාර් නොම්මරේ තමයි, ඕ ඩී ටී. 062. ඒ කාරෙක අයිතිකාරයා, ඔයා විස්තර කරපු කෙනාගෙ හැඩරුවට බොහොම සමාන කෙනෙක්.''

''ඉතින්, කවුද ඒ මිනිහා?''

"එයාගෙ ඇත්ත නම ජෝජ් ඊගන්. එයා වැඩ කරන්නෙ ලොරේටා ට්‍රෙන්ට් කියලා කෙනෙක්ගෙ ඩ්‍රයිවර් හැටියට. අපි එයා ගැන පොඩ්ඩක් හොයලා-"

"ලොරේටා ට්‍රෙන්ට්?" වර්ජිනියා විස්මයෙන් ඇසුවාය.

"ඔයා එයාව දන්නව ද?" මේසන් ඇසුවේය.

"මගෙ දෙයියනේ, අපි එයාගෙ අන්තිම කැමති පත්තරේ ලිව්වනෙ. ඒක ටිකක් අමුතු විදිහෙ එකක්. නෑදෑයන්ට දේපොල වලින් ඒ හැටි දෙයක් උරුම වුණේ නෑ. වැඩි කොටහ ගියේ පිටස්තර කෙනෙකුට. නර්ස් කෙනෙකුට හරි දොස්තර කෙනෙකුටද මන්දා... දෙයියෝ සාක්කි, ඩ්‍රයිවර්ට වෙන්ඩත් පුළුවන්."

"අපිට තව අමුතු විදිහෙ තොරතුරු ලැබුණා," මේසන් කීවේය.

"ඩ්‍රයිවර් ගැන ද?"

"ලොරේටා ට්‍රෙන්ට් ගැන. එයා තුන් වතාවක් රෝහල් ගත කරලා තියෙනවා, ආහාර විෂවීමක් කියලා. රෝග විනිශ්චය අමාශගත අම්ල ප්‍රදාහය කියලයි කියන්නෙ."

"මම ඔක්කොම අන්තිම කැමති පත්‍ර ටික කාරෙක් දාගෙන ආවා, මිස්ටර් මේසන්. ඒවායින් මොනවා හරි ප්‍රයෝජනයක්...."

"ඒවායින් ගොඩක් ප්‍රයෝජන තියෙනවා." මේසන් කීවේය. "මම ඔයාට අපේ විමර්ශන කටයුතු කරන පෝල් ඩ්‍රේක්ව අඳුන්වලා දෙන්නං. එයා තමයි ඩ්‍රේක් රහස්පරීක්ෂක ආයතනයේ ලොක්කා. අපේ හැම විමර්ශන වැඩක්ම කරන්නෙ එයා තමයි. ඩෙලා, එයාට කෝල් එකක් දෙන්ඩකො."

ඩෙලා ස්ට්‍රීට් දුරකතන ඇමතුමක් ලබාගත් අතර ඇය රිසීවරයට කතා කළාය. "පෝල්, පෙරී කියනවා ඔයාට පුළුවන්නං, ඔෆිස් එකට ඇවිත් යන්ඩ කියලා." ඇය රිසීවරය ආපසු තැබුවාය.

"පෝල් ඩ්‍රේක් විනාඩි ගාණකින් මෙහාට එන්නං කිව්වා," ඇය මදහසක් සමග කීවාය.

සැබැවින්ම විනාඩි ගණනක් තුළ පෝල් ඩ්‍රේක්ගේ සුපුරුදු දොරට තට්ටුකිරීමේ ඔහුටම අවේනික නාදය ඇසෙන්නට විය.

දොර වෙත ගිය ඩෙලා ඔහුව කැටුව ආවාය.

''පෝල්,'' මේසන් ඔහු අමතමින් කීවේය. ''මේ තමයි වර්ජිනියා බැක්ස්ටර්. ඔයා එයාව දන්නෙ නැතුව ඇති, ඒත් එයා තමයි මගේ ක්ලයන්ට්, ඔයා මීට කලින් විමර්ශන වගයක් කළේ එයා වෙනුවෙන් තමයි.''

''එහෙමද?'' මදසිනහවකින් සංග්‍රහ කරමින් පෝල් කීවේය. ''අඳුනාගැනීම සතුටක්.''

''එයා ගාව ලියකියවිලි වගයක් තියෙනවා,'' මේසන් කීවේය. 'ඒවා තියෙන්නෙ කාරෙකේ. ඔයාට පුළුවන්ද ඒවා උඩට අරගෙන එන්ඩ එයාට උදව් කරන්ඩ ?''

''ගොඩක් බර ද?'' පෝල් ඩ්‍රේක් ඇසුවේය. ''තව කවුරුහරි අඬගහගන්ඩ වෙයි ද?''

''නෑ, නෑ,'' ඇය කීවාය. ''අඟල් විස්සක් විතර ඝනකම තනි මිටියක්. එක පිරිමියෙකුට උස්සන්ඩ පුළුවන්.''

''එහෙනං, යමු.'' ඩ්‍රේක් කීවේය.

''මම තව දෙයක් කියන්ඩ හිටියෙ මිස්ට මේසන්,'' වර්ජිනියා කීවාය. ''මම ටෙලිෆෝන් කරන අතරවාරෙ අර මිනිහා ජූලියන් බැනොක්ගෙ ෆාම් එකට ගිහින් තිබුණා.''

''මොන මිනිහා ද?''

''මාව හම්බවෙන්ඩ ආපු මිනිහා. ඊගන් කියලා ඔයා කිව්වෙ. මිසිස් ට්‍රෙන්ට්ගෙ ඩ්‍රයිවර්.''

''එතකොට, මිනිහා මොනවාද කියලා තිබුණෙ?''

''ඒ මිනිහත් කියලා තියෙන්නෙ, පරණ ෆයිල් බලන්ඩ ඕනෙ කියලා. ජූලියන් බැනොක් කිව්වහම, මම තව ටිකකින් එනවා කියලා, මිනිහා කාරෙකට නැගලා යන්ඩ ගිහින්.''

''එහෙමද?'' කියමින් මේසන් බැලුවේ පෝල් ඩ්‍රේක් දෙසය. ''අර කඩදාසි ටික ගේන්ඩ, පෝල්.''

ඩ්‍රේක් රථ ගාල කරා වර්ජිනියා සමග ගියාය. ඇය මෝටර් රථය තුළින් ලියකියවිලි තොගය ඉවතට ගත් අතර පෝල් ඩ්‍රේක් ඒවා සිය උරහිස මත තබාගත්තේය.

මේසන්ගේ කාර්‍යාලයට පැමිණි පසු කඩදාසි කෙරෙහි මේසන්ගේ පූර්ණ අවධානය යොමු විය.

"මේවා අංකනය කරලා තියෙන්නෙ කොහොමද, වර්ජිනියා?" මේසන් ඇසුවේය.

"ටී-1 කියලා අංකනය කරලා තියෙන්නෙ ටී අකුරෙන් පටන්ගන්න ඒ වගේම දෙවෙනි අකුර "ඒ" අකුරෙ ඉඳන් ආකාරාදියෙ හතරවෙනි අකුරට යනකං ෆයිල්." වර්ජිනියා කීවාය. "ටී-2 කියන්නෙ, ඊළඟ අකුරු හතර ටී අකුරට පස්සෙ එන ඒවාට."

"හරි," මේසන් කීවේය. "එහෙමනං, අපි ටී-4 ෆයිල්වල බලමු ලොරේටා ට්‍රෙන්ට් ගැන මොනවා හරි තියෙනවාද කියලා."

ටී-4 ට අදාල කඩදාසි සියල්ල ඩෙලා, පෝල්, වර්ජිනියා සහ තමා ඉදිරිපිට බෙදාගත් මේසන් ඒවා අධ්‍යයනය කිරීමට පටන් ගත්තේය.

"මෙතන බර ගානක අන්තිම කැමති තියෙනවා," විනාඩි කිහිපයකට පසු මේසන් කීවේය. "ඒත් ලොරේටා ට්‍රෙන්ට් නමින් එකක්වත් නැති හැඩයි."

"ඒත් අපි එයාට එකක් පිළියෙල කළා," වර්ජිනියා කීවාය. "අඩුගානෙ එක අන්තිම කැමැත්තක් හරි."

"එතකොට," මේසන් කීවේය. "ජෝජ් ඊගන් අහන්නෙ ඩෙලානෝ බැනොක්ගෙ කාබන් කොපිවලට මොකද වුණේ කියලා. ජෝජ් ඊගන් කියන්නෙ ලොරේටා ට්‍රෙන්ට්ගෙ ඩ්‍රයිවර්."

මේසන් හැරුණේ පෝල් ඩ්‍රේක් වෙතය. "ලොරේටා ට්‍රෙන්ට්ට ඔය හැඳුනයි කියන බඩේ අමාරුව වෙච්ච වෙලාවෙ එයා හිටියෙ කොයි ඉස්පිරිතාලෙ ද?"

"පිලිප්ස් අනුස්මරන රෝහලේ."

"ඒගොල්ලන්ව ෆෝන් එකට ගන්ඩ, ඩෙලා." මේසන් කීවේය.

ඩෙලා ස්ට්‍රීට් දුරකතන ඇමතුමක් ලබා ගත් අතර දුරකතන අංකය සම්බන්ධ වූ බව ඇඟැවීම සඳහා ඇය මේසන් දෙස බලා හිස වැනුවාය.

මේසන් රිසිවරය අතට ගත්තේය. "පිලිප්ස් අනුස්මරණ රෝහල?"

"ඔව්?"

"මම පෙරී මේසන්, නීතිඥයෙක්. මට අවශ්‍යයි ඔගොල්ලන්ගෙ රෝගියෙක් ගැන තොරතුරු දැනගන්ඩ."

"බොහොම කණගාටුයි, අපිට අපේ රෝගීන් ගැන තොරතුරු දෙන්ඩ විදිහක් නෑ."

"මේක සාමාන්‍ය විමසීමක් විතරයි," මේසන් වගකට නැතිව කීවේය. "රෝගියාගේ නම ලොරේටා ට්‍රෙන්ට්. එයා පහුගිය මාස කීපය ඇතුළත තුන් වතාවක් රෝහල් ගත කරලා තිබුණා. මට උවමනා කරන්නෙ එයා භාරව ඉන්න දොස්තර කවුද කියලා දැනගන්ඩ විතරයි."

"එහෙමනං පොඩ්ඩක් ඉන්ඩ, අපිට ඒ විස්තර දෙන්ඩ අවසර තියෙනවා."

"හොඳයි, මම ලයින් එකේ ඉන්නං," මේසන් කීවේය.

"දොස්තර මහත්තයාගෙ නම් ෆෙරිස් ඇල්ටන්, එයා ඉන්නෙ රැන්ඩ්වෙල් බිල්ඩින් එකේ." මඳ වේලාවකට පසු කියැවිනි.

"තැන්ක් යූ," කියමින් මේසන් රිසිවරය ආපසු තැබුවේය.

"ඩෙලා, බලන්ඩ, ඩොක්ටර් ඇල්ටන්ගෙ නර්ස්ට කතා කරන්ඩ පුළුවන් ද කියලා?"

"එයාගෙ නර්ස්ට?"

"ඔව්," මේසන් කීවේය. "ඩොක්ටර් ඇල්ටන්ට කතා කරන්ඩ තමයි මම වැඩිය කැමති. ඒත් මේ වෙලාව දොස්තරලාට වැඩ වැඩි වෙලාවක් නිසා මුලින්ම එයාගෙ නර්ස්ට කතා කරන එක හොඳයි කියලයි මම හිතන්නෙ."

ඩෙලා ස්ට්‍රීට් නැවතත් දුරකතනය සමග යුහුසුලු වූ අතර පෙරී මේසන් දෙස බලා හිස වැනුවාය.

මේසන් රිසීවරය අතට ගත්තේය. "මම පෙරී මේසන්, නීතිඥයෙක්. මම දන්නවා, ඩොක්ටර් ඇල්ටන් මේ වෙලාවෙ බොහොම කාර්ය බහුලයි කියලා. ඒත් මම කැමතියි එයාගෙ රෝගියෙක් ගැන කිසියම් තොරතුරක් ලබාදෙන්ඩ."

"පෙරී මේසන් නීතිඥතුමා ද?" ගැහැනු හඬ විමසුවේය.

"ඔව්."

"ඩොක්ටර් මේ වෙලාවෙ බිසී තමයි. ඒත් එයා කැමති වෙයි ඔබතුමා එක්ක කතා කරන්ඩ. පොඩ්ඩක් වෙලා ලයින් එකේ ඉන්නවාද?"

"හොඳයි, මම ඉන්නං."

නිහඬතාවයක් පැවතිනි. ඉන්පසු වෙහෙසට පත් වූ සහ තරමක නොරුස්නා හඬකින් පිළිතුරු ලැබිණි. "මේ කතා කරන්නෙ ඩොක්ටර් ෆරිස් ඇල්ටන්."

"පෙරී මේසන් කියන නීතිඥයා," මේසන් කීවේය. "මට ප්‍රශ්න කීපයක් අහන්ඩ තියෙනවා ඩොක්ටර්ගෙ රෝගියෙක් ගැන."

"මොනවාද ප්‍රශ්න? කවුද රෝගියා?"

"ලොරේටා ට්‍රෙන්ට්," මේසන් කීවේය. "ඩොක්ටර් එයාව පහුගිය මාස කීපයේ දෙතුන් වතාවක් රෝහල්ගත කරලා තියෙනවා."

"ඉතිං?" මේ වතාවේ වෛද්‍යවරයාගේ ස්වරයේ වූ නොරුස්නා බව පැහැදිලිව ප්‍රදර්ශනය විය.

"මට කියන්ඩ පුළුවන්ද රෝගයේ ස්වභාවය ගැන?"

"මට ඒවා කියන්ඩ බෑ." වෛද්‍ය ඇල්ටන් කඩාපැන්නේය.

"එහෙමනම්," මේසන් කීවේය. 'මම කරුණු කීපයක් කියන්නං, ඩොක්ටර්ට වැදගත් වෙන. ලොරේටා ට්‍රෙන්ට් අන්තිම කැමති පත්‍රයක් අත්සන් කළා කියලා නිගමනය කරන්ඩ මට හේතු තියෙනවා. ඒ වගේම, ඒකෙන් වාසි ලැබෙන අය ඒ අන්තිම කැමති පත්‍රයේ පිටපතක් හොර රහසේ ලබාගන්ඩ උත්සාහ කරනවා. ඒ අනුව, මම ඔබතුමාගෙන් අහනවා, ලොරේටා ට්‍රෙන්ට්ගෙ රෝග විනිශ්චය ගැන ඔබතුමා සෑහීමකට පත් වුණා ද කියලා."

"මේ මොනවා කියනවාද? නැත්තං මම එයාගෙ ටිකට් කපලා ගෙදර යවන්නෙ නැතෙ."

"මම දන්න විදිහට," මේසන් කීවේය. "ඇයට තිබුනෙ ආමශගත අම්ල ප්‍රදාහයක්."

"ඉතිං, මොකද?"

"ඒ අනුව," මේසන් කීවේය. "මම අහලා තියෙනවා, සමහරවිට වෛද්‍යවරු කලාතුරකින් වරද්දගන්නවා, ආසනික් වස දීම සහ අම්ල ප්‍රදාහය කියන රෝග ලක්ෂණ දෙක කියලා. මොකද, ඒ දෙවතාවෙදිම රෝග ලක්ෂණ බොහොම සමාන නිසා."

"තමුසෙට පිස්සු ද?"

"ඒ නිසා," මේසන් කීවේය. "ඔබතුමාට තේරෙනවා ඇති මගේ තත්වය, මම අහන්නෙ ඒ රෝගියාගෙ යටි බඩේ කැක්කුම් තිබුණා ද, බත්කෙණ්ඩාවල කැක්කුම් තිබුණා ද, බඩ දැවිල්ල වගේ දූනුනා ද-"

"හෙණ ගහපං," වෛද්‍යවරයා කීවේය.

මේසන් කතාව නතරකොට වෛද්‍යවරයා යමක් කියනතුරු බලා සිටියේය.

සැහෙන වේලාවක නිහඬතාවක් දුරකතනය ඔස්සේ ගලා ගියේය.

"කාටවත් උවමනාවක් නෑ, ලොරේටා ට්‍රෙන්ට්ට වහ දෙන්ඩ." අවසානයේ වෙදනා කීවේය.

"කොහොමද ඒක දන්නෙ?" මේසන් ඇසුවේය.

නැවතත් නිහඬතාවයක් ඇති විය.

"මේ කාරණාවට තමුන්ගෙ සම්බන්ධෙ මොකද්ද?" වෛද්‍යවරයා දුරස්ථව ප්‍රශ්න කළේය.

"මගේ සම්බන්ධය වක්‍රාකාරයි," මේසන් කීවේය. "මට සහතික වෙන්ඩ පුළුවන්, ලොරේටා ට්‍රෙන්ට් මගේ සේවාදායිකාවක් නොවන බවත්, ඈ පිළිබඳව කිසිදු බැඳීමක් නැති අයෙකු මගේ

සේවාදායිකාව බවත්, ඒ අනුව ලොරේටා ට්‍රෙන්ට් ගැන මට දෙන තොරතුරු විශ්වාසය කඩකිරීමක් නොවන බවත්.''

''හොඳයි, මේසන්,'' වෛද්‍ය ඇල්ටන් කීවේය. ''ඔයා මට හිතන්ඩ යමක් කිව්වා. අම්ල ප්‍රදාහයත් ආසනික් ශරීරගතවීමත් බොහෝ වෙලාවට වෛද්‍යවරු පටලගන්නවා තමයි. ගොඩාක් වෙලාවට ඒකට හේතුව වෙන්නෙ, වෛද්‍යවරයා හිතන්නෙ නෑ, අපරාධයක් කිරීමේ අවස්ථාවක් ඇති කියන එක ගැන.''

''අන්න ඒ නිසයි, මම ඔබතුමාට කෝල් කළේ.'' මේසන් කීවේය.

''ඔයාට මොනාහරි යෝජනා තියෙනවා ද?'' ඇල්ටන් ඇසුවේය.

''ඔව්. මම යෝජනා කරනවා, රෝගියාගෙ හිස කෙස් කීපයක් සහ නියපොතු කීපයක් ලබා ගන්ඩ කියලා. ඒවා ලැබ් එකකට දීලා ආසනික් තියෙනවාද කියලා චෙක් කරගන්ඩ පුළුවන්. ඒ අතරවාරෙ රෝගියාගෙ කෑම, පැය විසිහතර පුරාම පරීක්ෂාවෙන් ඉන්න නර්ස් කෙනෙකුගෙ අධීක්ෂණය යටතට පත්කරන්ඩ. වැදගත්ම දේ තමයි, රෝගියාව බය ගන්නන්නෙ නැතුව ඉන්න එක. මම දන්න විදිහට මේ දේවල් සඳහා රෝගියා මූල්‍යමය වශයෙන් ශක්තිමත් නේද?''

''ඔව්.'' ඇල්ටන් වෛද්‍යවරයා කීවේය. ''දෙයියෝ සාක්කි, එයාගෙ හාට් එකට ඔය වගේ දෙයක් ඔරොත්තු දෙන්නෙ නෑ. මම ගිය පාරත් ඒ ගැන එයාට කිව්වා. ඔයා කොච්චර වෙලා ඔෆිස් එකේ ඉන්නවාද, මේසන්?''

''හවස් වෙනකම්ම ඉන්නවා. ඔෆිස් වෙලාවෙන් පස්සෙ මට කතා කරන්ඩ ඕනෙ නම් ඩ්‍රේක් ඩිටෙක්ටිව් ඒජන්සියට කතා කරන්ඩ. ඒ අය මට පණිවුඩේ දේවි.''

''මම කතා කරන්නං,''

''අනිත් එක, ඩොක්ටර්, අපි හරියටම දෙයක් දැනගන්නකං කාටවත් කිසිම දෙයක් කියන්ඩ එපා.''

''ඒක හරි, මම අවුරුදු තිස්පහක් තිස්සෙ වෙදකං කරන්නෙ, මේසන්. මට මේක ලොකු ෂොක් එකක්. හරි මම කතා කරන්නංකො.''

දුරකතනය එකෙනෙහිම විසන්ධි විය.

මේසන් වර්ජිනියා වෙත හැරුණේය. "මම ඔයාගෙ නිදහසට බාධා කරන්ඩ කැමති නෑ, ඒත් දූන් වෙලා තියෙන දේවල්වල හැටියට ඔයා ගෙදර ගිහින් ටෙලිෆෝන් එක ළඟ ඉන්න එක තමයි, කරන්ඩ තියෙන හොඳම වැඩේ. ඒ අතරවාරෙ අසාමාන්‍ය දෙයක් වුණොත් ඔයා මට ඉක්මනටම කතා කරන්ඩ."

"ඒ ගොල්ලන්ට කාබන් කොපියකින් අන්තිම කැමති පත්‍රයක් ඔප්පු කරන්ඩ බෑ නේද, පෙරී?" පෝල් ඩ්‍රේක් ඇසුවේය.

"සමහර තත්ත්වයන් යටතේ පුළුවන්," මේසන් කීවේය. "සාමාන්‍යයෙන් අන්තිම කැමැත්ත ලියපු කෙනා විසින් ම ඒක විනාශ කළා කියන්නෙ, අන්තිම කැමැත්ත අවලංගු වූවා හා සමානයි. ඒත් අපි හිතමු ගෙයක් ගිනි අරගෙන අන්තිම කැමති පත්තරේ පිච්චිලා, ලියපු කෙනත් මළා කියලා. එතකොට පුලුවනි නම් ඔප්පු කරන්ඩ, ගින්න ඇතිවෙන වෙලාවෙ අන්තිම කැමැත්ත වලංගු වෙලා තිබුණා කියලා, අදාල පාර්ශවවලට ප්‍රතිලාබ ලැබෙනවා. ඒත් මම හිතන්නෙ ඒ ගැන නෙමෙයි."

"එහෙනං, මොකද්ද?" ඩ්‍රේක් ඇසුවේය.

මේසන්ගේ ක්ෂණික බැල්ම එල්ල වූයේ වර්ජිනියා වෙතය. "මට දැනට ඒ ගැන කියන්ඩ විදිහක් නෑ." ඔහු කීවේය. "වර්ජිනියා, ඔයා දූන් ගෙදර යන්ඩ. ජෝජ් ඊගන් නැත්තම් ලොරේටා ට්‍රෙන්ට්ගෙ ඩ්‍රයිවර් හැටියට ඔයා දූන් දන්න කෙනාගෙන් කෝල් එකක් අනිවාර්යයෙන්ම ඔයාට ඒවි. හොඳට මතක තියාගන්ඩ ඔයා එයාව දන්නෙ, ජෝජ් මෙනාඩ් කියන නමින් බව. ඔයා එයාගෙ ඇත්ත නම හෝ තත්ත්වය දන්න බව පෙන්නන්ඩ එපා. ඒ වගේම එයා කිසියම් යෝජනාවක් කළොත් ටිකක් ලැජ්ජාශීලී වෙලා, පොඩි කැදර කමකුත් පෙන්නලා, කාලය ගන්ඩ බලන්ඩ. කොහොමහරි, වෙන හැම දෙයක්ම මට හරි, ඩ්‍රේක්ගෙ ඔෆිස් එකට හරි කෝල් කරලා කියන්ඩ."

"මට තියෙන්නෙ, ඔය මනුස්සයා මොනවා හරි ඇහුවහම, ඒකට කැමතියි වගේ පෙන්නන එකනෙ?" වර්ජිනියා ඇසුවාය.

"අන්න හරි, ඒ වගේම, ඒ මනුස්සයා ඔයාට මොනවා හරි ටයිප් කරලා දෙන්ඩ කියලා කිව්වොත්, අලුත් කාබන් කොළ පාවිච්චි කරන්ඩ."

"ඒක භයානක නැද්ද?"

"එහෙම දෙයක් ගැන මම දැම්ම ම හිතන්නෙ නෑ." මේසන් කීවේය. "ඔයා එයා හරියටම කවුද කියලා දන්න බව නොපෙන්වනතාක්. කොහොම හරි ඔයා ෆෝන් එකක් ළඟ ඉන්ඩ. අපිට දැනගන්ඩ ඕනෙ මිනිහා මොකාටද එන්නෙ කියලා."

"හොඳයි මිස්ටර් මේසන්, මම දැන් යන්නං. කොහොමටත් මම ඔයාට කෝල් කරනවාම තමයි." වර්ජිනියා කීවාය.

"ඔනේ වෙලාවක," මේසන් කීවේය. "මට කෝල් කරන්ඩ බැරි වුණොත් පෝල් ඩ්‍රේක්ගෙ ඔෆිස් එකට හරි කෝල් කරන්ඩ."

වර්ජිනියාට පිටත්වීම සඳහා ඩෙලා ස්ට්‍රීට් දොර විවෘත කොට දුන්නාය.

"ඔයා හිතනවාද මේ ඩ්‍රයිවර්කාරයා ආයෙ එයි කියලා?" වර්ජිනියා පිටත්ව ගිය වහා පෝල් ඩ්‍රේක් ඇසුවේය.

"මිනිහාට ඕනෙ දේ නොලැබුණානං, අනිවාර්‍යයෙන් එයි." මේසන් කීවේය. "අපිට ඉන්නවා, එකම ලියවිල්ලක් ඕනෙ කරන දෙන්නෙක්. ඒ වගේම ෆයිල්වල ඒ ලියවිල්ල නෑ. ඒ කියන්නෙ, කවුරුහරි එක්කෙනෙකුට ඒක හම්බවෙලා කියන එක. එතකොට, ලියවිල්ල හම්බවෙච්ච නැති එකා ආයෙ එන්ඩ එපෑයැ."

"මේ දේවල් කොයි තරමට බරපතල ද?"

"ලොරේටා ට්‍රෙන්ට්ගෙ හිස කෙසුයි, නියපොතුයි සාම්පල් ආවාට පස්සෙ මම ඒක කියන්නං. කොහොමටත් කිසි කෙනෙකුට අන්තිම කැමැත්තක කොපියක වැදගත්කමක් නෑ, කාරණා දෙකක් සිද්ද වෙනකං."

"මොකද්ද ඒ දෙක?"

"පළවෙනි එක, මුල් ලියවිල්ල නැතිවෙන්ඩ ඕනෙ. දෙක, ඒක ලියපු කෙනා මැරෙන්ඩ ඕනෙ."

"ඒ තරමට බරපතලයි කියලා ඔයා හිතනවාද?" ඩ්‍රේක් ඇසුවේය.

"මං හිතනවා. ඒත් මේ ලැබ් රිපෝට් එක එනකං මට මොකුත් කරන්ඩ බෑ. ඔයා දැන් ඔෆිස් එකට ගිහිල්ලා, පෝල්, ලොරේටා ට්‍රෙන්ට්ගෙ ගෙදර ගැන ඇහැ ගහගෙන ඉන්ඩ පුළුවන් කෙනෙක්ව ලෑස්ති කරගන්ඩ. මම කියපු හැටියෙ එයාව සේවයෙ යොදවන්ඩ."

# 10

තද කළු පැහැති දෑස් ඇති මිනිසා වර්ජිනියාගේ තට්ටු නිවාසය අසල මෝටර් රිය ගාල් කොට බලා සිටියේය.

මුළින්ම මෝටර් රිය ද ඉන්පසු එහි රියැදුරුද දුටු වර්ජිනියා, කිසිවෙකුගේ අවධානයට ලක් නොවෙමින් ඇගේ රථය දිගටම ඉදිරියට පදවාගෙන ගියාය.

ඉන්ධන පිරවුම් හලක රිය නැවැත්වූ වර්ජිනියා, මේසන් හට දුරකතන ඇමතුමක් ලබාගත්තාය.

''අර මිනිහා මගෙ අපාට්මන්ට් එක පල්ලෙහා ඉන්නවා,'' නීතිඥයා දුරකතනයට පැමිණි සැනින් ඇය කීවාය.

''කලින් ආපු කෙනාමද?'' මේසන් ඇසුවේය.

''ඔව්.''

''කමක් නෑ,'' මේසන් කීවේය. ''දැන් ගෙදර යන්ඩ. බලන්ඩ එයාට මොනවාද ඕනෙ කියලා. පුළුවන්කමක් තිබ්බොත් මට එයා ඉන්න අතරවාරෙම කෝල් කරන්ඩ.''

දුරකතනය ආපසු තැබූ ඇය තට්ටු නිවාසය වෙත ගොස් රථය ගාල් කොට ඇගේ නිවස වෙත ගියාය.

ඇය නිවසට ඇතුලු වී විනාඩි කිහිපයක් ගතවනවිටම දොර සීනුව නාද විය.

දොරෙහි ආරක්ෂක දම්වැල නොපන්නාම ඇය දොර මදක් විවෘත කොට තද කළු පැහැති දෑස දෙස බැලුවාය.

"ආ, මිස්ට මෙනාඩ්," ඇය කීවාය. "ඔයාට හොයපු දේ ලැබුණ ද?"

මිනිසා මිත්‍රශීලී මදහසක් පෑමට උත්සාහ කළේය. "අනේ ඒ ගැන කතා කරගන්ඩ තමයි මම ආවෙ. මම ඇතුලට එන්ඩ ද?"

ඇය ක්ෂණික දෙගිඩියාවකට පත්වුවද, "කමක් නෑ, එන්ඩ." යයි හෘදයංගම ලෙස කියමින් දොරෙහි දම්වැල පැන්නුවාය.

නිවසට ඇතුලු වූ ඔහු වාඩි වූයේය. "මම දූන් ඇත්තම කියන්ඩයි යන්නෙ." ඔහු කීවේය.

වර්ජිනියා සිය දෑබැම ඔසවා විස්මය පල කළාය.

"මට ඕනෙ කළේ ස්මිත් කියලා කෙනෙක් එක්ක ගහපු ඇග්‍රීමන්ට් එකක් නෙමෙයි." ඔහු කීවේය. "මට ඕනෙ වෙනත් දෙයක්."

"එහෙනං මොකද්ද?" ඇය ඇසුවාය.

"අවුරුදු කීපෙකට කලින් මිස්ට බැනොක් අන්තිම කැමති පත්‍රයක් පිළියෙල කළා ලොරේටා ට්‍රෙන්ට් කියලා කෙනෙක් වෙනුවෙන්. මම දන්න තරමින් දෙකක් පිළියෙල කළා. දූනට මම මොනවාත් නොකියන්ඩ හිතාගෙන ඉන්න හේතු කාරණා නිසා ඒ අන්තිම කැමති පත්‍ර දෙකේ පිටපත් හොයාගන්න එක බොහොම වැදගත් වෙලා තියෙනවා. අඩුම ගානෙ අවසානයට පිළියෙල කරපු අන්තිම කැමති පත්‍රය හරි."

වර්ජිනියා ඇගේ විස්මය ප්‍රදර්ශනය වීමට ඉඩ හැරියාය. "ඒත් අපි ගාව අපි තියාගන්නෙ කාබන් කොපි විතරයිනෙ. මිසිස් ට්‍රෙන්ට් ළඟ තමයි ඔරිජිනල් කඩදාසි තියෙන්නෙ."

"ඒක එහෙමමත් නෑ." ඔහු කීවේය.

"ඒත් කාබන් කොපි එකකින් කාටවත් තියෙන ප්‍රයෝජනේ මොකද්ද?"

"ඒවා හොයන උදවිය ඉන්නවා."

ඇය නැවතත් දෙබැම එසෙව්වාය.

''එක පුද්ගලයෙක් ඉන්නවා, මේ කාබන් කොපිය තමුන් අතට ගන්ඩ ඕනෙම දෙයක් කරන්ඩ ලෑස්තිවෙලා ඉන්න. මට ඕනෙ ඒ පුද්ගලයාට උගුලක් අටවන්ඩ.''

''කොහොමද?''

''ඔයා කිව්වා නේද, මිස්ට බැනොක්ගෙ පරණ ටයිප් රයිටරේ ඔයා ගාව තියෙන්නෙ කියලා?''

''ඔව්, මිස්ට බැනොක් මට ඒක දුන්නා.''

''ඒක පරණ මොඩල් එකේ එකක් ද?'' ඔහු ලියන මේසය මත වූ යතුරුලියනය වෙත දෑස යවමින් ඇසුවේය.

''ඔව්.''

''එහෙම නම් ඔයාට පුළුවන් ඒ ටයිප් රයිටරෙන් අන්තිම කැමති පත්‍රයක කාබන් කොපියක් හදලා දෙන්ඩ. ඒකට අවුරුදු තුන හතරක් පරණ දිනයක් දාන්ඩ ඕනෙ. ඒ කොපිය මිස්ට බැනොක්ගෙ සහෝදරයා ළඟ තියෙන ලියකියවිලි අස්සට දැම්මා නම්, මම අර කියලු පුද්ගලයා රවටෙන්ඩ ඉඩ තියෙනවා.''

''ඒත් ඒකෙන් වෙන හොඳේ මොකද්ද?'' ඇය ඇසුවාය.

''ඒකෙන් ලොකු හොඳක් වෙනවා... මම හිතනවා ඔයා ලෑස්ති ඇති මිස්ට බැනොක්ගෙ ක්ලයන්ට් කෙනෙක් වෙලා හිටපු කෙනෙකුට උදව් කරන්ඩ?''

ඇගේ මුහුණ කලඑළි විය. ''ඒ කියන්නෙ මිසිස් ලොරේටා ට්‍රෙන්ට්ද මේ වැඩේ කරන්ඩ කියලා ඉල්ලන්නෙ?''

''නෑ, ලොරේටා ට්‍රෙන්ට් ඒ වගේ ඉල්ලීමක් නොකරන්ඩ හේතු තියෙනවා. ඒත් මම එයා වෙනුවෙන් සහ එයාගෙ හොඳට තමයි මේ ඉල්ලීම කරන්නෙ.''

''ඒ කියන්නෙ, ඔයා මිසිස් ට්‍රෙන්ට් එක්ක යම් ආකාරයකින් සම්බන්ධයක් තියෙනවාද?''

''මම එයා වෙනුවෙන් කතා කරනවා.''

"ඇයි ඔයා එහෙම කරන්නෙ කියලා මම ඇහුවාට කමක් නැද්ද?"

ඔහු මදහසක් පෑවේය. "සමහර වෙලාවට ඔය වගේ ප්‍රශ්නවලට සල්ලි වලින් උත්තර දෙන්ඩ පුළුවන්."

ඔහු සාක්කුවෙන් පසුම්බියක් ගෙන ඩොලර් සීයේ නෝට්ටුවක් ඉවත ඇද්දේය. ඉන්පසු නෝට්ටුවකට පසු තවත් නෝට්ටුවක් ඇයට පෙනෙන පරිදි ඉවතට ගත් ඔහු ඩොලර් පන්සීයක් දක්වා මුදල් ප්‍රමාණය වැඩි කළේය. ඔහු ඩොලර් සීයේ නෝට්ටු පහ මේසය මතට දැමුවේය.

ඇය මුදල් දෙස බැලුවේ සිතිවිල්ලෙන් බරවය. "අපි ප්‍රවේසම් වෙන්ඩ ඕනෙ," ඇය කීවාය. "මිස්ට බැනොක් පාවිච්චි කලේ එයාගෙ නමයි ඇඩ්‍රස් එකයි ගහපු කඩදාසි."

"මම ඒ බව දැනගෙන හිටියෙ නෑ." මිනිසා කීවේය.

"කමක් නෑ, මගෙ ළඟ ඒ කඩදාසි තියෙනවා." ඇය කීවාය. "හැබැයි ටයිප් කළාට පස්සෙ අපිට ඒවා විනාශ කරලා දාලා කාබන් කොපි විතරක් තියාගන්ඩ වෙනවා."

"ඔයාට ඒ වැඩේ හොඳින් කරන්ඩ පුළුවන් කියලා, මම හිතනවා." ඔහු කීවේය.

"මට ඔයා සහතික වෙන්ඩ ඕනෙ, මේ කාබන් කොපි නිසා කිසිම වංචාසහගත දෙයක් නොකෙරෙන බවට."

"අනිවාර්යයෙන්ම," ඔහු කීවේය. "මේවා පාවිච්චි කරන්නෙ මිසිස් ට්‍රෙන්ට්ගෙ නෑදැයින්ට කරදර කරන්ඩ බලාගෙන ඉන්න කෙනෙකුට විරුද්ධව විතරයි."

"මට මේ ගැන හිතලා බලන්ඩ වෙනවා," ඇය දෙගිඩියාවට පත්වෙමින් කීවාය.

"එහෙම බෑ, මිසිස් බැක්ස්ටර්. අපි මේක කාලයත් එක්ක කරන සටනක්. මේ වැඩේ කරනවා නම් දැම්මම කරන්ඩ ඕනෙ." ඔහු යතුරුලියනය වෙත ඇස් යොමමින් කීවේය.

"මොනවාද මේ අන්තිම කැමැත්තෙ මම දාන්ඩ ඕනෙ?"

"සාමාන්‍ය විදිහට පටන්ගන්ඩ. තමුන්ගෙ නෑදෑයො තමුන් ගැන ඒ හැටි තැකීමක් නොකරන නිසා, තමාගේ සහෝදරිය වන ඩයනාට ඩොලර් ලක්ෂයකුත් අනිත් සහෝදරිය වන මැක්සීන්ට ඩොලර් ලක්ෂයකුත් දෙන බවත් ඔවුන්ගේ ස්වාමි පුරුෂයින් දෙදෙනාට ඩොලර් දහදාහ බැගිනුත් ඉතිරි සියල්ල තමාගේ විශ්වාසවන්ත රියදුරා වන ජෝජ් ඊගන් හට පවරා දෙන බවත් ලියන්ඩ."

"ඒත් මට තේරෙන්නෙ නෑ, මේකෙන් වෙන හොඳේ මොකද්ද කියලා." ඇය කීවාය.

"ඊටපස්සෙ ඔයා තවත් අන්තිම කැමති පත්‍රයක් හදන්ඩ, මිස්ට බැනොක් අභාවප්‍රාප්ත වෙච්ච දවසට දින කීපෙකට කලින් දිනයක් දාලා. ඒකෙ ලියන්ඩ, තමාගේ සහෝදරියන් දෙදෙනා සහ ඔවුන්ගේ ස්වාමි පුරුෂයන් තමා හට කිසිදු ආදර කරුණාවකින් නොසලකන හෙයින් සහෝදරියන් එක් අයෙකුට සහ ඔවුන්ගේ ස්වාමිපුරුෂයන්ට, එක් යුවලකට ඩොලර් දාහ බැගින් ලබා දෙන අතර ඉතිරි සියල්ල, තමාගේ විශ්වාසවන්ත රියැදුරු, ජෝජ් ඊගන් වෙත උරුම කරන බව."

ඇය කිසිවක් කීමට සූදානම් වුවද ඔහු අතක් ඔසවා ඈ වැලකුවේය.

"ඔය ලියවිලි දෙක නිසා, අර මම කියාපු පුද්ගලයා නොමග යනවා." ඔහු කීවේය.

"ඒත් මොකද්ද ඇති වැඩේ?" ඇය ඇසුවාය. "මම එක සාක්ෂිකාරයෙක් හැටියට ලියවිලිවලට අත්සන් කරනවා තමයි, ඒත් කවුරුහරි මගෙන් ඇහුවොත් මේ ගැන මට කියන්ඩ වෙනවා මම මේවා බොහොම ළඟකදි ටයිප් කළේ කියලා."

"ඒවා ඔක්කොම මට භාර දෙන්ඩ." ඔහු කීවේය. "ඔය මේසෙ උඩ තියෙන ඩොලර් පන්සීය අතට අරගෙන ටයිප් කරන්ඩ පටන්ගන්ඩ."

"මට ඔයා මෙතන ඉන්නකොට ටයිප් කරන්ඩ අමාරුයි. ඔයා දැන් ගිහිල්ලා පස්සෙ වෙලාවක එන්ඩ." ඇය කීවාය.

"එහෙම බෑ." ඔහු කීවේය. "මට වැඩි වෙලාවක් නෑ. ඔයා දැන් ටයිප් කරන්ඩ. මම ඒවා අරගෙනම යන්නං."

කුමක් කළ යුතු දැයි තීරණයක් ගැනීමට වර්ජිනියාට නොහැකි වූ නමුත් මේසන්ගේ අවවාදය සිහිපත් වූ ඇය බැනොක්ගේ පැරණි කඩදාසි භාවිතා කරමින් සහ අලුත් කාබන් කඩදාසි යොදා ගනිමින් යතුරු ලියනය ඇරඹුවාය.

විනාඩි තිහකට පසු ඇය කඩදාසි සියල්ල අමුත්තා වෙත පිරිනැමුවාය.

"හරි, මම මේවා ගන්නං." ඔහු කාබන් පිටපත් සියල්ල සාක්කුවේ රුවා ගනිමින් කීවේය. "ඔරිජිනල් ටික විනාශ කරලා දාන්ඩ. කෝකටත් මම ම ඒවා විනාශ කරන්නං." කියූ ඔහු මුල් පිටපත් සියල්ල ද තමා අතට ගත්තේය.

දොර වෙත ගිය ඔහු, "ඔයා හොඳ ළමයෙක්," කියමින් පිටවී ගියේය.

වර්ජිනියා වහා දුරකතනය වෙත ගියාය. ඇය ඇමතුවේ මේසන්ටය. සිදු වූ සියල්ල ඔහු නීතිඥයාට කීවාය.

"ඔයා ළඟ පිටපත් මොනවාත් නැද්ද?" මේසන් ඇසුවේය.

"කාබන් කොල විතරයි. මම හැමතිස්සෙම හැම කොලේකටම අලුත් කාබන් කොලයක් දාලා තමයි ටයිප් කලේ. ලයිට් එකකට අල්ලලා ඒකේ තියෙන දේවල් බලාගන්ඩ පුළුවන්."

"හරි, පුළුවන් තරම ඉක්මනට ඒවාත් අරගෙන මගෙ ඔෆිස් කට එන්ඩ." මේසන් කීවේය.

# 11

වර්ජිනියා විසින් ගෙන එනු ලැබූ කාබන් කොපි මේසන්ගේ අවධානයට පාත්‍ර විය.

ඔහු ඩෙලා වෙත හැරුණි. ''ඩෙලා, මේ කාබන් කොලවල සයිස් එකට හරියන කාඩ්බෝඩ් ෆයිල් එකක් ගන්ඩ. ඒවා කවරෙක දාලා සීල් කරන්ඩ.''

ඔහු නැවත වර්ජිනියා වෙත හැරුණේය. ''ඔයා ඒ සීල් එක උඩ අත්සන් කරන්ඩ.''

''ඒ මොකටද?'' වර්ජිනියා ඇසුවාය.

''ඔයා මේ කවරේ ලියාපදිංචි තැපෑලට දාන්ඩ.'' මේසන් කීවේය. ''ඔයාට ලියුම ආවහම ඒක කඩන්නෙ නැතුව තියාගන්ඩ.''

''හරි මට තේරෙනවා,'' වර්ජිනියා කීවාය. ''එතකොට මට පුළුවන් ඔප්පු කරන්ඩ දිනය ගැන-''

''අන්න හරි.'' මේසන් කීවේය. ''දැන් තැපැල් කන්තෝරුවට ගිහින් ගෙදර යන්ඩ. ඔයාගෙ ගෙදර ඇතිවෙන්ඩ කෑම බීම තියෙනවාද?''

''ඔව්, ඇයි?''

''පැය විසිහතරක් යනකං, ගේ ඇතුලටම වෙලා ඉන්ඩ. කිසි කෙනෙක් වැද්දගන්ඩ එපා.''

"ඔයා හිතනවාද මට මොකක් හරි වෙයි කියලා?"

"කවුද දන්නෙ ? එක පාරක් ඔයාගෙ නම කැත කරන්ඩ උත්සාහයක් ඇති වුණා. ආයෙ පාරක් එහෙම දෙයක් වෙනවාට මම කැමති නෑ."

"ඒක හරි, මාත් කැමති නෑ." කියූ ඇය කාර්යාලයෙන් පිටවූවාය.

"වීෆ් ඇයි හිතන්නෙ, එයාට තර්ජනයක් තියෙනවා කියලා? " ඩෙලා ඇසුවාය.

"පොඩ්ඩක් හිතන්ඩ," මේසන් කීවේය. "එයාගෙ නම කැත කරන්ඩ උත්සාහයක් තිබුණා. දැන් මේ වෙන කොට අලුත් අන්තිම කැමති පත්‍රයක පිටපත් තියෙනවා. ඒක පිළියෙල කරපු සහ එක සාක්ෂිකාරයෙක් වන ඩෙලානෝ බැනොක් මැරිලා. අපි හිතමු ලොරේටා ට්‍රෙන්ට්ගෙ ගේ ගිනි අරගෙන, එයාත් මැරිලා අන්තිම කැමති පත්‍රයෙ කාබන් කොපිය, ඒකෙන් වාසි ලබන කෙනා ඉදිරිපත් කළා කියලා. එතකොට තියෙන එකම බාධාව වර්ජිනියා විතරයි. එයා අනිත් සාක්ෂිකාරිය නිසා. වර්ජිනායාත් මැරිලා හිටියොත් අර යකාට වැඩේ කොච්චර ලේසි ද?"



# 12

මේසන් කාර්යාලය වසා දමා යාමට සැරසෙන විටමය ඇල්ටන් වෛද්‍යවරයා දුරකතන ඇමතුම ලබාගත්තේ.

''මම දූන් ආවාට කමක් නැද්ද?'' ඇල්ටන් ඇසුවේය. ''මට වැඩ ගොඩාක් තිබුණා. දූනුයි ඉවර වුණේ.''

''හරි, මම ඉන්නං.'' මේසන් කීවේය.

''විනාඩි දහයකින් මම එන්නං.'' කියූ වෛදනා රිසිවරය ආපසු තැබුවේය.

ඩෙලා ස්ට්‍රීට් මද වේලාවකින් පිළිගැනීමේ ශාලාවට ගියේ වෛද්‍යවරයා කැටුව ඒම සඳහාය.

''ඩොක්ටර් ෆෙරිස් ඇල්ටන්,'' ඇය වෛද්‍යවරයා මේසන් ගේ කාමරයට ඇතුලුවත්දී කීවාය.

ඇල්ටන් වෛද්‍යවරයා මේසන් හට අතට අත දුන්නේය. ''මම ගෙනාවා කුප්පි දෙකක්, මේසන්.'' ඔහු කීවේය. ''එකක හිස කෙස්, අනිකෙ නියපොතු. ඔයා මේවා ටෙස්ට් කරනවාද, නැත්තං මම කරන්ඩ ද?''

''මං හිතන්නෙ මම ඒක කරන එක වඩාත් ආරක්‍ෂා සහිතයි.'' මේසන් කීවේය. ''අනිත් එක, ප්‍රතිඵල ඉක්මනින් ලැබෙන බව මම දන්නවා. ඔයා මොනවා කියල ද මේ සාම්පල් ගත්තෙ?''

"ලොරේටා ට්‍රෙන්ට් ළඟ ඉන්න නර්ස්ට මම කිව්වා, මම හොට බේතක් නියම කරන්ඩ යනවා, ඒ බේත නිසා ඇගේ කැසීම් ඇතිවෙන්ඩ පුළුවන්. ඒ නිසා, එයාගෙ නියපොතු කපන්ඩ කියලා. ඊටපස්සෙ මම කිව්වා, එයාගෙ අසාත්මික තාවයට හේතුව ෂැම්පූ හරි, හෙයා ඩයිද කියලා දැනගන්ඩ හිස කෙස් කීපයක් ගන්ඩ කියලා."

"නර්ස් මොනවාත් සැක කළේ නැද්ද?"

"නෑ. එයා මම කියපු විදිහටම වැඩේ කරලා තිබ්බා."

"ඔයා එයාගෙ කෑම බීම ගැන විස්තරයක් ගත්ත ද?"

"නෑ, ඒත් එයා මෙක්සිකන් කෑම කාපු වතාවල්වල තමයි ඔය ලෙඩේ ඇවිල්ලා තිබුණෙ."

"එතකොට ඒ කෑම එයා කොහෙන්ද කාලා තිබුණෙ?" මේසන් ඇසුවේය.

"ලොරේටා ට්‍රෙන්ට්ට ඉන්නවා ජෝජ් ඊගන් කියලා ඩ්‍රයිවර් කෙනෙක්. ලොරේටා ඔය හාදයාට බොහොම හිතවත්. අසාමාන්‍ය හිතවත්කමක් තියෙනවාද කියන්ඩ මම දන්නෙ නෑ. හැබැයි ඊගන් හාදයා අවුරුදු පහළොවකින් විතර ලොරේටාට බාලයි. ඔය ඊගන් තමයි ලොරේටාට මෙක්සිකන් කෑම ඕනෙ උනහම ඒවා හදලා දෙන්නෙ."

"එයා තනියම ඒ කෑම කෑවා වෙන්ඩ බැනෙ. කෙනෙක් මෙක්සිකන් කෑම වගේ දේවල් කන්නෙ පාටියක් වගේ වෙලාවට. එතකොට, ඒ කෑම කාපු අනිත් අයට මොකද වුණේ?"

"මම ඒ ගැන හෙව්වෙ නෑ." වෛද්‍යවරයා කීවේය. "මට කොහොමටත් මුලින් ආසනික් ගැන කිසිම දෙයක් ඔලුවට ඇවිත් තිබුණෙ නෑ. මම හිතුවෙ අසාත්මිකතාවක් කියලා. අසාත්මිකතාවක් එක්කෙනෙකුට මිසක් කට්ටියකට ඇති වෙන්නෙ නෑ."

"එහෙමද?" මේසන් සිතිවිල්ලෙන් බරව කීවේය.

"වහ දුන්නෙ කවුරු වුණත් ඒක බොහොම දක්ෂ විදිහට කරලා තියෙනවා." ඇල්ටන් කීවේය.

''මම ඔයාට මෙහෙම යෝජනාවක් කරන්නං,'' මේසන් කීවේය. ''නර්ස්ලා තුන්දෙනෙක් එයා ගැන බලන්ඩ දාන්ඩ, පැය විසිහතර පුරාම.''

''ඒක හරියන වැඩක් නෙමෙයි.''

''ඇයි?''

''අපි කටයුතු කරන්නෙ පොඩි ළමයෙක් එක්ක නොවන නිසා. ලොරේටා ට්‍රෙන්ට් කියන්නෙ තමුන්ගෙ නිදහස අගය කරන වැඩිහිටි ගෑනු කෙනෙක්.''

''දැනට නර්ස්ලා කීදෙනෙක් ඩියුටි ඉන්නවා ද?'' මේසන් ඇසුවේය.

''එක්කෙනයි, ඇනා ෆ්ලිච් කියලා දක්ෂ ළමයෙක්. කොහොම වුණත් මම පියවර අරගෙන තියෙනවා, ලොරේටාව ප්‍රවේසම් වෙන විදිහට, අඩුගානෙ මේ ලැබ් රිපෝට් එක එනකං. රිපෝට් එක පොසිටිව් වුණොත්, මට කොහොමත් දැන් හිතෙනවා පොසිටිව් වේවි කියලා, මට කෙලින්ම එයාට කියන්ඩ පුළුවන්, එයාට කවුරු හරි ආසනික් දීලා තියෙනවා, ඒ නිසා ප්‍රවේසම් වෙන්ඩ කියලා.''

''මොනවාද ඔයා අරගෙන තියෙන පියවර?'' මේසන් උනන්දුවෙන් ඇසුවේය.

''මම නර්ස්ට කිව්වා, හෙට උදේ මට ටෙස්ට් එකක් කරන්ඩ තියෙන නිසා ලොරේටාට තම්බපු බිත්තරයි, රෝස් කරපු පානුයි ඇර මොනවාත් කන්ඩ දෙන්ඩ එපා කියලා. බිත්තරත් කටුව පිටින්ම මේසෙට ගේන්ඩ කිව්වා, මොනවාත් කුලු බඩු එකතු කරන්ඩ විදිහක් නැති වෙන්ඩ. රිපෝට් එක ආවාට පස්සෙ මට හයිය තියෙනවා, ලොරේටාට ඇත්ත කියන්ඩ.''

''ඒත් එතකොට එයාගෙ නෑදෑයො කලබල වෙයි. සමහරවිට ඔයාට චෝදනා කරන්ඩ පුළුවන්, ඔයා එයාගෙ ආදර කරුණාව ලබන්ඩ නොවුමනා උත්සාහයක් ගන්නවා කියලා.'' මේසන් පෙන්වාදුන්නේය.

''මට ඒකට කරන්ඩ දෙයක් නෑ.'' ඇල්ටන් කීවේය. ''වෛද්‍යවරයෙක් හැටියට මම මගේ යුතුකම කරන්ඩ ඕනෙ. ඔයා හිතන්නෙ කීයට විතර ඔය රිපෝට් එක ගන්ඩ පුළුවන් කියල ද?''

"අද රෑට පුළුවන්. මට ඔයාට රෑට කතා කරන්ඩ පුළුවන් ටෙලිෆෝන් නොම්මරයක් දීලා යන්ඩ, ඩොක්ටර්."

"මම දෙන්නං, මම ඔයා කෝල් කරනකං බලං ඉන්නවා. ඒ වගේම ඔයා මේ හැම දෙයක්ම පොලිසියෙනුයි, පත්තර වලිනුයි ඈත් කරලා තියා ගන්නවා නේද?"

"ඔව්. මේ සම්බන්ධව මට ක්ලයන්ට් කෙනෙක් නෑ. හරිනං මගෙ ක්ලයන්ට් වෙන්ඩ ඕනෙ ලොරේටා ට්‍රෙන්ට්. ඒත් රිපෝට් එකේ මොනවා තිබුණත් මම කැමති නෑ, ඒ විදිහට ලොරේටා ට්‍රෙන්ට්ට කතා කරන්ඩ."

"ඒ ගැන ඔයා හිතන්ඩ එපා. මම එයාට කතා කරන්නං." ඇල්ටන් කීවේය.

ඇල්ටන් වෛද්‍යවරයා පිටත්ව ගිය පසු ඩෙලා ඉක්මන් බැල්මක් මේසන් වෙත හෙලුවාය. "චීෆ්, ඔයා දොස්තර ගැන මොකද හිතන්නෙ?"

"මං මේ කල්පනා කළේ ලොරේටාගෙ අන්තිම කැමැත්තෙ දොස්තරත් ප්‍රතිලාභ හිමියෙක් ද කියලා." මේසන් කල්පනාවෙන් බරව කීවේය.

"දෙයියො සාක්කි," ඩෙලා කීවාය. "ඔයා හිතනවාද...?"

"ඒක තමයි." මේසන් කීවේය. "හෙණ පටලැවිල්ලක් වෙනවා එහෙම වුණොත්."

"එතකොට එයා අන්තිම කැමැත්තෙ ප්‍රතිලාබ හිමියෙක් වුණත්, චීෆ් එයාට රිපෝට් එක ගැන කියනවා ද?"

"ඔව්. වෙන කරන්ඩ දෙයක් නෑ. හැබැයි මම වගබලා ගන්නවා ලොරේටා ට්‍රෙන්ට් රිපෝට් එකේ තියෙන හැම දෙයක්ම දැනගන්න බවටත් එයාගෙ ආරක්ෂාව සැලසෙන බවටත්. දැන් අපි රෑ කෑමට යමු. යන ගමන් ලැබ් රිපෝට් එක ගමු."

"එහෙම උනොත් දොස්තර කංකෙඳිරි ගාවි." ඩෙලා කීවාය.

"ඔව්, ඊට වඩා දෙයක් වුණත් කරන්ඩ පුළුවන්."

# 13

මේසන් සහ ඩෙලා රාත්‍රී ආහාර ගැනීම සඳහා ආපනශාලාවේ මේසයට වාඩිවීමට පෙරම, වේටර්වරයාට දන්වා සිටියේ දුරකතන ඇමතුමක් ලැබීමට නියමිත බවත් එය පැමිණි වහා ඔවුනට දැනුම් දෙන ලෙසත්ය.

ඒ අනුව වේටර්වරයා මේසන්ගේ මේසය වෙත වැඩි අවධානයක් යොමු කරගෙන සිටියේය.

''ලැබ් එක අපේ රිපෝට් එක ලෑස්ති කරලා කෝල් කරන බවයි, පෝල් ඩ්‍රේක් අපේ අනිත් වැඩ කරන බවයි දැනගෙන කෑම කකා ඉන්ඩ තියෙන එකත් එක්තරා විදිහක පිනක් නේද, ඩෙලා?'' මේසන් ඇසුවේය.

''ඔන්න කියනකොටම වේටර් එනවා,'' මේසන්ගේ මානසික ස්වභාවය වෙත ඔච්චම් බැල්මක් හෙලමින් ඩෙලා කීවාය.

රැහැන ද සමග දුරකතනය ඇදගෙන ආ වේටර්වරයා එය මේසන් හට පිරිනැමුවේය. ''සර්ගෙ කෝල් එක,''

''තැන්ක් යූ,'' කියමින් රිසිවරය අතට ගත් මේසන්, ''හලෝ, මේසන් කතා කරන්නෙ,'' යයි කීවේය.

''මේ කතා කරන්නෙ ලැබ් එකෙන්.'' අනිත් අන්තයෙන් පිළිතුරු ලැබිණි. ''අපට දීපු සාම්පල්වල ආසනික් තියෙන බව පෙන්නුම් කරනවා.''

''කොච්චර විතර ප්‍රමාණයක්ද?'' මේසන් ඇසුවේය.

''අපි ප්‍රමාණය චෙක් කළේ නෑ. පොසිටිව් ද කියලා බැලුවා විතරයි.''

''හොඳයි, කොච්චර ප්‍රමාණයක් තියෙනවාද කියලාත් චෙක් කරන්ඩ පුළුවන්ද?''

''අපට දීලා තියෙන සාම්පල්වල ප්‍රමාණය මදි ඒ වැඩේ කරන්ඩ.''

''හොඳයි, තව අවශ්‍ය වුණොත් මම කතා කරන්නං.'' මේසන් කීවේය.

''මේ ගැන බලධාරීන්ට දැනුම්දෙන්ඩ අවශ්‍ය නැද්ද?''

''එහෙම උවමනාවක් නෑ.'' මේසන් කීවේය. ''හැම දෙයක්ම දැනට රහසේ තියාගන්ඩ.''

වේටර්වරයා අතට ඩොලර් දහයක සන්තෝෂමක් දුන් මේසන් ඩෙලා ද කැටුව ආපනශාලාවෙන් පිටවී දුරකතන කුටියක් වෙත ගියේය. ඔහු ඇල්ටන් වෛද්‍යවරයාගේ අංකය ඇමතුවේය.

''හලෝ, හලෝ,'' වෙදනා වහා පිළිතුරු දුන්නේ ඇමතුම ලැබෙන තුරු ඇඟිලි ගණිමින් සිටි බවක් පල කරමිනි.

''මම මේසන් කතා කරන්නෙ. අර රිපෝට් එක ආවා. ආසනික් පොසිටිව්.'' නීතිඥයා කීවේය.

තරමක නිහැඬියාවක් ඇති විය. ''හෙණ ගහපං,'' යනුවෙන් ඇල්ටන් කියනු මේසන්ට ඇසුනි.

''එහෙමනං ඩොක්ටර්, එයා ඔයාගෙ ලෙඩා. ඔයාගෙ යුතුකම තමයි දැන් තියෙන්නෙ.'' ඔහු කීවේය.

''මේ අහන්ඩ මේසන්, මම මේ දහඅතේ කල්පනා කරන්නෙ මොකද්ද කරන්නෙ කියලා. මට සැහෙන්ඩ විශ්වාසයක් තියෙනවා, ලොරේටා ට්‍රෙන්ට්ගෙ අන්තිම කැමැත්තෙන් මටත් මොනවා හරි වෙන්කරලා තියෙනවා කියලා. ඒ අස්සෙ මම ගිහින් ලොරේටාට ආසනික් ප්‍රශ්නෙ කිව්ව ගමන් එයාගෙ නෑයො ටික පරල වේවි. ඒගොල්ලන්ට වෙන දොස්තර කෙනෙක්ගෙ නිගමන ඕනෙ වේවි. එහෙම වෙන ඩොක්ටර් කෙනෙකුත් ආසනික් විෂ වීමක් තියෙන

බව කිව්ව හැටියෙ මට චෝදනාවක් එන්ඩ පුළුවන් මගෙ කොටහා ඉක්මනට ගන්ඩ තියෙන කෑදරකමට මම ලොරේටාට වැඩේ ඇඹරුවා කියලා.''

''එතකොට ඔයා මේ ගැන නොකියා හිටියොත් මොකද වෙන්නෙ කියලා හිතන්ඩ ඩොක්ටර්.''

''ඒක තමයි. මට එක තැනක ඉඳලා කල්පනා කරන්ඩ බැරි නිසා මම ඇවිද ඇවිද කල්පනා කළේ. ඔයාටත් පුළුවන් ද මම යන වෙලාවට ලොරේටාගෙ ගෙදරට එන්ඩ?''

''මොකද්ද ඇඩ්‍රස් එක?''

''නොම්මර විසිඑකෙන් දොළහ, ඇලීෂියා ඩ්‍රයිව්. ලොකු ගෙයක්. සමහරවිට මම ඔයාට කලින් එතෙන්ට යාවි. එහෙම වුණොත් මම ඔයා එනකං ඉන්නං.'

''හරි, මම මගෙ සෙකට්‍රිත් එක්ක එන්නං.'' මේසන් දුරකතනය ආපසු තැබුවේය.

''පෝල්ට කෝල් එකක් දීලා අපි ලොරේටා ට්‍රෙන්ට්ගෙ ගෙදරට යනවා කියලා කියන්ඩ. ඩොක්ටර් තනියම යනවාට වඩා මෙහෙම වෙච්ච එක හොඳයි.''

# 14

ඇලීෂියා ඩ්‍රයිව් සොයා ගැනීමට මේසන් හට අපහසුවක් නොවුණි. ඔහු ඩෙලා සමග රිය පදවාගෙන ගොස් ඇල්ටන් වෛද්‍යවරයාගේ රිය අසල නතර කළේය.

ඇල්ටන් ඔවුන් දුටු වහා සිය රථයෙන් බැස මේසන් වෙත පැමිණියේය.

"අපි ඇතුළට යමු," ඇල්ටන් කීවේය. "මම ඉස්සෙල්ලා යන්නං. ඕගොල්ලො මගෙ පස්සෙන් එන්ඩ."

"කාර් දෙක ම ඇතුළට ගමු කියල ද කියන්නෙ?" මේසන් ඇසුවේය.

"ඒකට කමක් නෑ, ඕනෙ තරං ඉඩ තියෙනවා."

මේසන් වෙදනා පසුපසින් රිය පදවාගෙන ගියේය. ඔහු රථය නැවැත්වූ තැනට පිටුපසින් ස්වකීය රථය නතර කළ මේසන්, ඩෙලා හට රියෙන් බැසීම සඳහා දොර විවෘත කළේය.

වෛද්‍ය ඇල්ටන් දොර සීනුව නාද කළ අතර සේවකයෙකු විසින් දොර අරිනු ලැබේවි යයි ඔහු බලාපොරොත්තු වූ බව පෙනුන ද ඔවුන් පිළිගනු ලැබුවේ මැදිවියේ මිනිසෙකු විසිනි.

"ආ, ඩොක්ටර්, මොකද මේ වෙලාවෙ?" ඔහු ඇසුවේය.

"මම මේ මේ හරියෙන් යන ගමං මිසිස් ට්‍රෙන්ට්ව බලන්ඩ ආවා." ඇල්ටන් කීවේය.

"එතකොට මේ අය?" මේසන් සහ ඩෙලා දෙස බලමින් නිවැසියා ඇසුවේය.

"ඒ ගොල්ලො මාත් එක්ක ආවෙ. යමු ඇතුළට." ඇල්ටන්, මේසන් දෙස බලමින් කීවේය.

"පොඩ්ඩක් ඉන්ඩ, මේ පෙරී මේසන් කියන ලෝයර් නේද? මම එයාගෙ ෆොටෝ එක දැකලා තියෙනවා පත්තර වලින්." නිවැසියා මග හරස් කරමින් කීවේය.

"හරි මේ තමයි, පෙරී මේසන්, ඒ වගේම එයා එක්ක ඇවිල්ලා ඉන්නෙ ඩෙලා ස්ට්‍රීට්, මේසන්ගෙ සෙකට්‍රි." ඇල්ටන් කීවේය. "මේ මිස්ට බොරින් බ්‍රිග්ස්, මගෙ රෝගියාගෙ සහෝදරීගෙ ස්වාමිපුරුෂයා."

බ්‍රිග්ස් අඳුන්වාදීම ගණනකටවත් නොගත්තේය. "ඇයි මොකද්ද වෙලා තියෙන්නෙ? ලොරේටා ආයෙමත් අන්තිම කැමැත්තක් ලියන්ඩ හදනවා ද? එයාට ආයෙත් පිස්සු තද වෙලා ද?"

"ඒක මිසිස් ට්‍රෙන්ට්ගෙන්ම අහගන්න එක හොඳයි." ඇල්ටන් කීවේය. "කොහොමටත් මිස්ට මේසන් ඇවිල්ලා ඉන්නෙ මගෙ ඉල්ලීම පිට."

"හරි, හරි, කේන්ති ගන්ඩ එපා." බ්‍රිග්ස් කීවේය. "දොස්තර කෙනෙකුයි, ලෝයර් කෙනෙකුයි එකපාර එනකොට මම දැනගන්ඩ එපැයැ හේතුව."

"අපි උඩට යමු," ඇල්ටන් කීවේය.

වෛද්‍ය ඇල්ටන් පඩිපෙළ ඔස්සේ ඉහළ මාලයට ගමන් කළ අතර මේසන් සහ ඩෙලා ඔහු පසුපස ගියහ. එක් කාමරයක් අසල නතර වූ ඇල්ටන් දොරට තට්ටු කළේය. දොර අරිනු ලැබුවේ කාන්තාවක විසිනි.

"මේ ඉන්නෙ නර්ස් ඇනා ෆිල්ච්." ඇල්ටන් කීවේය. "පෙරී මේසන් කියන ලොයර් කෙනයි, එයාගෙ සෙකට්‍රි ඩෙලා ස්ට්‍රීට්."

ඇනා ඔවුන් දෙස බැලුවේ පුදුමයෙනි. "ආ, හා," ඇය යන්තමින් කීවාය.

"මිසිස් ට්‍රෙන්ට් කෝ?" ඇල්ටන් ඇසුවේය.

"එයා කොහෙ හරි ගිහිල්ලා?" හෙදිය පිළිතුරු දුන්නාය.

"මොකක්?" වෙදනා තක්කු මුක්කු වූ බව පෙනුනි. "ඇයි මම ඔයාට කිව්වෙ එයාගෙ කෑම ගැන ප්‍රවේසම් වෙන්ඩ කියලා?"

"මම ඩොක්ටර් කියපු විදිහටම එයාට කෑම දුන්නා. ඒත් කොහෙවත් යන්ඩ දෙන්ඩ එපා කියලා ඩොක්ටර් කිව්වෙ නැනෙ."

"ඒක හරි, ඒත් මම එයාගෙ නියපොතුයි හිසකෙසුයි ඉල්ලපුවහම ඔයාට මොනවාත් හිතුනෙ නැද්ද?"

ඇය ඔහුගේ දෑස මගහැරියාය. "මම ඩොක්ටර් කියපු දේ කළා විතරයි."

"මං අහන්නෙ, මොනවා හරි වෙන යමක් ඔයාට හිතුනෙ නැද්ද?"

"මට සැකයක් ඇති වුණා. ඒ නිසා තමයි, මම ම එයාගෙ කෑම පිළියෙල කළේ. එයා ඒවා කෑවා. මම දන්නෙත් නෑ එයා එළියට ගියා කියලා. පස්සෙ තමයි මම දැනගත්තෙ."

"එයා තනියම ද කාරෙක එලවගෙන ගියේ?"

"මං හිතන්නෙ ජෝජ් ඊගන් තමයි කාරෙක එලවන්නෙ."

එවිටම දොර විවෘත වූ අතර බොරින් බ්‍රිග්ස් තවත් මිනිසෙකු සමග කාමරයට ඇතුලු විය. වෛද්‍ය ඇල්ටන් ඔවුන් දෙදෙනා දෙසම බැලුවේ අමු පිළිකුලෙනි.

"මෙතන මොකද වෙන්නෙ කියලා මට දැනගන්ඩ ඕනෙ." බ්‍රිග්ස් කීවේය.

"මම නර්ස්ට උපදෙස් වගයක් දෙනවා." ඇල්ටන් කීවේය.

"ඒකට ලෝයර් කෙනෙක් ඕනෙ ද?"

වෙදනා මෙසන් වෙත හැරුණේය. "මිස්ට මෙසන් මේ ඉන්නෙ අතිත් සහෝදරීගෙ ස්වාමිපුරුෂයා, මිස්ට ගෝඩන් කෙල්වින්."

උඩඟු ලෙසින් මේසන් හට අතට අත දුන් කෙල්වින්, "මොනවාද ඔයා මෙතන කරන්නෙ කියලා මට කියනව ද?" යයි ඇසුවේය.

"මම ආවෙ ලොරේටා ට්‍රෙන්ට් මුණගැහෙන්ඩ." මෙසන් කීවේය.

"මේක කවුරුවත් හම්බවෙන්ඩ තරං සුදුසු වෙලාවක් නෙමෙයි නේද?"

"මම කවදාවත් වෙලාව ගැන හිතුවෙ නෑ. අවශ්‍ය දේ අවශ්‍ය වෙලාවට කළා මිසක්." මේසන් කීවේය.

කෝපයට පත් දෙමස්සිනෝ මුහුණින් මුහුණ බලාගත්හ.

"ඩොක්ටර්, මේ වැඩේ මොකද්ද කියලා කරුණාකරලා කියන්ඩ." බ්‍රිග්ස් කීවේය.

"මම මිසිස් ට්‍රෙන්ට් ගැන වැරදි රෝග විනිශ්චයක් කරා."

"මොකක්?"

"ඔව්."

"ඩොක්ටර් ඒක පිළිගන්නවා?"

"ඔව්."

"අපේ වයිෆ්ලා එළියට ගිහිල්ලා. ඒත් දැන් කොයි මොහොතක හරි ඒවි. අපිට මේ ගැන...." බ්‍රිග්ස් කීවේය.

"අපිට මේ ගැන පැහැදිලි කිරීමක් අවශ්‍යයි." කෙල්වින් කීවේය.

"හරි, මම මුලින් හිතුවෙ මිසිස් ට්‍රෙන්ට්ට තිබුණෙ අම්ල ප්‍රදාහය කියලා. ඒක අසාත්මිකතාවක් නිසා ඇති වුණා කියලයි මම හිතුවෙ."

"එතකොට දැන් ඔයා හිතන්නෙ මොකක් කියල ද?"

"මම දැන් දන්නවා, මිසිස් ට්‍රෙන්ට්ට හිතා මතා ආසනික් කවලා කියලා."

ඇති වූ පීඩාකාරී නිහඬතාවය අස්සේම කාන්තාවන් දෙදෙනෙකු කාමරයට ඇතුළුවන ලදී. ඔවුන් දෙදෙනාගේ පෙනුම බොහෝ දුරට ඒකාකාරී වූ අතර නිතර රූපලාවන්‍යාගාරයන්ට වැදෙන බව පැහැදිලි විය.

"මේ ඉන්නෙ මිසිස් බ්‍රිග්ස්, මෙයා මිසිස් කෙල්වින්." නැවතත් අඳුන්වාදීම ආරම්භ කරමින් ඇල්ටන් කීවේය. "මේ මිස් ස්ට්‍රීට්, මිස්ට පෙරී මේසන්ගෙ සෙකට්‍රි."

''අපිට දැනගන්ඩ පුළුවන්ද මොකද මෙතන වෙන්නෙ කියලා?'' එඩාත් වැඩිමහල් පෙනුමක් තිබූ කෙල්වින් මහත්මිය විමසා සිටියාය.

''ඩොක්ටර් කියනවා, ලොරේටාට ආසනික් දීලා කියලා.'' බ්‍රිග්ස් ගත් කටටම කීවේය.

''ආසනික්?'' ඇය විස්මයෙන් හඬතැලුවාය.

''මොන විකාරයක් ද?'' බ්‍රිග්ස් මහත්මිය කීවාය.

''දොස්තර හිතනවා එයා හරියටම දන්නවා කියලා.'' කෙල්වින් කීවේය.

''එයාට එකපාරක් වැරදුනානං, තව පාරක් වැරදෙන්ට පුළුවනි.'' කෙල්වින් මහත්මිය කීවාය.

''මේ බලන්ඩ,' මේසන් කීවේය. ''මේ ගැන මිසිස් ට්‍රෙන්ට් දැනගන්ඩ ඕනෙ. එතකොට මොනවා හරි කරන්ඩ පුළුවනි. ඒත් මේක ඩොක්ටර් කෙනෙක්ගෙ නිගමනයක් විතරක් නෙමෙයි. ආසනික් දීපු බව ඔප්පු වෙලා තියෙනවා.''

''කොහොමද ඔප්පු වුණේ?'' කෙල්වින් ඇසුවේය.

''ලැබ් රිපෝට් එකකින්.''

''ඔය ලැබ් රිපෝට් ගැන කොහොමද හරියටම විශ්වාස කරන්නෙ?''

''කෙනෙකුට ආසනික් දුන්නහම ඒවා ඒ තැනැත්තාගෙ නියපොතුවලයි හිසකෙස්වලයි තැන්පත් වෙනවා. අපි මිසිස් ට්‍රෙන්ට්ගෙ හිසකෙස් සහ නියපොතු ලැබ් එකට දුන්නා.''

''මේ ගැන පත්තරේකට හරි පොලිසියට හරි කිව්ව ද?'' බ්‍රිග්ස් ඇසුවේය.

''නෑ,'' මේසන් කීවේය. ''මම දන්නවා, නෑදෑයො හැටියට ඔයාලට හිතෙන දේ ගැන. අනවශ්‍ය ප්‍රසිද්ධියක් මේ වගේ දේකට උවමනා නෑ.''

''අනිත් එක,'' ඇල්ටන් කීවේය. ''මිසිස් ට්‍රෙන්ට් කියන්නෙ මගේ රෝගියෙක්. මට එයා ගැන වගකීමක් තියෙනවා. මම එයාට

සෑහෙන කාලයක් ප්‍රතිකාර කරලා තියෙන නිසා මම දන්නවා මේ බව කිව්වහම එයා කොයි විදිහට හැසිරෙයි ද කියලා.''

''ඒක මොකට කියනවාද?'' බ්‍රිග්ස් මහත්මිය කීවාය. ''ලොරේටා පිස්සු නටාවි.''

''තුන් පාරක් ආසනික් දුන්නා කියලා දැනගත්තහම ඕනෙ කෙනෙක් පිස්සු නටයි තමයි.'' වෙදනා කෝපයෙන් කීවේය.

''එයාට ලෙඩ වුණේ මැක්සිකන් කෑම කාලා.'' කෙල්වින් කීවේය. ''ඒවා හැදුවෙ ජෝජ්. අපිත් පළවෙනි පාර ඒවා කෑවා. ඒත් අපිට මොකුත් වුණේ නෑනෙ.''

''කවුද ජෝජ් කියන්නෙ?'' මේසන් ඇසුවේය.

''ජෝජ් ඊගන්, ලොරේටාගෙ ඩ්‍රයිවර්.''

''එයා කුක් කෙනෙක් හැටියටත් වැඩ කරනවාද?''

''ලොරේටා කියන ඕනෙ දෙයක් ඒ යකා කරනවා.''

''අපෝ, ඒ මිනිහා ලොරේටා එක්ක ඇයි හොඳයි කං වැඩියි.'' කෙල්වින් මහත්මිය කීවාය. ''උන්දෑ හදන්නෙ ලොරේටා හිතන විදිහත් වෙනස් කරන්ඩ.''

''ඕගොල්ලො දන්නවාද එයාව මිසිස් ට්‍රෙන්ට්ගෙ අන්තිම කැමති පත්‍රයට ඇතුල් වෙලා ද නැද්ද කියලා?'' මේසන් ඇසුවේය.

සියල්ලෝම ඔවුනොවුන්ගේ මුහුණු බලාගත්හ.

''අන්තිම කැමැත්තෙ මොනවාද තියෙන්නෙ කියලා මෙතන ඉන්න කවුරු හරි දන්නවා ද?'' මේසන් නැවතත් ඇසුවේය.

නැවත වරක් එකිනෙකා අතර බැලුම් හුවමාරු විය.

''අපිට කරන්ඩ තියෙන හොඳම දේ තමයි, මිසිස් ට්‍රෙන්ට්ව මෙහාට ගෙන්න ගන්න එක.'' ඇල්ටන් කීවේය.

''ඔව් ඒක හරි.'' කෙල්වින් කීවේය. ''අපි මෙතන කතා කර කර ඉන්නවාට වඩා ඒ වැඩේ හොඳයි. ඔයා දෙන්නා එයා යන්ඩ ඉඩ තියෙන තැන්වලට කතා කරන්ඩ.'' ඔහු ලොරේටා ට්‍රෙන්ට්ගේ සොහොයුරියන් දෙස බලමින් කීවේය. ''ඔය දෙන්නා එක එක්කෙනාට කතා කරලා ලොරේටා ඉන්නවා ද කියලා බලන්ඩ. එයාව හම්බ

වුණොත් කියන්ඩ සහෝදරියකට සනීප නෑ කියලා. එතකොට ජෝජ් ඊගන් සැක කරන්නෙ නෑ. අපි එයාව මෙහාට ගෙන්න ගමු. එතකොට එයා ආරක්ෂා සහිතයි.''

එවිටම දුරකතනය නාද විය.

''අන්න ලොරේටා වෙන්ඩ ඕනෙ.'' බ්‍රිග්ස් මහත්මිය කීවාය.

හෙදිය රිසිවරය අතට ගත්තාය. ''කෝල් එක මිස්ට මේසන්ට,'' ඇය මඳ වේලාවකට පසු කීවාය.

මේසන් දුරකතනය වෙත ගියේය. වර්ජිනියාගේ හඬ රිසිවරය ඔස්සේ පැමිණියේය. ''මිස්ට මේසන් ලොරේටා ට්‍රෙන්ට් මාව හම්බ වෙන්ඩ එනවා කියලා කිව්වා. මම ඩ්‍රේක් ඒජන්සියට කතා කළහම ඔයා ඔහෙ ඉන්නවා කියලා කිව්වා. මම එයාව මුණගැහුනාට කමක් නැද්ද?''

මේසන් පිරිස දෙස බලා ප්‍රවේසමින් කතා කළේය. ''ඔයා දැන් කොහෙද ඉන්නෙ?''

''සේන්ට් රෙස්ට් මොටෙල් එකේ, නොම්මර දාහතර කාමරේ.''

''ඔයාට ඔතෙන්ට ටෙලිෆෝන් තියෙනවාද?''

''ඔව්, හැම කාමරේකටම.''

''කීයටද අර කියපු කෙනා එනවා කිව්වෙ?''

''එයා දැනටමත් පරක්කුයි.''

''හොඳයි, මම ඔයාට කෝල් කරන්නං.'' මේසන් රිසිවරය ආපසු තැබුවේය.

''මම දැන් යන්ඩ ඕනෙ.'' මේසන් ප්‍රකාශ කළේය.

''මම නං ඉන්නවා මගේ රෝගියා එනකං.'' ඇල්ටන් කීවේය.

''හරි, මම යනවා,'' කියමින් මේසන් සිය ලේකම්වරිය ද කැටුව මෝටර් රිය වෙත ගියේය.

# 15

''මං හිතන්නෙ අර කෝල් එක බොහොම වැදගත් එකක් වෙන්ඩ ඕනෙ, ඔය තරං හදිසියෙ අර ගෝරනාඩුව දාලා එන්ඩ?'' ඩෙලා ඇසුවාය.

''කෝල් එක ආවෙ වර්ජිනියාගෙන්. මට පේන විදිහට, ලොරේටා ට්‍රෙන්ට් එයාට කෝල් කරලා. දැන් වර්ජිනියා ඉන්නෙ සේන්ට් රෙස්ට් කියන මොටෙල් එකේ, කලිබුවල තියෙන. මට එයාට කෝල් කරන්ඩ ඕනෙ. ඒත් අර ගෙදර මිනිස්සු ජනේලයක් හරි ඇරලා බැලුවොත් මම කරන්නෙ මොකද්ද කියලා පේනවා. ඒ නිසා ටිකක් එහාට ගිහින් ටෙලිෆෝන් බූත් එකක් හොයා ගන්ඩ ඕනෙ.''

''අන්න අතන පෙට්‍රල් ෂෙඩ් එකක් තියෙනවා.'' ඩෙලා කීවාය. ''එතන ටෙලිෆෝන් ඇති.''

මේසන් රථය හරවා ඉන්ධන පිරවුම්හලට ඇතුලු කළේය. ඔහු එහි සේවකයාට ඉන්ධන පුරවන ලෙසට උපදෙස් දෙන අතර දුරකථන කුටියට වැදුනු ඩෙලා සේන්ට් රෙස්ට් නවාතැන් පොලෙහි දුරකථන අංකය තොරතුරු අංශයෙන් විමසා බලා ලැබුණු අංකය කැරකැවූවාය. ඇය නොම්මර දහහතර කාමරයට තමා සම්බන්ධ කරන ලෙස ඉල්ලා සිටින විටම මේසන්ද දුරකතන කුටියට ඇතුළු වූයේය.

''වර්ජිනියා?'' මේසන් ඇසුවේය.

''ඔව්?''

''මේ පෙරී මේසන් කතා කරන්නෙ. කියන්ඩ මට මොනවාද වුණේ කියලා.''

''මම දන්නවා, මිස්ට මේසන් මට ගෙදර ඉන්ඩ කියලා කිව්වා තමයි කියලා. ඒත් ලොරේටා ට්‍රෙන්ට් මට කෝල් කළා. එයාට මාව හම්බවෙන්ඩ ඕනෙ කිව්වා. මං කිව්වා මට අද ඒක කරන්ඩ අමාරුයි කියලා. ඊටපස්සෙ එයා කිව්වා මගෙ කරදරවීමට හිලවු වශයෙන් ඩොලර් පන්සීයක් ගෙවන්ඩ ලෑස්තියි, එයාට මාව හම්බවෙන එක බොහොම වැදගත් කියලා. ඒ වගේම එයා කිව්වා කිසිකෙනෙකුට මේ හමුවීම ගැන කියන්ඩ එපා කියලා.''

''ඉතින් ඔයා ආවා?'' මේසන් ඇසුවේය.

''ඔව්. මම දන්නවා මිස්ට මේසන්ට නොකියා මම ආපු එක වැරදියි කියලා. ඒත් අර ඩොලර් පන්සීයට මට ලෝබ හිතුනා. ඒත් මෙතෙන්ට වෙලා ඉන්නකොට මට තේරුණා මම කළේ ගොං වැඩක් කියලා. ඊටපස්සෙ මම ඩ්‍රේක් ඩිටෙක්ටිව් ඒජන්සියට කෝල් කළා. ඒගොල්ලො තමයි මිස්ට මේසන් ඉන්න තැන ටෙලිෆෝන් නොම්මරේ මට දුන්නෙ.''

''හරි, ඔයා අපි එනකං ඉන්ඩ. අපිට කලින් ලොරේටා ආවොතිං, එයාව මම එනකං නවත්තගන්ඩ.''

''මම කොහොමද එහෙම කරන්නෙ?''

''මොනවා හරි කියන්ඩ. වැදගත් පණිවුඩයක් අරගෙන මම එනවා කියලා හරි කියන්ඩ. ඔයාගෙ කාරෙක කෝ?''

''ඒක මෙතන පාක් එකේ දාලා තියෙන්නෙ.''

''කොච්චර වෙලාද දැන් ඔයා ඇවිල්ලා?''

''පැයකට වැඩියි.''

''හරි, අපි දැම්ම ම එනවා.'' මේසන් දුරකතනය විසන්ධි කළේය.

''යමු ඩෙලා.'' මේසන් කීවේය. ''අපිට සෑහෙන්ඩ වැඩ වැඩිවෙන දවසක් වගේ.''

ඔවුහු වංගු ගැසුනු මාර්ගයක් ඔස්සේ සේන්ට් රෙජිට් නවාතැන්පොල බලා රථයේ ගමන් කළහ. මේසන් රිය පැදෙව්වේ සුපුරුදු දක්ෂතාවය ප්‍රදර්ශනය කරමිනි.

''අපි යනකොට ලොරේටා ට්‍රෙන්ට් ඇවිල්ලා හිටියොත් මොකද කරන්නෙ?'' ඩෙලා ඇසුවාය. ''ඒ මදිවාට එයාගෙ අර මරුමුස් ඩ්‍රයිවරුත් ඉඳීවි. එතකොට එයාට කිසි දෙයක් කියන්ඩ බැරුව යනවා.''

''ලොරේටා ට්‍රෙන්ට් කියන්නෙ මගෙ ක්ලයන්ට් කෙනෙක් නෙමෙයි.'' මේසන් පැහැදිලි කළේය. ''ඒ නිසා එයාට කිසි දෙයක් කියන්ඩවත්, කිසි දෙයක් නොකියා ඉන්ඩවත් මට බැඳීමක් නෑ. මම කරන්නෙ එයාට කියන එක, ඩොක්ටර් ඇල්ටන්ට කෝල් කරන්ඩ කියන එක. එතකොට ඒ පණිවුඩේ ඩොක්ටර් ඇල්ටන් කියාවි. ඩ්‍රයිවර්ට ඇහෙන්නෙත් නෑ.''

ඔවුහු නවාතැන්පොල වෙත ළඟා වූ අතර මේසන් රථය ගාල් කළේය.

නොම්මර දහහතර කාමරය සොයා ඔවුහු ගමන් කළ අතර එහි දොරට තට්ටු කළ විගස වර්ජිනියා විසින් දොර අරින ලදී.

''අනේ කොච්චර ලොකු දෙයක් ද මිස්ට මේසන් ආපු එක? '' ඇය කීවාය. ''මම බයේ හිටියෙ.''

''කෝ ලොරේටා ට්‍රෙන්ට්?'' මේසන් විමසුවේය.

''එයාගෙන් ඊටපස්සෙ කිසිම ආරංචියක් නෑ.''

''ඒත් එයා ඔයාට කිව්වා, මෙහාට එන්ඩ කියලා?''

''ඔව්.''

''ඇයි?''

''ගොඩාක් වැදගත් කතාවක් තියෙනවා, කියන්ඩ කියලා.''

''කොච්චර වෙලාවකට කලින්ද එයා කෝල් කළේ?''

''පොඩ්ඩක් ඉන්ඩ බලන්ඩ... මම මිස්ට මේසන්ගෙ ඔෆිස් එකෙන් ඇවිත් පැය එකහමාරකට විතර පස්සෙ.''

''එයා ද කිව්වෙ මේ මොටෙල් එකට එන්ඩ කියලා?''

"ඔව්."

"කීයට ද එයා ඔයාව හම්බවෙනවා කිව්වෙ?"

"එයා හරියටම වෙලාවක් කිව්වෙ නෑ. මම ඇවිල්ලා පැයකට පස්සෙ එයා එනවා කිව්වා."

"ඔයා ලොරේටා ට්‍රෙන්ට්ව දැකලා තියෙන්නෙ, ඔයාගෙ ඔෆිස් එකේදි විතරයි නේද?"

"ඔව්."

"එයාගෙ අන්තිම කැමැති පත්‍රයේ එක සාක්ෂිකාරියක් ඔයා?"

"මට හරියටම මතක නෑ, මිස්ට මේසන් මම සාක්ෂිකාරියක් ද නැද්ද කියන එක. කොහොමටත් එයාට අපි අන්තිම කැමති දෙකක් පිළියෙල කළ බව මට මතකයි. මම තමයි ඒවා ටයිප් කළේ. ඒ කාලේ අපි අන්තිම කැමති පත්‍ර බර ගාණක් පිළියෙල කළා."

"මේ මොහොතේ මම හිතන්නෙ, ඔයා හදපු අන්තිම කැමතිපත්‍ර ප්‍රමාණය ගැන නෙමෙයි." මේසන් කීවේය. "ඔයාට ලොරේටා ට්‍රෙන්ට්ගෙ කටහඬ මතක ද කියන එක."

"මොකක්? නෑ මිස්ට මේසන්, මට එයාගෙ කටහඬ ගැන ඒ හැටි මතකයක් නෑ,"

"එහෙමනං, ඔයා කොහොමද දන්නෙ ඔයාට ටෙලිෆෝන් කලේ එයාමයි කියලා?"

"එයා කිව්වානෙ... ආ හරි... මට තේරෙනවා."

"වෙනත් විදිහකට කියනවානං," මේසන් කීවේය. "ගෑනු කටහඬකින් ඔයාට කිව්වා ලොරේටා ට්‍රෙන්ට් මෙතනට එන බවත් එයා එනකං ඔයාට ඉන්ඩ කියන එකත්. දැන් ඔයා මෙතනට වෙලා කොච්චර වේලා ගිහිල්ලා ද?"

"පැය දෙකක්, නෑ දෙක හමාරකට වැඩියි."

"ඔයා කාරෙක පාක් කළේ කොහෙද?"

"එළියෙ පාක් එකේ."

"අපි ගිහින් කාරෙක දිහා බලමු." මේසන් කීවේය.

"ඒත් ඇයි?"

"මට මේ සිද්ධ වෙන දේවල් අල්ලන්නෙ නැති නිසා. ඔයා මගෙ කීම අහලා ගෙදර ඉන්ඩයි තිබුණෙ."

"ඒත් එයා ඩොලර් පන්සීයක් දෙන්නං කිව්වහම මට නැවිත් බැරි වුණා."

"එයා මිලියනයක් පොරොන්දු වුණත් වැඩක් නෑ, ඒක ඔයාට ලැබෙන්නෙ නැත්තං."

වර්ජිනියා රථ ගාල වෙත පෙරමුණ ගෙන ගමන් කළාය. ඇය එක්වරම නතර වූවාය. "ඇයි දෙයියනේ මම කාරෙක පාක් කළේ අතනනේ. දැන් ඒක කොහොමද මෙතෙන්ට ආවෙ?"

"ඔයාගෙ කාරෙක් ටෝච් එකක් තියෙනවාද?" මේසන් ඇසුවේය.

"නෑ."

"මගෙ කාරෙකේ එකක් තියෙනවා. මම ඒක අරං එන්නං. ඔයාට ෂුවර් ද මෙතන නෙමයි ඔයා කාර් එක පාක් කළේ කියලා?"

"මට ෂුවර්."

මේසන් තමාගේ මෝටර් රිය වෙත ගොස් විදුලි පන්දමක් රැගෙන ආවේය.

"ඔයාව එකපාරක් බොරුවට අහුවුණා," ඔහු කීවේය. "මේ පාර එහෙම දෙයක් වුණොත් කලින් සැරේ වගේ ලේසි නොවෙන්ඩ පුළුවන්."

ඔහු විදුලි පන්දම අල්ලා මෝටර් රිය ඇතුළත බැලුවේය.

"ඔයා ළඟ යතුර තියෙනවාද?"

ඇය ඔහු වෙත යතුර ලබාදුන්නාය.

ඔහු ඩිකිය අර බැලුවේය. "කිසි ප්‍රශ්නයක් නෑ වගේ." කියමින් මේසන් මෝටර් රිය වටා විදුලි පන්දම යොමු කළේය. 'ඕ, හෝ, මේ මොකද්ද?"

"දෙයියනේ, බෆර් එක තැලිලා නේද?" වර්ජිනියා විස්මයෙන් කීවාය.

"ඔව්. ටක් ගාලා කාර් එකට නගින්ඩ, වර්ජිනියා. නැගලා ඇන්ජිම ස්ටාට්ට කරන්ඩ" මේසන් කීවේය.

වහා කීකරු වූ වර්ජිනියා මෝටර් රියට නැග එය පණගැන්වූවාය. "එක ලයිට් එකයි වැඩ කරන්නෙ." ඇය කීවාය.

"ඒකට කමක් නෑ. දැන් ඔයා එළියට ගිහිල්ලා, යූ ටර්න් එකක් ගහලා, ආපහු මෙතෙන්ට ම එන්ඩ." මේසන් කීවේය.

ඇය මෝටර් රිය රථ ගාලේ පිටවීමේ දොරටුවෙන් මාර්ගයට අවතීර්ණ කොට පදවා ගියාය.

"ඉක්මන් කරන්ඩ, ඩෙලා," මේසන් කීවේය. "මේක ඇත්ත වගේ පේන්ඩ ඕනෙ. ඔයා කාරෙකට නැගලා පුළුවන් තරං හයියෙන් අල්ලගන්ඩ."

වර්ජිනියා මේ වන විට යූ හැඩයට රිය හරවා ආපසු රථ ගාලේ ඇතුල් වෙන දොරටුව වෙත පැමිණෙමින් සිටියාය.

විදුලි පහන් ආලෝකය නොමැතිව රිය පැදවූ මේසන් වර්ජිනියා රිය ඇතුල් කරන විටම රථය ඇගේ රිය ඉදිරියට පැදෙව්වේය. ඇය තිරිංග තද කළ අතර ටයර් කෑගසන හඬ ඇසුනි. වීදුරු බිඳෙන ශබ්දයක් ද සමග රථ දෙක එකට ගැටුනි.

කාමර කිහිපයක ජනේල විවෘත වූ අතර සිද්ධිය කිහිප දෙනෙකු හෝ විසින් නරඹන බව පෙනුනි.

"අප්පොච්චියේ, මොකද වුණේ?" එළිමහනට දිවගෙන ආ හෝටල් කලමනාකාරිනිය ඇසුවාය.

"ඔයාගෙ කාර් එකේ ලයිට් තිබුණෙ නැත්තෙ මොකද? "රථයෙන් ඉවතට පැනගත් වර්ජිනියා ඇසුවාය.

"මම වැඩේ කාගත්තා වගේ." මේසන් කීවේය. "මම යන්ඩ තිබ්බෙ අනිත් පැත්තෙන්."

කලමනාකාරිනිය මේසන් වෙත කඩා පැන්නාය. "මේක තමුන්ගෙ වරද. පේන්නෙ නැද්ද මේක "ඇතුල්වීම" කියලා මෙච්චර ලොකුවට ගහලා තියෙනවා? එළියට යන අය යන්ඩ ඕනෙ අනිත් පැත්තෙන්."

''බොහොම කණගාටුයි,'' මේසන් කීවේය. ''වරද මගේ තමයි.''

''ඔයාට තුවාල ද?'' වර්ජිනියා වෙත හැරුනු කලමනාකාරිනිය ඇසුවාය.

''නෑ. මම වෙලාවට බ්‍රේක් පෑගුවා.''

කලමනාකාරිණිය නැවතත් මේසන් දෙස බැලුවාය. ''තමුන් බීල ද?''

ඇගෙන් මදක් ඉවත හැරුණු මේසන්, ''නෑ, පිස්සු ද?'' යයි කීවේය.

''මට පේන්නෙ බීලා වගේ තමයි.'' රණ්ඩු කෙක්කක් බඳු කලමනාකාරිනිය කීවාය. 'මේ අහන්ඩ ළමයො, ඔයා නොම්මර දාහතරේ නේද ඉන්නෙ? ඔයාට සාක්කියට කවුරු හරි ඕනෙ නං, මම ඉන්නවා ඒකට. මම දැන් පොලිසියට කෝල් කරන්ඩයි යන්නෙ.''

''ඕනෙ නෑ,'' මේසන් කීවේය. ''වැරැද්ද මගේ කියලා මම පිළිගන්නවානෙ.''

''තමුන්ගෙ තමයි වරද, මොකටද මගෙ කට? මෙච්චර ලොකුවට ගහලා තියෙන බෝඩ් එක පෙනුනේ නැනෙ. තමුන් මොකටද මෙහාට ආවෙ? රූම් එකක් ගන්ඩද ?'

''ඔව්, මට රූම් එකක් ඕනෙ.'' මේසන් කීවේය.

''තමුන්ට දෙන්ඩ මෙහෙ රූම් නෑ. ඔහොම ම ඉන්නවා. කාර් එක හොල්ලන්නෙ නෑ. මම දැන් පොලිසියට කෝල් කරනවා.'' ඇය ලැසි ගමනින් කාර්යාලය වෙත ගියාය.

''මොකද්ද දෙයියනේ ඔයා මේ කරන්ඩ හැදුවෙ?'' වර්ජිනියා ඇසුවාය.

''ඉන්ෂුවරන්ස්.''

''ඉන්ෂුවරන්ස්?''

''අන්න හරි,'' මේසන් කීවේය. ''දැන් ඉතින් කවුරු ඇහුවාත් ඔයාට කියන්ඩ පුළුවන් ඔයාගෙ කාරෙක තැලුනෙ කොහොමද කියලා. ඒකට සාක්කිකාරයො ඉන්නවා. ටක් ගාලා ඔයාගෙ යාළු

මැනේජර් ලොක්කි ගාවට ගිහින් කොස්සක් ඉල්ලගන්ඩ. අපි මේ වීදුරු කටු අතුගාලා දාමු. කොහොමටත් අපිට ටැක්සියක් ගෙන්න ගන්ඩ වේවි, පොලිසිය මේ කාර් දෙකම එළියට දෙන එකක් නැති නිසා. මම ඔයාව ගෙදරින් බස්සගෙන යන්නං.''

''එතකොට ඔයාගෙ කාරෙක?'' වර්ජිනියා ඇසුවාය.

''ඒක ඔහෙ තිබිච්චාවෙ.'' මේසන් කීවේය. ''මම ගැරේජ් එකකට දැනුම් දෙන්නං, ඒක ඇදගෙන එන්ඩ කියලා.''

# 16

කලමනාකාරිණියගේ දුරඇමතුමට අනුව විමර්ශනය සඳහා පැමිණි පොලිස් නිලධාරියා බොහෝ ආචාරසම්පන්න වුවද ඔහු කිසිදු මිත්‍රශීලී බවක් දක්වූයේ නැත.

"කොහොමද මේක වුණේ?" ඔහු ඇසුවේය.

"මම එළියට යන්ඩ ගියේ." මේසන් කීවේය. "මේ ගෑනු ළමයා ඇතුළට ආවා."

'මේ මනුස්සයා මෙතන තීති කැඩුවා,' කලමනාකාරිණිය කීවාය. "ඇතුල්වීම පමණයි කියලා මෙතන බෝඩ් එකක් ගහලා තියෙනවානෙ."

මේසන් කිසිවක් නොකීවේය.

පොලිස් නිලධාරියා මේසන් දෙස බැලුවේය.

"මම කරුණු පමණක් වාර්තා කරන්නං. මම එළියට යමින් හිටියෙ. මේ ගෑනු ළමයා ඇතුලට එනකොට තමයි අනතුර සිද්ධ වුණේ."

"ඔයා බෝඩ් එක දැක්කෙ නැද්ද?"

"මගෙ ඉන්ෂුවරන්ස් කම්පැනි එක කියලා තියෙනවා, අනතුරක් වෙලාවක වගකීම භාරගැනීමේ ප්‍රකාශ කරන්ඩ එපා කියලා. මම සම්පූර්ණයෙන්ම රක්ෂණය වෙලා ඉන්නෙ. වෙලා තියෙන දේ ඔයා පරීක්ෂා කරලා බලන්ඩ."

''මේ මිනිහා බීලා ඉන්නෙ,'' කලමනාකාරිනිය කීවාය.

''මේ බැලුන් එක් පුම්බන්ඩ විරුද්ධත්වයක් තියෙනවා ද?'' නිලධාරියා ඇසුවේය.

''අපෝ නෑ,'' කියමින් මේසන් බැලූනය පිම්බුවේය.

නිලධාරියා එයත් රැගෙන මෝටර් රථය වෙත ගියේය.

''රියපදවන්ඩ නොසුදුසු තරමට ඔයා බීලා නෑ.'' පොලිස් නිලධාරියා ආපසු පැමිණ කීවේය.

''එහෙනං ගංජා ගහලා ද කොහෙද.'' කලමනාකාරිනිය කීවාය.

මේසන් තමාගේ හැඳින්වීමේ පත්‍රිකාවක් පොලිස් නිලධාරියා අත තැබුවේය.

''මම ඔයා කවුද කියලා, ඩ්‍රයිවිං ලයිෂන් එකෙන් අඳුනගත්තා.'' නිලධාරියා කීවේය.

''මට ඕනෙ කරන්නෙ මගෙ කාරෙක ඇදගෙන යන්ඩ වාහනයක්.'' මේසන් කීවේය.

''මම එකක් ගෙන්නලා දෙන්නං.'' කියූ නිලධාරියා රියට නැග රේඩියෝවේ මයික්‍රෝෆෝනය අතට ගත්තේය. මොහොතකට පසු රේඩියෝවෙන් හඬක් නැගුනු අතර නිලධාරියා එහි හඬ අඩු කොට වීදුරුව වසා දැම්මේ කිසිවෙකුටත් ඔවුන්ගේ සාකච්ඡාව නොඇසෙන ලෙසිනි.

විනාඩි කිහිපයකට පසු ඔහු වර්ජිනියා වෙත පැමිණියේය.

''අද හවස ඔයා කොහෙද හිටියෙ මිස් බැක්ස්ටර්?'' ඔහු ඇසුවේය.

''මගෙ ගෙදර ඉඳලා මේ මොටෙල් එකට ආවා.''

''එන ගමං කොහෙ හරි නතර වුණා ද?''

''නෑ.''

''ඔයාගෙ ගෙදර තියෙන්නෙ කොහෙද?''

"මගෙ ලයිසන් එකේ තියෙන ඇඩ්‍රස් එකමයි. 422, යුරේකා ආම්ස් අපාර්ට්මන්ට්ස්."

"එනකොට මගදි මොකක් හරි ප්‍රශ්නයක් වුණා ද?" නිලධාරියා ඇසුවේය.

"නෑ. ඇයි ඔයා අහන්නෙ?"

"බොහොම භයානක අනතුරක් මුහුද අයිනෙ පාරෙ සිද්ද වෙලා තියෙනවා.' නිලධාරියා කීවේය. "ජෝජ් ඊගන් කියන රියදුරා ලොරේටා ට්‍රෙන්ට් කියලා කාන්තාවක් රථයේ නංවාගෙන යන අතරෙ වෙනත් කාරෙකක් ඒ ගොල්ලන්ගෙ කාරෙක් පිටිපස්සෙ වැදිලා තියෙනවා. ඒ නිසා ට්‍රෙන්ට්ලගෙ කාර් එක මුහුදට විසි වෙලා. ජෝජ් ඊගන් බේරිලා. ඒත් ලොරේටා ට්‍රෙන්ට් ගිලිලා. තාම මළ සිරුර හොයාගෙන නෑ. පිටිපස්සෙන් ඇවිල්ලා හප්පපු කාර් එකේ විස්තර ඔයාගෙ කාරෙකට බොහොම සමානයි. ඔයා බීල ද ඉන්නෙ?"

"එයාවත් ටෙස්ට් කරලා බලන්ඩ." මේසන් කීවේය.

"ඔයාට ඒ ගැන විරෝධතාවක් තියෙනවා ද?" නිලධාරියා ඇසුවේය.

වර්ජිනියා බියපත් දෑසින් මේසන් දෙස බැලුවාය.

"කොහොමටවත් නෑ," මේසන් කීවේය.

පොලිස් නිලධාරියා සිය දෑස වර්ජිනියාගෙන් ඉවතට ගත්තේම නැත.

"නෑ, මම විරුද්ධ නෑ." ඇය කීවාය.

"මේ බැලුම පුම්බන්ඩ." ඔහු කීවේය.

වර්ජිනියා බැලූනය පිම්බූ අතර නිලධාරියා නැවතත් මෝටර් රියට ගොඩ වූයේය. ඔහු තවත් සාකච්ඡාවක් රේඩියෝව ඔස්සේ පවත්වා නැවත එළියට ආවේය.

"ඔයා මොනවා හරි බේත් අරගෙන තියෙනවාද?" ඔහු වර්ජිනියාගෙන් ඇසුවේය.

"නෑ."

"ෂුවර් ද?"

''ඔව්.''

''එතකොට ඔයා කෙලින්ම ගෙදර ඉඳලා මෙහාට ආවෙ?''

''ඔව්.''

''දැන් ඔයා ඇවිල්ලා කොච්චර වෙලා වෙනව ද?''

''මම ඇවිල්ලා පැය දෙක හමාරකට වැඩියි. රෙජිස්ටරෙන් බලන්ඩ පුළුවන් ඒක.'' වර්ජිනියා කීවාය.

''අපි වෙලාව ලියාගන්නෙ නෑ, දිනේ විතරයි,'' කළමනාකාරිනිය කීවාය. ''ඒත් මෙයා ඇවිල්ලා පැය එකහමාරක් විතර වෙනවා කියලානං මට කියන්ඩ පුළුවන්.''

නිලධාරියා සිතිවිල්ලෙන් බර වූ බව පෙනුනි.

''මේ කාර් එකේ විස්තරේ ලැබුණෙ කොහොමද කියලා මට කියන්ඩ පුළුවන් ද?'' මේසන් ඇසුවේය.

''පාරෙ අනිත් පැත්තට ගිය කෙනෙක් විස්තරේ දීලා තිබුණා. ලියාපදිංචි අංකයේ කොටසක් එක්ක.''

''කොයි කොටස ද?''

''හඳුනාගැනීමක් කරන්ඩ සෑහෙන තරමට.'' නිලධාරියා කීවේය.

''මට මේක තිත්ත වෙලා තියෙන්නෙ,'' වර්ජිනියා කෝපයෙන් කීවාය. ''මම දන්නවා මේකත් මට අටෝප්පු උගුලක් කියලා. ඔය ඊගන් කියන වසවර්තියා මගෙ පස්සෙන් ආවා හොර අන්තිම කැමැත්තක්-''

''ඔහොම ඉන්ඩ,'' මේසන් බාධා කළේය.

''මම නිකං ඉන්නෙ නෑ,'' ඇය ආවේගයෙන් කීවාය. ''ඔය ඩ්‍රයිවරයා මට ගෙව්වා හොර ලියවිලි හදන්ඩ. ඒකා මිනීමැරුමක් කරන්ඩ හදන්නෙ-''

''කට වහන්ඩ.'' මේසන් කඩාපැන්නේය.

''මං මොකටද කට වහන්නෙ?'' ඇය මේසන්ට කීවාය.

''මෙතන කතා කරන්නෙ මම.'' මේසන් කීවේය.

''තමුන් මේ කාන්තාව වෙනුවෙන් පෙනී සිටිනවා ද?'' පොලිස් නිලධාරියා ඇසුවේය.

''දැන් ඉඳලා මම පෙනී සිටිනවා.'' මේසන් කීවේය.

නිලධාරියා නැවතත් මෝටර් රිය වෙත ගියේය. මේ වතාවේ සාකච්ඡාව පිටස්තරයන්ට නොඇසීමට ඔහු ප්‍රවේසම් වූයේ නැත.

''අර්බන්, නොම්මමර දෙකයි පහළොවේ කාරෙක. මේ වර්ජීනියා බැක්ස්ටර්ගෙ කාරෙකෙන් කිසිම තොරතුරක් ගන්ඩ බෑ, පෙරී මේසන් ඒක හප්පලා නිසා. පේන විදිහට, පෙරී මේසන් එයාගෙ නීතිඥයා. වර්ජීනියා බැක්ස්ටර් කියනවා, ට්‍රෙන්ට්ලාගෙ ඩ්‍රයිවර්, ඊගත් හොර අන්තිම කැමැත්තක් හදන්ඩ එයාට සල්ලි දුන්නාලු, ඊගත් මිනීමැරුමක් ප්ලෑන් කරනවලු කියලා. ඒක තමයි එයාගෙ කතාව.''

රේඩියෝව ඔස්සෙ පැමිණි හඬ දැඩි අධිකාරී බලයකින් යුක්ත වූ එකක් විය. ''මේ කතා කරන්නෙ දිස්ත්‍රික් නීතිපතිගෙ ප්‍රධාන විමර්ශන නිලධාරියා. තමුසේ ඔය කෙල්ලව අරගෙන එනවා, එයාට විරුද්දව මිනීමැරුම් චෝදනා නගන්ඩ තියෙනවා. ඉක්මනට එනවා, ඔය මේසන්කාරයා තවත් සාක්කි අවුල් කරන්ඩ කලින්.''

''හොඳමයි, සර්.'' පොලිස් නිලධාරියා කීවේය.

''දැම්ම එනවා.'' හඬ කීවේය. ''දැම්ම කියන්නෙ දැම්මම තමයි, හරි ද?''

''එයාගෙ බඩු මුට්ටු මොකුත් ගන්ඩ මම ඉඩ දෙන්ඩද-''

''දැන් එනවා,'' හඬ බිරුසත් දුන්නේය.

''මේකට තමයි මම බයේ හිටියෙ, වර්ජීනියා,'' මේසන් රහස් හඬින් කීවේය. ''දැන් ඉතින්, දෙයියන්ගෙ නාමෙට තව මොකුත් කියන්ඩ එපා. මම පෙනී සිටිනකං කිසිම දෙයක් කියන්නෙ නෑ කියලා කියන්ඩ.''

''එතකොට වැඩේ තවත් නරක් වෙන්නෙ නැද්ද?'' ඇය කෙඳිරුවාය. ''මම අර මට ම එවාගත් ලියුම අහුවුනොත්-''

''කාරෙකට නගින්ඩ, මිස් බැක්ස්ටර්.'' පොලිස් නිලධාරියා කීවේය.

''මට මගේ දේවල් ගන්ඩ තියෙනවා-'' වර්ජීනියා කීවාය.

''තමුන් දැන් අත්අඩංගුවෙ ඉන්නෙ.'' නිලධාරියා බාධා කරමින් කීවේය. ''මට ඕන්නං මාංචු දාන්ඩත් පුළුවන්. ඒ නිසා කරුණාකරලා, වහාම කාරෙකට නගින්ඩ.''

''එතකොට මේ මළ හත්ඉලව්වට මොකද කරන්නෙ?'' කලමනාකාරවරිය එකට ගැටුනු මෝටර් රථ දෙකට අත දිගු කොට පෙන්වමින් ඇසුවාය. ඇය මේ වන තුරු සිටියේ මුව අයාගෙනය.

''ඒවා ගෙනියන්ඩ ඇදගෙන යන වාහනයක් එයි.'' පොලිස් නිලධාරියා කීවේය. ''දැන් මට ඊට වඩා වැඩ තියෙනවා.''

වර්ජිනියාව නංවාගත් පොලිස් නිලධාරියා සයිරන් හඬ නංවමින් ඉගිල ගියේය.

''එහෙමනං, ඩෙලා,'' මේසන් කීවේය. ''අපිට දැන් යන්ඩ එන්ඩ විදිහක් නෑ. මුළින්ම කරන්ඩ ඕනෙ, ප්‍රවාහන පහසුකම් සලස්ව ගන්න එක.''

# 17

පසුදා උදෑසන දහයට මේසන් සක්මන් කරමින් සිටියේ රිමාන්ඩ් බන්ධනාගාරයේ නීතිඥ කුටිය තුළය.

මද වේලාවකින් පොලිස් කාන්තාවක විසින් වර්ජිනියා බැක්ස්ටර් කැඳවාගෙන එනු ලැබූ අතර පොලිස් කාන්තාව වහා ඉවත ගියාය.

''කොහොමද, වර්ජිනියා?'' මේසන් කීවේය. ''මට තේරෙනවා, ඔයා හැම දෙයක්ම පොලිසියට කියපු බව.''

''ඒ ගොල්ලො මාව ගොඩාක් රෑ වෙනකං තියාගත්තා. දොළහත් පහුවෙනකං, මගෙ හිතේ.''

''මං දන්නවා,'' මේසන් අනුකම්පා සහගතව කීවේය. ''ඊටපස්සෙ ඒ අය ඔයාට කිව්වා, ඔයාට මොනවාත් නොකියා ඉන්ඩ නීතිමය අවසරය තියෙනවා, ඒත් ඇත්ත කිව්වොත් ඒ අයට ඒ ගැන හොයලා බලලා, කතාව ඇත්ත බව තේරෙනවා නම්, ඔයාට යන්ඩ අරින් පුළුවනි කියලා.''

ඇගේ මුහුණින් පල වූයේ විමතියකි. ''ඔයා කොහොමද ඒක දන්නෙ?''

මේසන් මදහසක් පෑවේය. ''මොනවාද ඔයා එයාලට කිව්වෙ?''

''හැම දෙයක්ම.''

"හැමිල්ටන් බර්ජර්, ඒ කියන්නෙ දිස්ත්‍රික් නීතිපති මට කෝල් කරලා කිව්වා, මම ඉදිරියේ ඒ ගොල්ලන්ට ඔයාගෙන් ප්‍රශ්න කීපයක් අහන්ඩ තියෙනවා කියලා." මේසන් කීවේය. "ඒ කියන්නෙ වැඩේ දෙල් කියන එක. ඔයාට හිතාගන්ඩ බැරි දෙයක් ඒ අය දන්නවා කියන එක. තවත් දෙයක් තමයි, ඔයා කියන්ඩ ඇති මම ඔයාගෙ ලෝයර් කියලා. ඒ අනුව, ඒ අය නීතිමය පදනම ආරක්‍ෂා කරගන්ඩ මට කෝල් කළා වෙන්ඩත් පුළුවන්."

"ඔව්, ඒක තමයි වුණේ," ඇය කීවාය. "ඒ කට්ටිය මගෙන් ප්‍රශ්න ඇහුවා. මම දන්න සේරම කිව්වා. ඊටපස්සෙ ඒ ගොල්ලො නැගිටලා යන්ඩ ගත්තා. මම කිව්වා මට යන්ඩ දෙනවා කිව්වා නේද කියලා. එතකොට කිව්වා, යන්ඩ දෙනවා කිව්වෙ ඊයෙ රෑ නෙමෙයි, විමර්ශනය ඉවර කරන්ඩ දවසක් යනවා, එතකොට යන්ඩ දෙන්නං කියලා."

"ඊටපස්සෙ ඔයා මොකද කළේ?"

"මට පොඩ්ඩක් වත් නින්ද ගියේ නෑ, දෙවෙනි පාරටත් මම කූඩුවෙ ලැග්ගානෙ."

"මම දන්නෙ නෑ," මේසන් කීවේය. "ගොඩාක් දේවල් රඳා පවතිනවා, ඔයා මට ඇත්ත කිව්වා ද කියන කාරණය මත."

"ඇයි මම ඔයාට බොරු කියන්නෙ?"

"ඔයා කියන කතාව කෙනෙක් විශ්වාස කරනවානං, ඔයා පුදුමාකාර දේවල්වලට පැටලිච්ච කෙනෙක් බව පිළිගන්ඩ වෙනවා."

"කවුද මාව විශ්වාස නොකරන්නෙ?"

"දිස්ත්‍රික් නීතිපතියි, අපරාධ අංශයෙ ලුතිනන් ට්‍රැග් තමයි ඔයාව විශ්වාස නොකරන්නෙ."

"ඇයි ඒ?"

"ඒ අය වැඩක් කරන්ඩ උත්සාහ කරන අය. සමහර විට, ඒ ගොල්ලො කෙනෙක්ව විශ්වාස කරන්ඩ පුළුවන්. ඒත් ඒගොල්ලො කැමති නෑ, නොවිසිඳුනු අපරාධවලට."

"මොකද්ද වෙලා තියෙන අපරාදෙ?" ඇය ඇසුවාය.

"ජෝජ් ඊගන්, ට්‍රෙන්ට් පවුලෙ ඩ්‍රයිවර්, ලොරේටා ට්‍රෙන්ට්ව පිටිපස්සෙ සීට් එකේ දාගෙන කාරෙක එලෝලා තියෙනවා. ලොරේටා කියලා තියෙනවා, ඊගන්ට, ඔයා ඊයෙ හිටපු මොටෙල් එකට යන්ඩ ඕනෙ කියලා. ඊගන් කාරෙක එලෝගන යනකොට පිටිපස්සෙන් තව කාරෙක් ඇවිල්ලා, ට්‍රෙන්ට් කාරෙක හප්පලා. ඊගන්ට කාරෙක පාලනය කරගන්ඩ බැරුව මූද පැත්තට පෙරලිලා. ලොකු රළ ගෙඩි ඒ හරියෙ මූදෙ තියෙන බව මතක් වෙච්ච ඊගන් ඩ්‍රයිවිං සීට් එක ගාව දොර ඇරගෙන එළියට පැන්නාලු. පනිනකොට මිනිහාගෙ ඔලුව ගලක හරි මොකක හරි වැදිලා සෑහෙන වෙලාවක් යනකං සිහිය නැති උනාලු. සිහිය ආවට පස්සෙ පොලිසියට කෝල් කරහම, පොලිසිය ක්‍රේන් එකක් අරගෙන ඇවිත් මූදට වැටිච්ච කාරෙක ගොඩට අරගෙන තියෙනවා. පිටිපස්සෙ දොර ඇරිලා තිබිලා තියෙනවා. ඒ කියන්නෙ, ලොරේටා ට්‍රෙන්ට් කාරෙකෙන් පැනලා තියෙනවා කියන එක. මිනිය තාම හම්බ වෙලා නෑ. ඒත් මම හිතනවා මිනිය කිසි දවසක හම්බ වෙන එකක් නෑ කියලා. මොකද, ඔතන දියවැල් තියෙන නිසා. ප්‍රශ්නෙ කියන්නෙ, අනිත් පැත්තෙන් ආපු කාර් කාරයෙක් ඔයාගෙ කාරෙක් නොම්මරේ තමයි දීලා තියෙන්නෙ, ට්‍රෙන්ට් කාරෙක පිටිපස්සෙන් හප්පපු වාහනේ කියලා."

"ඒත් ඇයි පොලිසිය ඔය ඊගන් කියන හොරාව විශ්වාස කරන්නෙ?" ඇය ඇසුවාය.

"ඒක තමයි මටත් තියෙන ප්‍රශ්නෙ." මේසන් කීවේය. "ඔයා මට මොනවා හරි බොරුවක් කියලා තිබ්බොත් හරි, නැත්තං කියන්ඩ ඕනෙ දෙයක් නොකියා හිටියානං හරි, මේ වගේ දෙයක් වෙන්ඩ විදිහක් නෑ."

"මිස්ට මේසන්, මම ඔයාට බොරු කියලා නෑ." ඇය දූඩි ස්වරයෙන් කීවාය.

"කමක් නෑ," මේසන් සුසුමක් පිටකරමින් කීවේය. "ඔයා ඩ්‍රයිවර් ගැන පොලිසියට කිව්ව ද?"

"මම හැම දෙයක්ම කිව්වා. ඒත් මට හිතාගන්ඩ බැරි ඇයි මේ යක්කු මගෙ පස්සෙන්ම එලවන්නෙ කියලා."

"මේකයි," මේසන් කීවේය. "පොලිසිය හොයාගෙන තියෙනවා, ට්‍රෙන්ට් කාරෙක පෙරලිච්ච තැන තිබිලා වීදුරු කටු

වගයක්. ඒ වීදුරු කටු අපේ ඇක්සිඩන්ට් එක වෙච්ච තැන තිබ්බ වීදුරු කටුවලට සමාන බව හොයාගෙන තියෙනවා. ඒ වගේම ඒ වීදුරු කටු ඔයාගෙ කාරෙකේ ලයිට් එකක වීදුරු කටුවලට සමාන බවත් හොයාගෙන තියෙනවා.''

එවිටම දොර විවර වී දිස්ත්‍රික් නීතිපති, හැමිල්ටන් බර්ජර් සමග පොලිස් අපරාධ අංශයේ ලුතිතන් ට්‍රැග් ඇතුළට ආවේය.

''ගුඩ් මොනිං, වර්ජිනියා,'' බර්ජර් කීවේය. ''කොහොමද පෙරී?''

''වරදක් නෑ,'' මේසන් පිළිතුරු බැන්දේය. ''ඔයා මගෙ ක්ලයන්ට්ව නිදහස් කරන්ඩ ද යන්නෙ?''

''ඒකනං කෙරෙන්නෙ නෑ, මහත්තයො.'' හැමිල්ටන් බර්ජර් කීවේය.

''ඔයාගෙ ක්ලයන්ට් සෑහෙන්ඩ බොරු ඇදබාලා තියෙනවා. අපි කතා කළා ට්‍රෙන්ට් පවුලෙ සාමාජිකයො එක්ක. ඒ ගොල්ලොත් ඩ්‍රයිවර් ගැන පිස්සු කතා කියනවා තමයි. ඒත් අපි හිතනවා, ඔයාගෙ ක්ලයන්ට් ඒ උදවියත් එක්ක එක්කහු වෙලා මේ වැඩේ දුන්නා කියලා.''

''මොන කෝලමක් ද මේ?'' වර්ජිනියා කීවාය. ''මගෙ ජීවිතේට ට්‍රෙන්ට් පවුලෙ කවුරුවත් මුණගැහිලා නෑ.''

''සමහරවිට, ඔය ඩ්‍රයිවර්ගෙ රඟපෑමට වශී නොවී සිහිබුද්ධියෙන් කල්පනා කළොත් ඔයාලට ඇත්ත වැටහේවි.'' මේසන් කීවේය.

''හොඳයි, අපි බලමුකො,'' කියමින් බර්ජර් දොර වෙත ගියේය. ''ඇතුළට එන්ඩ.'' පිටත සිට කිසියම් අයෙකුට ඔහු ආරාධනා කළේය.

ඇතුළට පැමිණි මිනිසා වයස හතලිස් ගණනක වූ අයෙකු වූ අතර කළු හිස කෙස් සහ අඳුරු පැහැති සමක් ද, තද කළු දෑසක් ද හිමි අයෙකු වූයේය.

''මේ ළමයාව තමුන් මීට කලින් දැකලා තියෙනවා ද?'' බර්ජර් අමුත්තාගෙන් ඇසුවේය.

''ජීවිතේට දැකලා නෑ.'' ඔහු කීවේය.

"ඒකනෙ කියන්නෙ," වර්ජිනියා වෙත හැරෙමින් බර්ජර් කීවේය.

"ඉතිං මොකද්ද ඒකෙ තේරුම? මාත් මේ මනුස්සයාව ජීවිතේට දැකලා නෑ. මෙයා මාව හම්බ වෙන්ඩ ආපු ලොරේටා ට්‍රෙන්ට්ගෙ ඩ්‍රයිවර්ගෙ හැඩ රුවට සමානයි තමයි. ඒත් මෙයා නෙමෙයි."

"මේ තමයි ජෝජ් ඊගන්." ලුතිනන් ට්‍රැග් කීවේය. "ලොරේටා ට්‍රෙන්ට්ගෙ රියදුරා. හොඳයි, ඊගන්, තමාට යන්ඩ පුළුවන්."

"ඔහොම පොඩ්ඩක් ඉන්ඩ." මේසන් වහා කීවේය. 'මගෙත් එක්ක ඒ ජාතියෙ සෙල්ලං කරන්ඩ එන්ඩ එපා. එයාට පුළුවන්නං මෙතෙන්ට ඇවිත් මගෙ ක්ලයන්ට්ව අඳුනගන්ඩ, මටත් අයිතිය තියෙන්ඩ ඕනෙ එයාගෙන් ප්‍රශ්න අහන්ඩ."

"එයාට එහෙම බැඳීමක් නෑ," හැමිල්ටන් බර්ජර් කීවේය.

මේසන් ඔහුගේ කතාව නොසලකා හැර රියදුරාට කතා කළේය. "තමුන්ට පුද්ගලික වාහනයක් තියෙනවා නේද? ඒක ඕල්ඩ්ස්මොබයිල් එකක් ඒ වගේම ඒකෙ නොම්මරේ ඕ ඩී ටී 062 නේද?"

රියදුරා මේසන් දෙස බැලුවේ පුදුමයෙනි. "ඒක තමයි මගෙ කාරෙක් නොම්මරේ. ඒත් ඒක කැඩිලැක් එකක්."

"තමුන් ඒ කාරෙක පෙරේදා එලෙව්ව ද?" මේසන් ඇසුවේය.

ඊගන් ඔහු දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයකිනි. "මම මිසිස් ට්‍රෙන්ට්ගෙ කාරෙක තමයි එලෙව්වෙ."

"ඔය ඇති ජෝජ්," බර්ජර් කීවේය. "ඔයාට දැන් යන්ඩ පුළුවන්."

රියැදුරු පිටත්ව ගියේය.

"කාවහරි මොනවාට හරි අහුකරන්ඩ උත්සාහයක් තිබුනා නම්, ඒකට අහුවෙලා ඉන්නෙ ඔය දැන් ආපු ඩ්‍රයිවර්. ඔයාගෙ ක්ලයන්ට්ගෙ කතාව ගැන පොඩ්ඩක් හිතුවානං හොඳයි, පෙරී. අපි කැමතියි නඩුව පුළුවන් තරං ඉක්මනට ගන්ඩ." බර්ජර් කීවේය.

"ඒක බොහොම හොඳයි," මේසන් කීවේය. "ජජ්ට දින තියෙනවානං, හෙට උනත් අපි ලෑස්තියි, මලික ... විභාගයට."

"අපි යම් යම් කරුණු වලින් අසම්පූර්ණ වෙන්ඩ පුළුවන්. ඒත් මම දන්නවා ට්‍රෙන්ට් කාරෙකට වැඩේ දුන්නෙ ඔයාගෙ ක්ලයන්ට් කියලා." බර්ජර් කීවේය. "එයා කාත් එක්ක කුට්ටාලි වෙලා ඉන්නවාද කියලා මම දන්නෙ නෑ. හැබැයි මේ සැරේ ඔයා ඉන්නෙ පරදින පැත්තෙ බව මම දන්නවා."

හැමිල්ටන් බර්ජර් සහ ලූතිනන් ට්‍රැග් පිටත්ව ගියහ.

"එහෙමනං වර්ජිනියා," මේසන් කීවේය. "ඔයාට අලුතෙන් යමක් කියන්ඩ තියෙනවාද?'

"මොකුත් නෑ."

"ඒ කියන්නෙ, ඔයා නොකියා ඉන්නවාද, නැත්තං ඔයා මට හැම දෙයක්ම කියලා ද තියෙන්නෙ?"

"මම හැම දෙයක්ම කියලා තියෙන්නෙ, මිස්ටර මේසන්."

"හොඳයි, ඔයා බොරු කියලා තිබ්බොත්, අපි දෙන්නටම දෙයියන්ගෙ පිහිට තමයි."

නීතිඥයා පිටත්ව ගියේය.

# 18

ජෙරී කැස්වෙල් හෙවත් පසුගිය වතාවේ වර්ජිනියාට එරෙහිව මත්ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ නඩුව මෙහැයවනු ලැබූ දිස්ත්‍රික් නීතිපතිගේ සහකරු, ඔහුට වූ පරාජය නිසා මෙම නව අවස්ථාව තමාට ලබාදෙන ලෙස තදින් ඉල්ලා තිබිණි. ඒ අනුව නීතිපති කාර්යාලය මූලික සාක්ෂි විභාගය සඳහා කැස්වෙල් පත්කර තිබුණු අතර මේ වතාවේ නම් මේසන්ට තමාගේ කනෙන් රිංගීමට ඉඩ නොදෙන බව ඔහු අදිටන් කොටගෙන සිටියේය.

තමාගේ පළමු සාක්ෂිකරු ලෙස ඔහු ජෝජ් ඊගන් කැඳෙව්වේය.

රියදුරා සාක්ෂි කූඩුවට නැග තමාගේ නම, ලිපිනය සහ රක්ෂාව පිළිබඳව දිවුරුම් දුන්නේය.

''පසුගිය බදාදා රාත්‍රියේ තමා මොකද්ද කරමින් හිටියෙ කියලා කියන්ඩ.'' කැස්වෙල් කීවේය.

''මම ලොරේටා ට්‍රෙන්ට්ගෙ උපදෙසකට අනුව එයාව කාරෙක් නග්ගගෙන වෙන්චුරා ඉඳලා ආපහු එමින් හිටියෙ, මූද අයිනෙ පාරෙ.''

''කිසියම් නිශ්චිත තැනකට යන බවට තමුන් දැනගෙන හිටියාද?''

''මිසිස් ට්‍රෙන්ට් මට කිව්වා, එයාට මොටෙල් එකකට යන්ඩ ඕනෙ කියලා, ඒත් කිට්ටු කළහම පාර කියන්නං කියලා තමයි කිව්වෙ.''

''හොඳයි, ඊටපස්සෙ මොකද වුණේ?''

''ටික දුරක් යද්දි මිසිස් ට්‍රෙන්ට් මට කිව්වා කාරෙක් වේගෙ අඩු කරන්ඩ කියලා.''

''ඊට පස්සෙ?''

''මම හිතුවා එයාට ඕනෙ-''

''තමුන් හිතපු දේවල් වලින් වැඩක් නෑ, වෙච්ච දේ කියන්ඩ.''

''මම කාරෙකේ වේගෙ අඩු කරනකොටම තව කාරෙකක් පිටිපස්සෙන් ආවා. මම ඒ කාරෙකට යන්ඩ ඉඩ ඇරලා අපේ කාරෙක අයින් කළා.''

''පිටිපස්සෙන් ආපු කාරෙක තමා පහුකරගෙන ගියා ද?''

''ගියා කියන්නෙ, නිකම්ම ගියෙ නෑ.''

''වෙච්ච දේ විස්තර කරන්ඩ.''

''ඒ කාරෙක අපේ කාරෙක පහු කළේ, අපේ කාරෙකේ ඉස්සරහා බම්පර් එකේ වැදීගෙන. මට එකපාරට අපේ කාරෙක පාලනය කරගන්ඩ බැරි වුණා. මට මොනවාත් හිතාගන්ඩත් කලින් කාරෙක මූද පැත්තට යන්ඩ ගත්තා. මම මිසිස් ට්‍රෙන්ට්ට කෑගැහුවා පනින්ඩ කියලා, ඒ එක්කම මාත් එළියට පැන්නා. මගෙ ඔලුව ගලක් වගේ දේක වදින්ඩ ඇති.''

''තමාට සිහි නැති වුණා?''

''ඔව්.''

''කොච්චර වෙලා තමා සිහිය නැතුව හිටිය ද?''

''විරෝධය ප්‍රකාශ කරනවා, උතුමාණෙනි.'' මේසන් කීවේය. ''අදාල නොවන සහ නිසි හරස් ප්‍රශ්න ඇසීමක් නොවන පදනම මත.''

''විරෝධය අනුමතයි.'' විනිසුරු ග්‍රේශන් නියෝග කළේය.

''ගරු අධිකරණයේ අවසර ඇතිව,'' කැස්වෙල් කීවේය. ''මා පෙන්වා දීමට කැමතියි, කෙනෙකුට සිහිය නැතිවූ අවස්ථාවක ඒ කොතරම් වේලාවක් ද යන්න දැනගැනීමට වෙනත් කරුණු වලින් හැකියාව ලැබෙන බව.''

''එහෙමනම් ඒ වෙනත් කරුණු තුළින් සිහිය නැතුව හිටපු කාලය ඔප්පු කරන්ඩ.'' විනිසුරු කීවේය.

''හොඳයි,'' කැස්වෙල් කීවේය. ''සිහිය ලැබෙනකොට තමා කොහෙද හිටියෙ?''

''බිම වැටිලා, මුනින් අතට.''

''එතකොට මොකද වුණේ?''

''පොලිසියෙ දෙන්නෙක් මගෙ ළඟ හිටියා.''

''ඒගොල්ලො තමාව දෙපයින් නැගිට්ටුව ද?''

''එක පාරටම නෙමෙයි. ඉස්සෙල්ලා මගෙ අත පය නමන්ඩ පුළුවන් ද කියලා ඇහුවා.''

''ඊටපස්සෙ තමාව නැගිට්ටෙව්වා?''

''ඔව්.''

''තමා හිටියෙ මහා මාර්ගයට කොච්චර දුරකින් ද?''

''අඩි දහයක් දොළහක් විතර ඈතින්.''

''ඊටපස්සෙ මොකද වුණේ?''

''ඊටපස්සෙ පොලිසිය ක්‍රේන් එකක් ගෙන්නුවා.''

''ඒ ක්‍රේන් එක ආධාරයෙන් මොකද්ද කළේ?''

''ඒගොල්ලො කාරෙක ගොඩ ගත්තා.''

''එතකොට ගොඩගන්ඩ කලින් කාරෙක තිබුණෙ කොහෙද?''

''අඩි විසිපහක් විතර ඈතින් මූදෙ.''

''කාරෙක ගොඩ ගත්තාට පස්සෙ තමුන් මොනවාද දැක්කෙ?
''

''කාරෙක් පිටිපස්සෙ දොරක් ඇරිලා තිබ්බා. ඒත් මිසිස් ට්‍රෙන්ට් හිටියෙ නෑ.''

''ගරු අධිකරණයේ අවසර ඇතිව,'' කැස්වෙල් කීවේය. ''මා ඉල්ලාසිටිනවා මෙම සාක්ෂිකරු දැනට සාක්ෂි දීමෙන් ඉවත් කොට මෙම නඩුවේ වෙනත් කරුණු ඉදිරිපත් කිරීම සඳහා පසු අවස්ථාවක

නැවත කැඳවීමට. ඒ අතර වෙනත් සාක්ෂිකරුවෙකු කැඳවීමට මා ඉල්ලා සිටිනවා. කෙසේ වුවත්, මළ සිරුර තවමත් සොයාගෙන නැති නිසා ඒ බවට විත්තිය විරෝධය දක්වීමට අදහස් කරගෙන ඇතැයි මා සිතනවා. නමුත්, අපරාධයක් සිදුවූ බවට තීරණය කිරීමට මළ සිරුරක් අත්‍යවශ්‍යය නැහැ. මළ සිරුරක් සොයා ගැනීමකින් තොරව විත්තියට දඬුවම් කරනු ලැබූ බොහෝ නඩු තීන්දු තිබෙනවා.''

''තමා අධිකරණයට අපරාධ නීතිය පිළිබඳව උපදෙස් දීම අවශ්‍යය නෑ.'' විනිසුරු ග්‍රේශන් කීවේය. ''මළ සිරුර සොයා නොගැනීම පිළිබඳව කිසියම් විරෝධතාවක් දක්වනවා නම්, එය කළ යුත්තේ විත්තියේ නීතිඥයා විසිනුයි.''

''ගරු අධිකරණයේ අවසර ඇතිව,'' මේසන් කීවේය. ''විත්තිය ප්‍රකාශ කරන්ඩ කැමතියි, අපි එවන් විරෝධයක් නොදක්වන බවට. දැනට ඉදිරිපත්ව ඇති කරුණු මත ලොරේටා ට්‍රෙන්ට් මියගොස් ඇති බවට සෑහීමකට පත් වෙන්ඩ හැකියාව තිබෙනවා. කෙසේ උවත්, විත්තිය මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා, මළ සිරුර සොයා ගැනීමෙන් සහ ඒ පිළිබඳ අධිකරණ වෛද්‍යවරයාගේ මතයෙන් තමයි, අපරාධයක් සිදුවී ඇති ද යන්න නිසි ලෙස තීරණය කළ හැකි බව. දැනට දන්නා පරිදි, ලොරේටා ට්‍රෙන්ට් නම් කාන්තාවගේ මරණය හදිසි අනතුරක ප්‍රතිඵලයක් පමණක් වීමට ඉඩ තිබෙනවා.''

''ඒ නිසා තමයි, උතුමාණෙනි මම මේ අවස්ථාවේ වෙනත් සාක්ෂිකරුවෙකු කැඳවන්නේ.'' කැස්වෙල් කීවේය. ''එම සාක්ෂිය අනුව මට පෙන්වා දිය හැකියි අපරාධයක් සිදුවී ඇති බව.''

''කොහොම නමුත්,'' විනිසුරු ග්‍රේශන් කීවේය. ''විත්තියට අයිතිවාසිකම තිබෙනවා මේ අවස්ථාවේ මෙම සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට.''

''උතුමාණෙනි,'' මේසන් කීවේය. ''විත්තිය හරස් ප්‍රශ්න ඇසීම පසු අවස්ථාවකට කල් දැමීමට සූදානම්.''

''හොඳයි,'' විනිසුරු කීවේය. ''ඊළඟ සාක්ෂිකරු කැඳවන්ඩ.''

''මම කැඳවනවා, ලුතිනන් ට්‍රැග්, සාක්ෂි කූඩුවට.''

ඉදිරියට පැමිණි ට්‍රැග් දිවුරුම් දුන්නේය.

"විත්තිකාරිය අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට ගෙන එන අවස්ථාවේ තමා එහි හිටියා ද?"

"ඔව්."

"තමුන් ඇගෙන් ප්‍රශ්න කළා ද?"

"ඔව්, සර්."

"තමුන් ඇයට ඇගේ අයිතිවාසිකම් ප්‍රකාශ කළා ද?"

"ඔව්."

"ඊටපස්සෙ තමා ඇසූ ප්‍රශ්නවලට ලැබුණු පිළිතුරු පැහැදිලි කරන්ඩ."

"ඇය කිව්වා, ලොරේටා ට්‍රෙන්ට් ඇයව සෙන්ට් රෙස්ට් මොටෙල් එකේදි මුණගැහීමට යොදාගත් බව. ඇය එතනට ගිහිල්ලා පැයකට වඩා ගත වුණහම ඇයට බය හිතිලා පෙරී මේසන්ට කතා කළා කියලා කිව්වා. පෙරී මේසන් මොටෙල් එකට ඇවිල්ලා ටික වෙලාවකින් ඇගේ මෝටර් රථය පරීක්ෂා කළ යුතු බවට යෝජනා කළ බවත් කිව්වා."

"ඊටපස්සෙ මොනව ද කිව්වෙ?"

"ඔවුන් ඇගේ මෝටර් රථය පරීක්ෂා කලහම ඒකෙ හෙඩ් ලයිට් එකක් බිඳිලා බෆර් එක්ක ඇද වෙලා තිබුණ බවත්, ඒත් එක්කම මේසන් තමුන්ගෙ කාරෙකට නැගලා, විත්තිකාරියටත් කාරෙක ස්ටාට් කරන්ඩ කිව්වාලු වෙච්ච අනතුර කොහොම වුණා ද කියලා කාටවත් දැනගන්ඩ බැරි වෙන්ඩ-"

"පොඩ්ඩක් ඉන්ඩ," මේසන් කීවේය. "සාක්ෂිකරු තමාගේ මත හුවා දක්වීමට මා විරෝධය පානවා. ඔහුට කරුණු පමණක් ඉදිරිපත් කරන්ඩ පුළුවන්."

"මම සාක්ෂිකරුගෙන් අසන්නෙ, විත්තිකාරිය ඔහුට කියූ දේ ගැන." කැස්වෙල් කීවේය. 'විත්තිකාරිය කිව්වා ද ඇයි මෙහෙම දෙයක් කළේ කියලා?"

"ඔව්, කාරෙක මුලින්ම ඩැමේජ් වුණේ කොහොමද කියලා හොයා ගන්ඩ බැරි වෙන්ඩ කියලා."

"වෙන මොනව ද විත්තිකාරිය කිව්වෙ?"

"ජෝජ් ඊගන් හෙවත් ලොරේටා ට්‍රෙන්ට්ගෙ රියදුරා විත්තිකාරියට ඩොලර් පන්සීයක් පිරිනැමූ බවත් ඒ වෙනුවෙන් ඇය ව්‍යාජ අන්තිම කැමති පත්‍රයක් සකස් කරදුන් බවත් කිව්වා."

"ඒ බව සනාත කිරීම සඳහා ඇය කිසිවක් ඉදිරිපත් කළා ද?"

"ඔව්. පෙරී මේසන්ගේ උපදෙස් මත ඇය ව්‍යාජ ලේඛන සැකසීමේදී අලුත් කාබන් කොල යොදා ගත් බව සහ ඒ කාබන් කොල තමාටම ලියාපදිංචි තැපෑලෙන් ලිපිනය ලියා ගෙන්වාගත් බවටත් ප්‍රකාශ කළා."

විනිසුරු ග්‍රේශන් ඔරවාගත්තේය. "ඔය අහන්නෙ සේවාදායකයෙකු තමාගේ නීතිඥයාට කළ පුද්ගලික ප්‍රකාශයක් ගැන නේද?"

"එහෙමයි, උතුමාණෙනි." කැස්වෙල් කීවේය. "මට විත්තිකාරිය සාක්ෂි කූඩුවට කැඳවා ඇගෙන් විමසන්නට බැහැ ඇගේ නීතිඥයා ඇයට කුමක් කීවා ද කියා. නමුත් ඇගේ නීතිඥයා ඇයට කියූ දෙය ඇය විසින් වෙනත් පාර්ශවයකට පවසා තිබුණේ නම්, මට ඒ වෙනත් පාර්ශවයෙන් විමසන්නට අයිතිය තියෙනවා, ඇය කීවේ කුමක් ද යන්න."

"තමාට මේ ගැන විරෝධයක් තියෙනව ද?" විනිසුරු ග්‍රේශන් මේසන් දෙස බලා ඇසුවේය.

"නැහැ උතුමාණෙනි, තිසි අවස්ථාව පැමිණි විට අපි පෙන්වාදීමට සූදානම් විත්තිකාරියට බොරු චෝදනා නගා ඇති බව."

"පොඩ්ඩක් ඉන්ඩ," කැස්වෙල් මොරගෑවේය. "විත්තියේ නීතිඥතුමාට විත්තිය වෙනුවෙන් මේ අවස්ථාවේ කතා පවත්වන්ඩ බෑ."

"ඒක හරි," විනිසුරු කීවේය. "ඒත් විත්තියෙන් මේ දක්වා විරෝධය දක්වා නැහැ."

"අපිට දක්වන්ඩ කිසිම විරෝධතාවක් නෑ," මේසන් කීවේය. "මා විසින් විත්තිකාරියට කියනු ලැබූ හැම වචනයක් ම මෙම සාක්ෂිකරු ගරු අධිකරණයට ඉදිරිපත් කරනවාට විත්තියේ විරෝධතාවක් නෑ."

"හොඳයි, එහෙමනං ප්‍රශ්න අහන්ඩ." විනිසුරු මෙල්ගන් කීවේය.

"ඇය ප්‍රකාශ කළා," කැස්වෙල් ඇසුවේය. "ජෝජ් ඊගන් නම් පුද්ගලයා ඇ හමුවීමට පැමිණි බව?"

"ඔව්."

"ඔහුව හඳුනාගත් බව?"

"ඔව්."

"හරස් ප්‍රශ්ණ," කැස්වෙල් කීවේය.

"තමා මේ තරුණ කාන්තාව සමග බොහෝ රෑ බෝ වෙලා කතා කළේ, නේද ලූතිනන්?" මේසන් ඇසුවේය.

"ඔව්, ඇයව අත්අඩංගුවට ගත්තෙ පරක්කු වෙලා."

"තමා දැනගෙන හිටියා ද ඇය මගේ සේවාදායිකාවක් කියලා?
"

"නෑ."

"ඇය ඒ බව කිව්වෙ නැද්ද?"

"අපි අත්අඩංගුවට ගන්න අයගෙ ප්‍රකාශ ගැන ඒ හැටි විශ්වාසයක් තියන්නෙ නෑ. අපි ඒවා ඇත්ත ද කියලා හොයලා බලනවා."

"එතකොට විත්තිකාරිය මම එයාට කිව්වා කියලා කියපු දේවලුත් ඇත්ත කියලා තමුන් විශ්වාස කරන්නෙ නෑ?"

ලුතිනන් ට්‍රැග් දෙගිඩියාවට පත්වූ බව පෙනුනි. "නමුත් ඒ ගැන පොඩි වෙනසක් තිබුණා."

"මොන වගේ වෙනසක් ද?"

"එයා අපිට අවසර දුන්නා ලියාපදිංචි තැපැලෙන් එයාට ආපු කාබන් කොපි බලන්ඩ."

"තමුන් ඒවා බැලුවා?"

"ඔව්."

''ඒ නිසා තමුන් එයා කියපු හැම දෙයක්ම විශ්වාස කළා?''

''ඒක එයාගෙ කතාව එක්ක සැසඳෙනවානෙ.''

''එතකොට තමා විශ්වාස කළේ නෑ, මම ඈ වෙනුවෙන් පෙනීසිටින බව?''

''නෑ, මම විශ්වාස කළා තමයි.' ම්‍රැග් කීවේය.

''එහෙමතං, තමා මොකද මට දැනුම් නොදුන්නෙ ඈය අත්අඩංගුවට අරගෙන තියෙන්නෙ කියලා?''

''මම ඇයට උපදෙස් දුන්නා, අවශ්‍ය නම් ඔබතුමාට කතා කරන්ඩ කියලා.''

''එතකොට එයා මොකද කිව්වෙ?''

''එයා කිව්වා, අවශ්‍ය නෑ, එයා දන්න ඔක්කොම විස්තර කියන්නං කියලා.''

''ඊටපස්සෙ මොකද වුණේ?''

''ඊටපස්සෙ, දිස්ත්‍රික් නීතිපති, හැමිල්ටන් බර්ජර්, මම සහ ඔබතුමා ඉදිරියෙදි ජෝර්ජ් ඊගන්ව විත්තිකාරිය වෙත ගෙනාවා. ඔහු කිව්වා ඔහු ජීවිතේට විත්තිකාරිය දැකලා නෑ කියලා.''

''එතකොට විත්තිකාරිය මොකද්ද කිව්වෙ?''

''විත්තිකාරිය කිව්වා, එයත් මේ ආපු මනුස්සයව ජීවිතේට දැකලා නෑ, ජෝර්ජ් ඊගන් නමින් එයා මුණගැහෙන්ඩ ආවෙ වෙන කෙනෙක් කියලා.''

''හරස් ප්‍රශ්න අවසානයි.'' මේසන් කීවේය.

# 19

ඩෙලා ස්ට්‍රීට් සහ මේසන් ආපනශාලාවේ ආහාර ගනිමින් පසුවූහ. මේසන් සිටියේ සිතිවිල්ලෙන් බරවය.

''ඇයි චීෆ්? ඔයාගෙ හිතට කරදරයි නේද?'' ඩෙලා ඇසුවාය.

''ඔව්. මට හිතෙනවා, මම මගෙ ක්ලයන්ට්ව අමාරුවේ දානවා කියලා, මම මගෙ ඔලුව පාවිච්චි නොකරන නිසා.''

''ඔය තරං හිත කරදර කරගන්ඩ එපා,'' කියමින් ඩෙලා මේසන්ගේ අතින් ඇල්លුවාය.

''ඔයා හරි හොඳයි, ඩෙලා.'' මේසන් කීවේය. ''මම ඒ ගැන හැමතිස්සෙම කියන්නෙ නෑ තමයි. සමහරවිට, මම හුස්ම ගන්නවා වගේ, නැත්තං වතුරු බොනවා වගේ ඔයාට පුරුදු වෙලා. ඒ නිසා මම ඔයාව අගය කරන්නෙ නෑ වෙන්ඩ ඇති. ඔයාට තියෙන්නෙ හොඳ සිනිඳු අතක්. ඒත් ඒක හරිම ශක්තිමත්.''

''අවුරුදු ගානක් ටයිප් කරනකොට ඇඟිලි ශක්තිමත් වෙනවා.'' ඇය කීවාය.

''හෙණ ගහපං,'' මේසන්ගේ දෑස නලියන්නට විය.

''ඇයි චීෆ්? මොකක් හරි අදහසක් ආව ද?''

''ඔව්, ඔයා ටයිප් ගැහිල්ල ගැන කියනකොට මගෙ ඔලුවට ආවෙ. වර්ජිනියා බැක්ස්ටර්ව වරදකට පැටලුවෙ ඇයි කියලා මම, මගෙන්ම ඇහුවා. ඒත් මට ඇවිල්ලා තිබ්බ උත්තරේ වැරදියි.''

"ඒ කියන්නෙ?"

"මම හිතුවෙ, එයාගෙ නම කැත කරලා, එයා දෙන සාක්ෂියක වටිනාකම නැති කරන්ඩ කියලා. ඒත් මට දැන් ඊට වඩා හොඳ හේතුවක් පේනවා."

"මොකද්ද, චීෆ්?"

'හිතන්ඩ, වර්ජිනියාගෙ ටයිප් රයිටරේ කාට හරි ඕනෙ වුණා කියලා, ඩෙලානෝ බැනොක්ගෙ ලිපි ශීර්ෂත් එක්කම. කොහොමද ඒවා ගන්නෙ?"

"මට තේරෙන්නනෙ නෑ." ඩෙලා කීවාය.

"හොඳම දේ තමයි, වර්ජිනියාව බොරු වරදකට පටලෝලා, එයාව අඩු ගානෙ පැය විසිහතරක් කූඩුවෙ තියෙන එක. එතකොට අවශ්‍ය කෙනාට හැකියාව ලැබෙනවා, වර්ජිනියාගෙ ගෙට පැනලා ටයිප් රයිටරෙයි බැනොක්ගෙ ලිපිශීර්ෂයි පාවිච්චි කරලා තමුන්ට අවශ්‍ය ලියවිල්ල හදා ගන්ඩ."

"කවුද ඉතින් එහෙම කළේ?"

"මට ඒ ගැන පොඩි අදහසක් තියෙනවා." මේසන් කීවේය. "අපි දැන් යමු." ඔහු ඩොලර් දහයක නෝට්ටුවක් මේසය මතට දැම්මේ වේටර්වරයා ඒමට ප්‍රමාද වන බව දැකීම නිසාය.

"ඔච්චර ගාන වැඩියි, චීෆ්," ඩෙලා කීවාය.

"ඒකෙන් කමක් නෑ, අපිට කාලය ඊට වඩා වටිනවා." මේසන් ඩෙලා කැටුව මෝටර් රිය වෙත ගියේය.

ඩෙලා ස්ට්‍රීට් සමග මේසන් ඇතුලු වූයේ පෝල් ඩ්‍රේක්ගේ කාර්යාලයටය. රහස් පරීක්ෂකයා නිදවරමින් සේවයේ යෙදී සිටියේය.

"ආ, පෙරී, කොහොමද ඩෙලා?" ඔහු ඔවුන් පිළිගනිමින් කීවේය.

"පෝල්, ඔයා සෙන්ට් රෙස්ට් මොටෙල් එකේ වර්ජිනියා නතර වෙලා හිටපු වෙලාවෙ වෙන කවුද කාමර අරගෙන හිටියෙ කියලා චෙක් කළා ද?"මේසන් ඇසුවේය.

"ඔව්. ඒත් වැදගත් යමක් හම්බ වුණේ නෑ."

"ඕල්ඩ්ස්මොබයිල් කාර් එකකින් ආපු කෙනෙක් හිටිය ද?"

"ඔව්."

"ඒ මනුස්සයා, උඩු රැවුලක් තියෙන, කලු ඇස් තියෙන කෙනෙක් නේද?"

"ඔයා කොහොමද දන්නෙ? ඒත් ඒක ඇත්ත." පෝල් කීවේය.

"මම හිතුවා හරි. පෝල්, මේක බොහොම වැදගත්. ඔයාට පොලිසියෙ හොඳ කන්ටැක්ට්ස් තියෙනවා නේද?"

"තියෙනවා තමයි. ඒත් මොනවා හරි ගිනිවිජ්ජුම්බරයක් මගෙ අතින් වුණොත් මගෙ ලයිෂන් එක කපෝතියි."

"එහෙම දෙයක් නෙමෙයි. මම ඔය කිව්ව හැඩ රුව විස්තරේට ගැලපෙන පොලිස් ඔත්තුකාරයෙක් ඉන්නව ද කියලා හොයලා බලන්ඩ. මිනිහා ගොඩක් වෙලාවට මත්ද්‍රව්‍ය ගැන තමයි ඔත්තු දෙනවා ඇත්තෙ. මට එයාගෙ ඇඩ්‍රස් එක ඕනෙ."

"හොඳයි, ඔයා ඔෆිස් එකට යන්ඩ. මම ඒ වැඩේ කරන්ඩ පුළුවන් ද කියලා බලන්නං." ඩ්‍රේක් කීවේය.

මේසන් සහ ඩෙලා පෙරලා තමන්ගේ කාර්යාලයට ගොස් වාඩිවී සිටියහ.

මේසන් නොඉවසිල්ලෙන් සක්මන් කරමින් සිටින විට පෝල් ඩ්‍රේක්ගේ සුපුරුදු තට්ටුව ඇසුනේය.

"පෙරී, මම ඔයාගෙ මිනිහාව හොයාගත්තා." ඩ්‍රේක් කීවේය.

"කවුද?"

"හෝලිනන් ෆිස්ක් කියලා හාදයෙක්. මිනිහා කාලෙක ඉඳලා පොලිසියට ඔත්තු දීලා තියෙනවා. ඒත් එක වතාවක සාක්කි දෙන්ඩ උසාවි එන්ඩ වෙලා තියෙනවා. ඒකෙන් මිනිහා අන්ඩර් වර්ල්ඩ් එකට මාට්ටු. දැන් පොරට යන එනමං නෑ, කොයි වෙලේ අන්ඩර් වර්ල්ඩ් එකෙන් කන්න වෙයි ද කියලා බයේ ඉන්නෙ. කොහොම හරි මිනිහා පොලිසියෙ ඔත්තුකරුවන් වසත්කිරීමේ අරමුදලින් ගානක් ඉල්ලලා තියෙනවා. ඒත් පොලිසිය තාම ඒක දීලා නෑ."

"ඔයා ගාව මිනිහාගෙ ඇඩ්‍රස් එක තියෙනව ද?"

''මම දන්නවා ඒ යකා ඉන්න තැන.''

''එහෙමනං යමු.'' මේසන් කීවේය.

ඩෙලා අසුනින් නැගිට්ටාය.

''මේක ගෑනු ළමයින්ට හරියන වැඩක් නෙමෙයි, ඔයා ඔෆිස් එකේ ඉන්ඩ ඩෙලා.'' මේසන් කීවේය.

''අපෝ, හරි වැඩක්නෙ. මම ආවට මොකද වෙන්නෙ?'' ඇය ඇසුවාය.

''එහෙමනං එන්ඩකො.'' මේසන් කීවේය. ''පෝල්, ඔයා ළඟ මොනවාද ආරක්ෂාවට තියෙන්නෙ?''

''මේ තියෙන්නෙ බඩු,'' කියමින් පෝල් ඩ්‍රේක් පිස්තෝලයක් පෙන්වූයේය.

ඔවුන් ගමන් කරමින් සිටියේ අඳුරු මාවතකය. මේසන්ට සහ ඩ්‍රේක්ට මැදිව ඩෙලා ගමන් කළාය.

''නොම්මර 5 මේ හරියෙ තියෙන්ඩ ඕනෙ.'' තට්ටු නිවාසයක කොරිඩෝව ඔස්සේ යමින් ඩ්‍රේක් කීවේය.

''මිනිහා එළියට බහින්නෙ නැතුව ඇති.'' මේසන් කීවේය.

''මේ තියෙන්නෙ පහ.'' ඩ්‍රේක් කීවේය. ''ඇතුළෙ ලයිට් එකක් තියෙනවා.''

මේසන් මිට මොලවා දොරට ගැසුවේය.

''කවුද යකෝ?'' ඇතුළෙන් හඬක් නැගුනි.

''ඩිටෙක්ටිව් ඩ්‍රේක්,'' පෝල් කීවේය.

''ඩ්‍රේක් කියලා කොස්සෙක්ව මම අඳුනන්නෙ නෑ.''

''තමුසෙට දෙන්ඩ දෙයක් මගෙ ළඟ තියෙනවා.'' ඩ්‍රේක් කීවේය.

''අන්න ඒකට තමා මම බය.''

''එතකොට මම කොරිඩෝවෙ ඉඳගෙන වටේටම ඇහෙන්ඩ කෑහන්ඩ කියල ද කියන්නෙ?''

"එපා, එපා."

"එහෙනං අපිට ඇතුළට එන්ඩ දොර ඇරපං."

"කවුද යකෝ අපි කියන්නෙ?"

"මගෙත් එක්ක කෙල්ලකුත් ඉන්නවා, යාළුවෙක්."

"කවුද කෙල්ල?"

"මගෙ නම ස්ට්‍රීට්," ඩෙලා කීවාය.

"වෙන මොකෙක් හරි ගෝත්‍රයෙක් හොයා ගනිං, නංගි."

"හොඳයි, තමුසෙට ඕනෙ ඒකනං, තමුසෙම අමාරුවෙ වැටියං." මේසන් කීවේය. "අපි ආවෙ තමුසෙට කොහෙ හරි මකබෑවෙන්ඩ උදව් කරන්ඩ."

"තොපිලාම මක බෑ වියල්ලා. මම එහෙම දොර අරින්නෙ නෑ. දොර අරින්ඩ ඕනෙ නං, මම දන්න කොස්සෙක් අරං වරෙන්."

"මම යනවා කෝල් එකක් ගන්ඩ." මේසන් පහත් හඬින් කීවේය. "මූ එළියට ආවොත් ඔයා මූව අල්ලගන්ඩ. ඒත් මං හිතන්නෙ නෑ, එළියට එයි කියලා."

මේසන් අඳුරු, දුගඳ කොරිඩෝව ඔස්සේ ගමන්කොට දුරකතන කුටියක් වෙත අවතීර්ණ විය.

"මට දෙන්ඩ අපරාධ අංශය," දුරකතනය සම්බන්ධ වූ වහා ඔහු කීවේය.

"අපරාධ අංශය?" අනිත් අන්තයෙන් පිළිතුරු ලැබිනි.

"මට අවශ්‍යයි ලුතිනන් ට්‍රැග්ට කතා කරන්ඩ, ඉතාම හදිසි කාරණාවකට. මගෙ නම පෙරී මේසන්."

තත්පර එකහමාරකට පසු ලුතිනන් ට්‍රැග් දුරකතනය වෙත පැමිණියේය. "මොකද්ද ප්‍රශ්නෙ පෙරී? ඔයා ආයෙත් මිනියක් හොයා ගත්තාද?"

"වෙලාවට ඔයා හිටයෙ." මේසන් කීවේය. "ඔයාට පුළුවන් ද මම ඉන්න තැනට එන්ඩ? සෑහෙන ලොකු වැඩක්."

"ඇයි මිනියක්ද?"

''තාම මිනියක් නෙමෙයි. හැබැයි වැඩි කල් යන්ඩ කලින් මිනියක් වෙයි.''

''ඔයා කොහෙද ඉන්නෙ?'' ට්‍රැග් ඇසුවේය.

මේසන් ඔහුට ලිපිනය දුන්නේය.

''අපෝ,'' ට්‍රැග් කීවේය. ''හෙඩ් ක්වාටස් ඉඳලා වැඩි දුරක් නෑ.''

''ඔයා එනවා ද?''

''මම එන්නං.''

''ඔයා එක්ක තව කවුරු හරි අරගෙන එන්ඩ. මේක ටිකක් අමුතු විදිහෙ ජොයින්ට් එකක්.''

''මම දන්නවා ඔය හරියෙ ඉන්න එවුන්ගෙ හැටි.'' ට්‍රැග් කීවේය.

''මම ඔයා එනකං පඩි පෙළ උඩ ඉන්නං.'' කියූ මේසන් දුරකතනය ආපසු තැබුවේය.

පඩි පෙළ උඩට නැගී මේසන් ලූතිනන් ට්‍රැග් එනතුරු බලා සිටියේය. මිනිසුන් දෙදෙනෙකු ඔහු දෙස බලමින් පඩි පෙළ පහළ සිටිනු ඔහු දුටුවේය. මේසන් අඩියක් පෙරට තැබුවේය. ඔහුගේ උස සහ උරහිස් දෙස බලා තක්සේරුවක යෙදුනු දෙදෙනා, එකිනෙකාගේ මුහුණු බලා යන්නට ගියහ.

තවත් මද වේලාවකට පසු ලූතිනන් ට්‍රැග් නිල ඇඳුම් ඇඳි පොලිස් භටයෙකු සමග පැමිණියේය. කොරිඩෝවට අවතීර්ණ වූ ට්‍රැග් දෙපස සෝදිසියෙන් බැලුවේය.

''ඔන්න පෙරී මම එහෙනං, ඔයාගෙ බළල් අත. කොහෙද කියනවකො දැන් කොස් ඇටේ තියෙන්නෙ?''

''නොම්මර පහේ.''

''කොච්චර රස්නෙ ද ඔය කොස් ඇටයා?''

''මම දන්නෙ නෑ. ඒත් ඒකාව බය ගන්නගත්තාට පස්සෙ අපිට ලොරේටා ට්‍රෙන්ට්ගෙ මිනීමැරුමට විසඳුම ලැබෙයි.''

''මම හිතුවෙ අපිට ඒක දැනටම ලැබිලා තියෙන්නෙ කියලා.''

"මම දන්නවා, විසඳුම තාම නෑ කියලා." මේසන් කීවේය.

ට්‍රැග් සුසුමක් පිට කළේය. "මම හැමදාම තමුසෙට අහුවෙනවා, පෙරී. මට අගේට ඔෆිස් එකට වෙලා ඉන්ඩ තිබ්බා, මම වැඩිපුර විස්තර අහගත්තානං."

"හරි ඉතිං, මම ඔයාව මීට කලින් අමාරුවෙ දාලා තියෙනවා ද?" මේසන් ඇසුවේය.

"තාම නෑ. ඒත් කොයි වෙලේ ඒක වෙයි ද කියලා මට විශ්වාස නෑ."

"මෙච්චර දුර ආපු එකේ දූන් ඉතින් වැඩේට බහිනවාකො." මේසන් මිත්‍රශීලී ලීලාවෙන් කීවේය.

"හොඳයි," ට්‍රැග් තම සගයා දෙසට හැරී කීවේය. "අපි මේක මොකද්ද කියලා බලනවා විතරයි."

මේසන් ඔවුන් දෙදෙනා කැටුව ඩෙලා සහ පෝල් සිටින තැනට ගියේය.

මේසන් නැවත වතාවක් දොරට තඩි බෑවේය.

"පලයල්ලකො යන්ඩ," ඇතුළෙන් ආ හඬ බිරුසන් දුන්නේය.

"අපරාධ අංශෙ ලුතිනන් ට්‍රැග්." මේසන් කීවේය.

"ඇයි මොකද? ස්ර්ච් වොරනට් එකක් තියෙනවාද?"

"අපිට ස්ර්ච් වොරන්ට් ඕනෙ නෑ-"

"පොඩ්ඩක් ඉන්ඩ මම මේ වැඩේ බලාගන්නං." ට්‍රැග් කීවේය.

"මේ යකා බොරු නමකින් සේන්ට් රෙස්ට් මොටෙල් එකේ නතරවෙලා හිටියා." මේසන් කීවේය. 'මූම තමයි, වර්ජිනියා බැක්ස්ටර් මත්ද්‍රව්‍ය ගෙනියනවා කියලා පොලිසියට ටිප් එක දුන්නෙ. දූන් පොලිස් අරමුදලෙන් කොහෙ හරි මකබෑවෙන්ඩ බලං ඉන්නවා, පාතාලෙ එවුන් ගහලා දායි කියලා. ඔයි, මම මේවා වටේටම ඇහෙන්ඩ කියන්ඩ ද, නැත්තං තමුසෙ දොර අරිනවා ද?" මේසන් අවසන් කොටස වඩාත් හඬ නගා කීවේය.

"ඔහොම හිටපං, යකෝ." යයි ඇතුළෙන් කියැවිනි.

පුටුවක් පෙරලෙන හඬ සහ කිසිවෙකු දොර වෙත ඇවිද එන හඬ ඇසුණේය.

''කොරිඩෝ එකේ වෙන මොක්කුවත් ඉන්නවාද?''

''දැනට අපි විතරයි,'' මේසන් කීවේය. ''හැබැයි විනාඩි දෙක තුනකට කලින් අයියා පාට් එකේ පොරවල් දෙකක් ඇවිල්ලා ගියා.''

ආරක්ෂිත දම්වැලක ප්‍රමාණයේ තරමට දොර විවර විය. තද කලු දෑසකින් නිල ඇඳුම් ඇඳි පොලිස් බටයා දෙස බැල්මක් හෙලනු ලැබිණි.

''මට අයිඩෙන්ටි බලන්ඩ ඕනෙ.''

ලුතිනන් ට්‍රැග් සිය රාජකාරි හැඳුනුම්පත ඉදිරිපත් කළේය.

දොර විවෘත විය. පිරිස කාමරයට ඇතුලු විය.

''මොකද්ද යකෝ මේ වැඩේ තේරුම?'' කළුවන් දෑස් ඇති පුද්ගලයා ඇසුවේය. ''ඔය කට්ටිය මට ආරක්‍ෂාව දෙනවා කියලානෙ කිව්වෙ.''

''මේ අහනවා, ෆිස්ක්,'' මේසන් කීවේය. ''තමුසෙ මොකටද වර්ජිනාගේ බෑග් එකට මත් ද්‍රව්‍ය දැම්මෙ? බොරු නමකින් සේන්ට් රෙස්ට් මොටෙල් එකේ ඉඳලා එයාගෙ කාරෙක අරං ගියේ?''

''තමුසෙ කවුද ඕයි?'' ෆිස්ක් ඇසුවේය.

''මම එයාගෙ ලෝයර්.''

''මට තමුසෙ වගේ තෝලකයො ඕනෙ නෑ.''

''මම තෝල්කයෙක් නෙමෙයි, ලෝයර් කෙනෙක්.'' මේසන් කීවේය. ''මෙන්න තියෙනවා සිතාසියක්, තමුසෙ හෙට උදේ රජය එදිරිව වර්ජිනියා බැක්ස්ටර් නඩුවට සාක්කි දෙන්ඩ එන්ඩ කියලා.''

''මොන හත්ඉලව්වක්ද මේ?'' ට්‍රැග් ඇසුවේය. ''තමුසෙ මාව ගෙන්නුවෙ මේ ගෝතයාට සිතාසියක් දෙන්ඩ ද?''

''ඔයාම හිතාගන්ඩ,'' මේසන් විනෝදයෙන් කීවේය. ''එක්කො දැන් මේ වැඩේ ඉවරයක් කරලා, ඔයාගෙ හොඳ නම පත්තරේ දාගන්ඩ. නැත්තං මම හෙට මේ යකාව පතුරු ගැහුවාට පස්සෙ

පොලිසිය කොච්චර මෝඩ ද කියලා පත්තරවලින් කියන දේවල් අහගෙන ඉන්ඩ.''

''තමුසෙට බෑ මට සිනාසි දෙන්ඩ,'' ෆිස්ක් කීවේය. ''මම දොර ඇරියෙ පොලිසියට එන්ඩ විතරයි.''

''එතකොට තමුසෙ වර්ජිනියාගෙ කාර් එක අරගෙන ගියේ නැද්ද?''

''මේ අහපං, ලෝයර් මහත්තයො, තමුසෙට වඩා ලොක්කො මට කෙලවන්ඩ ආවා. තමුසෙ මොකෙද්ද ඕයි, උන් එක්ක බලනකොට? ''

''පොඩ්ඩක් ඉන්නවා,'' මේසන් කීවේය. ''මට දැනුයි පේන්නෙ. තමුසෙගෙයි ජෝජ් ඊගන්ගෙයි තියෙන නෑකම මොකද්ද ? තමුසෙලා දෙන්නම එක පවුලෙ එවුන් බව හොඳට පේනවා. ඒ වගේම අපිට ඒක චෙක් කරන්ඩ පුළුවන්.''

''තමුසෙ මොනවා ඔප්පු කරන්ඩ ද ඕයි?'' ෆිස්ක් කෝපයෙන් ඇසුවේය.

''මට ඔප්පු කරන්ඩ ඕනෙ නෑ.'' මේසන් කීවේය. ''තමුසෙ හෙට උදේ උසාවි ආවාට පස්සෙ, ඒ වගේම මම තමුසෙගෙන් ප්‍රශ්න ඇහුවාට පස්සෙ තමුසෙගෙ ෆොටෝ එක් පත්තරේ යයි. ඒ වගේම තමුසෙ පොලිසියට ඔත්තු දීපු බවත් කියවෙයි. එතකොට මට වඩා හොඳට තමුසෙට පාතාලෙ වැඩේ අඹරයි. අපි යමු.''

මේසන් දොර වෙත ඇවිද ගිය අතර ෆිස්ක් වෙවුලමින් කතා කළේය.

''මේ අහන්ඩ, මම ඔක්කොම කියන්නං, මාව අත්අඩංගුවට ගන්ඩ.'' ඔහු ලුතිනන් ට්‍රැග් වෙත බැගෑපත් විය. ''එහෙම වුණොත් මට ජීවිතේ බේරගන්ඩ පුළුවන්.''

''හරි, කියන්ඩ තියෙන දේ කියනවාකො.'' ට්‍රැග් කීවේය. ''හැබැයි මම කිසි දෙයක් කලින් පොරොන්දු වෙන්නෙ නෑ, පුතෝ.''

''මම හොඳටම වැටිලා හිටියෙ. මම පොලිසියට ඔත්තු දෙන බවට පාතාලෙ එවුන්ට සැකයක් තිබ්බා. මට ඒ නිසා දෙපැත්තම නැතුව ගියා. ඒ වෙලාවෙ තමයි ජෝජ් මාව හොයාගෙන ආවෙ.''

"කවුද ජෝජ් කියන්නෙ?" බ්‍රැග් ඇසුවේය.

"ජෝජ් ඊගන්. ලොරේටාගෙ ඩ්‍රයිවර්. එයාට ඕනෙ වුණා මං ලවා වර්ජිනියාට වැඩේ දෙන්ඩ. වෙලා තිබ්බෙ මේකයි, කෙල්වින්, ඒ කියන්නෙ ලොරේටගෙ මස්සිනා හිතං හිටියා ලොරේටා ගැති මළහම එයාට වැඩි කොටහක් අයිති වෙයි කියලා. පොරට ඕනෙ වුණේ, වැඩේ ඉක්මන් කරන්ඩ. ඒකට තමයි ආසනික් දීලා තිබ්බෙ. ඒත් උන්ට උවමනාවක් තිබ්බෙ නෑ ආසනික් දීලම ලොරේටා ලොක්කිව මරන්ඩ. උන් බැලුවෙ ටික ටික ලෙඩ වෙලා හාට් එක කොයි වෙලේ හරි හිටියි කියලා. ඔය අස්සෙ කෙල්වින්කාරයාට ලොරේටගේ අන්තිම කැමැත්ත හම්බ වෙලා. මිනිහා උඩ විසිවෙලා තියෙන්නෙ එතකොට තමයි. අන්තිම කැමැත්තෙන් වැඩි කොටහ වෙන්කරලා තිබ්බෙ ජෝජ්ට. කෙල්වින් බැලුවා මොකද කරන්නෙ කියලා. කරන්ඩ තිබ්බෙ එකම දෙයයි. ඇනා පිල්ච් කියන්නෙ ලොරේටාගෙ නර්ස්. ඒකිත් කෙල්වින්ගෙ බහට නැමෙන එකියක්. මාත් දවසක් දෙකක් දක්කලා තියෙනවා."

"ඒ වැල්වටාරං වැඩක් නෑ, තමුසෙ වෙච්ච දේ කියනවකො." බ්‍රැග් කීවේය.

"කොහොම හරි ඇනා පිල්ච් කියලා තියෙනවා, අන්තිම කැමැත්ත ටයිප් කරපු ටයිප් රයිටරේම එයාට ලැබුණොත් පැයක් ඇතුළත කාටවත් හොයාගන්ඩ බැරි විදිහට වෙනස් විදිහෙ අන්තිම කැමැත්තක් ටයිප් කරලා දෙන්නං කියලා. ඒ නිසා තමයි ජෝජ් මාව හොයාගෙන ආවෙ. ඇවිත් මට කිව්වා වර්ජිනියාගෙ බෑග්වලට බඩු දාලා පොලිසියට ඔත්තුව දෙන්ඩ කියලා. මම ඒක කළා. ඒ අතරවාරෙ පොලිසිය එයාගෙ ගේ චෙක් කරන්ඩ යනකොට මමත් ගියා. මම හිමීට එයාගෙ දොරට හරියන යතුරක් හදා ගත්තා. ඊටපස්සෙ මම ඇවිත් ටයිප්රයිටරේ අරගෙන ජෝජ්ට දුන්නා. ඊටපස්සෙ මම ආයෙමත් ඒක ගෙනත් දැම්මා. ඊළඟට තිබ්බ ප්‍රශ්නෙ තමයි, වර්ජිනියා කියයි ද කියන එක, අන්තිම කැමති පත්‍රයේ වෙනස ගැන. ඒකිට ඒක මතක තිබුණොත් වැඩේ කම්මුතුයි. ඒ නිසා තමයි ජෝජ් මට කිව්වෙ ලොරේටාගෙ කාරෙක වර්ජිනියාගෙ කාරෙකෙන් හප්පන්ඩ කියලා. එතකොට ඒකි ආයෙ පොලිස් කූඩුවෙ. ඊටපස්සෙ ඒකි කියන කිසි දෙයක් කවුරුවත් ගණං ගන්නෙ නෑ. මම සහසුද්දෙන්ම කියන්නෙ, ලොරේටාව මරන්ඩ කියලා නෙමෙයි, මම කාරෙක හැප්පුවෙ. මට

එහෙම කිව්වෙත් නෑ. වර්ජිනියා ආයෙ කුඩුවට අරින්ඩ ඕනෙවට කියලා තමයි මම හිතුවෙ."

"තමුසෙට ඔය වැඩවලට කීයක් ගෙව්වා ද?" මේසන් ඇසුවේය.

"වර්ජිනියාගෙ බෑග්වලට බඩු දාපු වැඬේට මට පොඩි ගානක් ගෙව්වා. ඒත් මහත්තයො, මේ වැඬේට මට තාම කීයක්වත් දුන්නෙ නෑ."

"හොඳයි පෙරී," ඩ්‍රෑග් කීවේය. "මේ පාරත් ඔයා දිනුම්. මම කියන්නං නඩුව ඉල්ලා අස්කර ගන්ඩ කියලා."

නිමි